sinhalaebooks.com


# True Love

## සත්‍ය ආදරය



රංග කැකිරිදෙණිය

sinhalaebooks.com



# True Love

## සත්‍ය ආදරය

RM PUBLISHING

sinhalaebooks.com

ප්‍රථම මුද්‍රණය 2021

# True Love

## සත්‍ය ආදරය

© රංග කැකිරිදෙනිය

ISBN 978-624-97903-0-8

පරිගණක අක්ෂර සංයෝජනය : මිෂෙල් මැක්ස්වත්
කවර නිර්මාණය
මුද්‍රණය : රේ පබ්ලිෂින්
482/A/3,
කොළඹ පාර,
කඩුවෙල.

("True Love – සත්‍ය ආදරය" නවකතාව ඇසුරින් කරන කවර නිර්මාණයක දී හෝ කවරාකාර අන්දමින් උපුටා ගැනීම මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික ආදී කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පල කිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම කර්තෘ රංග කැකිරිදෙනිය ගේ පූර්ව අනුමෙතිය ලිඛිතව ලබාගත යුතුය.)

sinhalaebooks.com

# True Love

## සත්‍ය ආදරය

රංග කැකිරිදෙනිය

RAY PUBLISHING

sinhalaebooks.com

# පිදුම...

අකුරු කරවන්න පාසල් යැවූ
අම්මාට තාත්තාට,
අකුරු කරවූ
ගුරු මැණිවරුන්ට පියවරුන්ට,
හැම මොහොතකම පසුපසින් හිඳ
ශක්තියක් වුනු
ආදරණීය බිරිඳට.....

RAY PUBLISHING

sinhalaebooks.com



# පෙරවදන........

ආදරය මෙලොව ජීවත් වන අපි සියලු දෙනාගේම පොදු අවශ්‍යතාවයකි. එය වඩාත් සුන්දර වනුයේ අපේ සිතට දැනුන අපි කැමතිම පුද්ගලයා සමග එය බෙදාගැනීමට හැකි වුවහොත් පමණි. ආදරය යන සුන්දර හැඟීමට වයස් බේදයක්, ජාති බේදයක්, කුල බේදයක්, වර්ණ බේදයක් මෙන්ම වර්තමාන ලෝකයේ බහුතරයක් රටවල් තුළ ලිංග බේදයක් ද නොමැත. නමුත් විවිධ  සමාජ හා සංස්කෘතික බලපෑම් හමුවේ තවමත් ශ්‍රී ලංකාව තුළ සමලිංගිකත්වය ප්‍රතික්ෂේපිත හගීමක් වීම කනගාටුවට කරුණකි.

මෙම කතාවට ද වස්තු බීජය වී ඇත්තේ සමලිංගික ප්‍රේකමයකි. මෙහි ප්‍රධාන චරිත දෙකෙන් එකක් වන අංජලී බෙහෙවින්ම සමාජශීලී නිදහස් ලෙස සිතන පවුල් පසුබිමක තරුණියක් වන අතර අනික් තරුණිය වන අමා තම මව සහ පියා අතර ඇති වන ගැටුම් හමුවේ විශාල ලෙස කම්පනයට පත්ව සහ අසරණ බාවයකට පත්ව ජීවිතය ගත කරන තරුණියකි. පාසල් කාලයේ සිටම පැවත එන ඔවුන් දෙදෙනාගේ මිතුදම සුන්දර වූ ආදරයක් බවට පත්වන අපූර්වත්වය මෙම ආදර කතාව තුළින් දිගහැරේ. එමෙන්ම මෙහි එක් එක් චරිත වල කෝණයන් ගෙන් කතාව ඉදිරිපත් කිරීම තුළින් එම ආදරයේ ඇති සුන්දරත්වය පාඨකයා ගේ හදවතට වඩාත් සමීප කිරීමට මා උත්සහ කලෙමි.

පාසල් වියේ සිටම කඩදාසි කොල වල කුරුටු ගාමින් කලාව තුලින් සමාජයේ වෙනස්ම පැතිකඩයන් ග්‍රන්ථයක් මගින් ඉදිරිපත් කිරීමේ සිහිනය සත්‍ය ආදරය තුලින් මා සැබෑ කරගත්තෙමි. මාගේ බිරිඳ, සහෝදරයා, ඔහුගේ බිරිඳ, ඇගේ මිතුරියන්, මා මිත්‍ර කාංචනා සේරසිංහ සොයුරිය සහ පරිගණක

sinhalaebooks.com



අක්ෂර සයෝජනයට සහයෝගය දැක්වූ මාගේ බිරිඳ ගේ නැගනිය මෙම පොත නිර්මාණය කිරීමේ කටයුත්තට බෙහෙවින් උපකාරී වූ අතර විශේෂයේන් මේ පොත සඳහා කරුණු සපයා ගැනීමට සහය දැක්වූ නිලක්ෂි කාරියවසම් සොහොයුරිය සහ ඇගේ මිතුරිය වන අයන්ති රාජපක්ෂ සොහොයුරියට මා වැනි නවකයෙකුට අතහිත දීම පිළිබඳව මා බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මාගේ කුලුඳුල් නිර්මාණය වන සත්‍ය ආදරය නම් කෘතිය කියවා ඔබට හැගෙන දේ මට පවසන මෙන් ඉල්ලා සිටිමි. ඔබගේ එම අදහස් මාගේ ඉදිරි නිර්මාණයන්ට බෙහෙවින් උපකාරී වේ යැයි මා සිතමි.

*රංග කැකිරිදෙනිය*
*273/3,*
*ගලඋඩ පාර,*
*කොතලාවල,*
*කඩුවෙල.*
*0765719703*
*exhibitscreations@gmail.com*

RAY PUBLISHING

sinhalaebooks.com



# පූර්විකාව.........

අද අපේ ආදරයට වසර පහක් සපිරෙන දිනයයි. එමෙන්ම අංජලී ගේ උපන්දිනය අදට යෙදී තිබුණි. මා ප්‍රථම වතාවට ඇයට බොරුවක් කියා කාර්යාලයට නොගොස් ඇයව පුදුම කරවීමට කටයුතු සැලැස්සුවෙමි. මා ඇගේ නිදන කාමරය විවිධ වර්ණයෙන් ගෙන් යුත් මල් වලින් සරසුවෙමි. එමෙන්ම කාමරය පුරාවටම ඉටි පන්දම් දල්වා සයනයේ රෝස පෙති ඇතුරුවෙමි.

මෙසේ කාමරය සරසන අතර වාරයේ අල්මාරියේ එක් තැනක සඟවා තිබූ දින පොතක් හමුවුනි. මා එය පෙරලා බැලූ විට එය අංජලීගේ පොතකි. පොතත් රැගෙන සයනයේ වැතිරුණු මා එහි පිටුවෙන් පිටුව පෙරලමින් එය කියවන්නට පටන්ගත් අතර අපේ අතීත මතකයන් ද සිහියට නැගෙන්නට උනෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com





2000/02/22

අද සෙනසුරාදා දිනයක් නිසා මට ටිකක් දහවල් වන තුරුම නින්ද ගියහ. අවදිවන විට උදේ නවයට පමණි වී තිබුණි. මේ වන විටත් අම්මයි තාත්තයි දෙදෙනාම රැකියාවට පිටත් වී ඇති හෙයින් නිවසේ ඇත්තේ මා පමණි. වෙනදාටත් සෙනසුරාදට මා තනියම ගෙදර සිටියත් අද හිතට අමුතු පාළුවක් දැනෙන්නට විය. මගේ හිතට කුමක් වී දැයි මට නොතේරෙයි. නමුත් හිතෙහි අමුතු දුකක් සහ තනිකමක් රැඳී ඇත. එක්වරම දුරකථනය නාද වන ශබ්දය ඇසුන හෙයින් මා යහනෙන් බැස දුරකථනය වෙත ගියෙමි.

"Hello…"

"Hello… , දුව නැගිට්ටද?….. "

"ඔව් අම්මා දැන් නැගිට්ටේ"

"කම්මැලි කෙල්ල….. උදේට කෑම තියනවා, දවල්ට මදි වුනොත් මොනවා හරි හදාගන්න හරිද?….. අද උදේ ටිකක් පරක්කු උනා, ඉතින් වැඩි දෙයක් හදන්න උනේ නෑ"

sinhalaebooks.com



" හම්ම්... "

"මං එහෙනම් තියන්නම් පැටියෝ පරිස්සමින් ගෙටම වෙලා ඉන්න...... "

"හා අම්මා....."

"Bye දුව.....!"

" Bye අම්මා.....! "

අම්මා සමග කතාබහෙන් පසු මුහුණ සෝදා ගෙන අම්මා පිළියෙළ කර තිබු උදෑසන ආහාරය ගැනීමට මා මුළුතැන්ගෙට ගියෙමි. ආහාර ගැනීමට ද කිසිඳු රුචියක් නොතිබුනත් මා කෑම මේසයේ පුටුවක වාඩි වී ආහාර ගැනීමට සුදානම් උනෙමි. අම්මා ගෙදරින් එලියට යන්න එපා කීවත් අද මගේ හිතෙහි ඇති වී ඇති මෙම ව්‍යාකුල තත්වයට තනිවම මුහුණ දීමට තරම් මානසික තත්වයක් මා හට නොමැත. කවුරුන් හෝ මිතුරියක්වත් සිටියා නම් කතා කරන්න කියා සිතට ආවත් අප මේ ප්‍රදේශයට පැමිණියේ ළඟදී නිසා එහෙම කවුරුත් මට නැත. සිතේ ඇති වී ඇති තත්වය මගහරවා ගැනීම සඳහා උදෑසන ආහාරයෙන් පසු අපේ නිවාස ආසන්නයේ පිහිටි පේරාදෙණිය මල් වත්තට යාමට මා හට සිත් විය.

ප්‍රවේශපත්‍ර කවුන්ටරයෙන් ප්‍රවේශපත්‍රයක් මිලදී ගෙන උද්‍යානයට ඇතුළු වූ මා කිසිඳු අරමුණක් නොමැතිව දෙපස මල් වලින් බර වූ මාවත ඔස්සේ ඔහේ ඇවිදගෙන ගියෙමි. මද දුරක් ඇවිද යන විට එකවරම ඈතින් කවුරුන් හෝ මගේ නම කියා කතා කරන හඬක් ඇසිනි.

"අංජලී..... අංජලී...." මා එක්වරම තිගැස්සී වටපිට බැලුවෙමි. කාත් කවුරුවත් නැති මේ නගරයේ මගේ නම කියා

RAY PUBLISHING

sinhalaebooks.com



කතා කරන්නේ කවුරුදැයි සිතා ගත නොහැකිය. මාර්ගයේ එක් පසක පිහිටි බංකුවක හිඳ මා දෙස බලමින් අත වනන තරුණියක් දුටුවෙමි. මෙය සිත අදහගත නොහැකි සිදුවීමකි. ඇය මා පාසල් යන කාලයේ මගේ හොඳම මිතුරියයි. පාසල් කාලය අවසානවත්ම අම්මාගේ කන්තෝරුවේ මාරු වීමක් නිසා අපිට ගමෙන් යන්නට සිදු විය. අම්මා ගේ රැකියාව නිසා විවිධ ප්‍රදේශ වල පදිංචිව හිඳ වර්තමනයේ ජීවත් වන පේරාදෙණියට පැමිණියේ මීට මසකට පෙරය. පාසල් කාලයෙන් පසු මා මේ ඇයව දකින්නේ අවුරුදු තුනකට පසුවය. මගේ සිතට කියා ගත නොහැකි අමුතු සතුටක් දැනෙන්නට විය. මෙතෙක් වෙලා සිත වෙලාගෙන සිටි පාළුව තනිකමට කුමක් වූවාද සිතා ගත නොහැකිය. මා ද අත වනමින් ඇ වෙත දිව ගියෙමි.

"Hi අමා , ඔයා මෙහෙ....?"

"Hi අංජලී, කොහොමද ඉතින්?"

"හොදයි Dear... ඔයාට කොහොමද?"

"මමත් හොඳින් ඉන්නවා අනේ"

"ඉතින් අමා ඔයා තනියම මෙහෙ මොකද කරන්නේ?"

"තනියම නෙවෙයි අම්මා එක්ක"

"එහෙමද?....එතකොට ඔයාලා ඉන්නේ කොහෙද?"

"අපේ නැන්ද කෙනෙක් ඉන්නවා මේ ළඟ. අම්මා එක්ක ටික දවසකට එහෙ නතර වෙන්න ආවා."

"ශා.... නියමයිනේ ඒ කියන්නේ අපිට නිතරම මුණගැහෙන්න පුළුවන් නේද?"

RAY PUBLISHING

sinhalaebooks.com



"ඔව්. ඔයාගෙ ගෙවලුත් මේ ළඟද?"

"ඔව්..... පයින් යන දුර. එක නෙවෙයි අංජලී.... ඔයා නිතරම පාර්ක් එකට එනවද මෙහෙම තනියම..?"

"නිතරම නෙවෙයි අමා...... ඉඳල හිටල එනව...... අද උදේ ඉඳල හිතට පාලුවක් දැනුනා...... අම්මයි තාත්තයිත් වැඩට ගිහින් නිසා මං තනියම. ඉතින් මට හිතුනා ටිකකට පාර්ක් එකට ඇවිත් ඉන්න......"

"හ්ම්...... එකත් එහෙමද?....."

"ඔව් Dear...... මට මෙහෙ යාලුවෝ කවුරුත් නැහැ, ඉතින් මං පාලුවෙන් හිටියේ"

"එහෙනම් දැන් පාලු නෑ නේද?..... "

"හ්ම්...... ඔයාලා මෙහෙ ආවේ නිකන්ද නැත්නම්....."

"නිකන්මත් නෙවෙයි" සතුටින් පිරී තිබු අමාගේ මුහුණ එකපාරටම අඳුරු වන්නට විය.

"අනේ සොරි Dear... ඔයාට මොකක් හරි ප්‍රශ්ණයක්ද?..... "

"මං ඒක ඔයාට හෙමිහිට කියන්නම් අංජලී...... අද වගේ සතුටු දවසක මං ඒක ගැන කතා කරන්න කැමති නැහැ....."

"It's ok...., ඔයාගේ ඕනෑම දෙයක් මට කියන්න Dear..... මං ඉස්සර වගේම ඔයාත් එක්ක ඉන්නවා "

"ඇත්තටම ඔයාව මුණගැහිච්ච එක මට ලොකු හයියක් අංජලී......"

RAY PUBLISHING

sinhalaebooks.com



"හරි..... හරි.... අපි දැන් යමු මොන හරි කන්න.... මං ඇයව සැනසීමට ඇගේ හිස අතගාමින් පැවසුවෙමි"

"හ්ම්..... අපි එහෙනම් යමු....."

අපේ පැරණි මතකයන් අලුත් කරමින් සහ සිනහසෙමින් අප දෙදෙනා බොහෝ සතුටු වුනෙමු. නොදැනීම කාලය ගත විය.

"මේ.. දොළහටත් ලගයි කෙල්ලේ.."

"ඔව්මයි වෙලාව ගිය ඉක්මන....."

"දැන් මං යන්න ඕනේ අංජලී. අම්මා බලයි මං මොකද පරක්කු කියලා...."

"හා එහෙනම් යමු.., මේ ඔයාගේ නැන්දගේ ගෙවල් මේ ලග කිව්වා නේද..? මං එන්නද ඔයත් එක්ක යන්න......"

"හ්ම් ඔයාට පරක්කු වෙන්නේ නැත්නම් යමු.....?"

"මට මොන පරක්කුවක්ද......? මං දැන් ගෙදර ගියත් තනියමනෙ......"

විවිධ දේ ගැන කතා කරමින් අපි දෙදෙනා අමාගේ නිවස වෙත පැමිණියෙමු.

"කතාවෙන් කතාවෙන් ගේ ලගටම ආවා එහෙනම්, මේ තියෙන්නේ නැන්දගේ ගේ......"

"ශා..... ගොඩක් ලගයි නෙ....."

"ඉතින් එනවද ගෙට…"

"දැන් බැහැ අමා..... මං වෙන දවසක එන්නම්.... එහෙනම් මං යන්නද?......"

RAY PUBLISHING

sinhalaebooks.com



"හ්ම් Bye....."

"Bye....." මං ආපසු යන්න හැරෙනවත් සමගම අමා නැවතත් මා අමතන්නට විය.

"අංජලී......"

මා නැවත හැරි බැලුවෙමි.

"ඔයාගේ ෆෝන් නම්බර් එක දෙනවද..? අපිට කතා කරන්න පුළුවන්නේ."

"ඒකත් ඇත්ත.. එහෙනම් ඔයාගේ ෆෝන් එකට දාගන්නකෝ.."

මගේ ෆෝන් නම්බර් එක දී මා නැවත නිවස බලා පිටත් වුනෙමි. මා මාර්ගයේ නොපෙනී යන තෙක්ම අමා මා දෙස සිනහ මුසු මුහුණින් බලා සිටියහ. අද උදෑසන මා පත්ව සිටි තත්වයත් එක්ක මේ මොහොතේ සිතට දැනෙන සතුට වචනයෙන් විස්තර කිරීමට නොහැකි තරම් ය. එක් මොහොතකින් මගේ සිත වෙනස් වූ ආකාරය ගැන සිතමින් මා නිවසට පැමිණියෙමි. නිවසට පැමිණි විගසම මා දහවල් ආහාරය ගෙන සයනය වෙත ගියෙමි. වෙනදා නම් දවසම රූපවාහිනිය නැරඹුවත් අද දින එයට සිත නොවීය. වෙනදට වඩා අමුතු ප්‍රබෝධයක් සිත තුල ඇති වී ඇත. තවමත් මගේ සිහියට නැගෙන්නේ උදේ මා සිටි තත්වය සහ දැන් සිතේ ඇති වී ඇති තත්වය ගැනය. මෙසේ නොයෙකුත් දේ සිතමින් සිටියදී මා හට නොදැනීම නින්ද ගොස් තිබුණි. නැවතත් අවදි වුයේ මගේ ජංගම දුරකථනය නාද වන ශබ්දය ඇසුණු නිසා වෙනි.

RAY PUBLISHING

sinhalaebooks.com



සත්‍ය ආදරය

අද මගේ ජීවිතේ ගොඩක් සුන්දර දවසකි. මගේ පාසල් කාලයේ හොඳම මිතුරිය වූ අංජලීගේ හමුවීම මගේ සිතට ඉමහත් සතුටක් ගෙන දෙන්නට විය. ඇගේ මේ හමුවීම මගේ ජීවිතයට අලුත් බලාපොරොත්තුවක් පැමිණියාක් මෙනි. දුරකථන ඇමතුමක් ගෙන නැවතත් ඈ සමඟ කතා කිරීමට මට සිත් විය. දුරකථනය අතට ගෙන දහවල් ඈ දුන් දුරකථන අංකයට ඇමතුවෙමි.

"අංජලී.... මම අමා"

"ආ..... කියන්න"

"නිකන් අනේ ගත්තේ. අද ඔයාව මුණගැහිච්ච එක මට ගොඩක් සතුටුයි අද මගේ හිත ගොඩක් නිදහස් උනා වගේ."

"ඔයා මොකක් හරි ලොකු ප්‍රශ්නෙක නේද ඉන්නේ.."

"ඔව් අංජලී.. මම ප්‍රශ්න ගොඩක ඉන්නේ..."

"ඉතින් මට කියන්නකෝ.. එතකොට හිත තවත් නිදහස් වෙයිනෙ"

"ඔව් මං අනිවාර්යයෙන්ම කියන්නම්... එත් ඒක මෙහෙම ෆෝන් එකෙන් කියන්න බෑ..."

RAY PUBLISHING

sinhalaebooks.com



"ඉතින් අපි ආයෙත් වෙලාවක මීට් වෙලා කතා කරමු..."

"හ්ම්.... ඒක හොඳයි.. ඔයා එන්නකෝ මෙහෙ.."

"හා... හා... මං එන්නම්කෝ.."

"එහෙනම් හෙටම එන්න.."

"හෙටම...?"

"ඔව් හෙට.."

"හරි එහෙනම් මං එන්නම්කෝ.. හෙට අම්මයි තාත්තයි ගෙදර ඉන්න දවස. දවල් වෙලා එන්නම්.."

"ඔන්න එහෙනම් මං බලන්ඉන්නවා..?"

"හරි Dear.... මේ අපේ ගේට්ටුව ඇරෙන සද්දයක් ආවා.. මං හිතන්නේ අම්මා ඇවිත් ඇති. මං එහෙනම් තියන්නම් හෙට හම්බවෙනවනෙ."

"හා එහෙනම් Bye...."

"Bye.... "

දුරකථනය විසන්ධි කල මා සයනය මත වැතිරුනෙමි. මා දැන් සිටින්නේ හෙට දහවල් වන තුරු නොඉවසිල්ලෙනි. මඳ වේලාවක් සයනය මත වැතිරී සිහින ලොවක පාවෙමින් සිටි මා හට අංජලී ගැන අම්මාටත් කිවයුතු යැයි එක වරම සිහියට නැගුනෙමි. එම මොහොතේම මා සයනයෙන් බැස අම්මා වෙත දිව ගියෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com





*2000/02/23*

පෙර දින රාත්‍රියේ සිතෙහි තිබූ ප්‍රීතිජනක හැඟීමට විවිධ වූ සිතුවිලි සමුදායක් සිත වෙලා ගන්නට විය. මේ නිසා රාත්‍රියේ නින්ද යාමද ප්‍රමාද වූ හෙයින් උදෑසන අවදි වීමටද ප්‍රමාද විය. අම්මා සයනය ළඟට ඇවිත් මා අවදි කරන්නට විය.

"දුව දුව නැගිටින්න... දැන් හොඳටම කම්මැලි වෙලා නේද... හා...හා... නැගිටින්න."

අම්මා කතා කරන ශබ්දයට මා අවදි වූ අතර මඳ වෙලාවක් යහනේ වැතිරී සිටි මා යහනෙන් නැගිට ඉඳගන්නට විය. අම්මා ද සයනයේ එක් කොනකින් වාඩි වී නැවතත් කතා කරන්නට විය.

"දැන් ඔහොම හැමදාම ගෙදර ඉඳල හරියන්නේ නෑ නේද දුව... නරකද මොනවහරි Course එකක් වත් කරොත්...."

"හ්ම්.... ඒක නම් හොඳයි තමයි අම්මා. මටත් මෙහෙම තනියම ගෙදර ඉඳල එපා වෙලා...."

RAY PUBLISHING

sinhalaebooks.com



"එහෙනම් දුව... ඔයා කැමති Course එකක් බලලා මට කියන්නකෝ.."

"හා... අම්මා.... මට ඊයේ මගේ පරණ යාලුවෙක් හම්බ උනානේ..."

"එපා කියද්දී ගියා නේද ඇවිදින්න..."

"නෑ... නෑ... ඇවිදින්නම නෙමෙයි... මට උදේ නැගිට්ටහම හිතට හරි පාළුවක් දැනුනා. ඉතින් මං පාර්ක් එකට ගියා වෙනසකටත් එක්ක. අම්මට මතකද ඉස්කෝලේ මාත් එක්ක හිටියේ ගැහැණු ළමයා අමා..."

"ඔව් මට ලාවට මතකයි"

"එයා හිටියනේ පාර්ක් එකේ... එයාගේ ගෙවලුත් තියෙන්නේ මේ ළඟමයි..."

"ඒ ළමයා මොකද මෙහෙ කරන්නේ.."

"එයාගේ නැන්දා කෙනෙක් ඉන්නවා මේ ළඟ... ටික දවසකට අම්මත් එක්ක එහෙ නතර වෙන්න ඇවිල්ලා.."

"එහෙනම් දැන් දුවට හොඳයිනේ. යාලුවෙක් ඉන්නවනේ මෙහෙ..."

"අද දවල්ට පුලුවන්නම් එහෙ එන්න කියලත් කිවුවා..."

"ළඟ කිවුවේ කොයි හරියේද ඔය?..."

"පාර්ක් එක පහුකරගෙන යනකොට වමට තියෙන්නේ පොඩි පාරක් "

RAY PUBLISHING

sinhalaebooks.com



"ආ... ඒ කියන්නේ මේ පයින් යන දුරනේ..."

"ඉතින් අම්ම මම අද දවල්ට එහෙ ගිහින් එන්නද?..."

"හ්ම්... ගිහින් ඉක්මනට එන්නකෝ..... දැන් නැගිටලා වොෂ් එකක් දාගෙන ටී එක බීල ඉන්න...."

මගේ සිතෙහි ඇති වූ සතුට වැඩි කමට අම්මාගේ කම්මුලට හාදුවක් දී නාන කාමරය වෙත දිව ගියෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com





උදෑසන සිට මා කලකට පසු හමු වූ මිතුරිය වන අංජලී එනතුරු මග බලා සිටියේ නොඉවසිල්ලෙනි. මද වෙලාවක් කාමරයේ ජනේලයෙන් පාර බලා සිටින අතරවාරයේ එක පාරටම මාර්ගයේ එක් කොනකින් ඇගේ රුව මතුවිය. ඒ දසුනින් මගේ සිත ප්‍රීතියෙන් ඉතිරි ගියහ. මා එසැනින්ම ගෙයි ප්‍රධාන දොරටුව වෙත දිව ගොස් එය විවෘත කර ගේට්ටුව වෙත දිව ගියෙමි. සෙමෙන් සෙමෙන් නිවසට ළඟා වන ඈ මා දුටු විට ඇගේ මුහුණද සිනහවෙන් ඉතිරි ගියහ. ඇගේ සුරතින් අල්ලාගනිමින් මා ඇයව පිළිගත්තෙමි. "එන්න අංජලී... අපි යමු ගෙට...." ඇගේ සුරතින් අල්ලාගෙනම නිවසට ගොඩ වූ මා විසිත්ත කාමරයේ අසුනක් වෙතට අත දිගු කරමින් ඇයට අසුන්ගන්නා ලෙස පැවසුවෙමි. අම්මාද එම මොහොතේ මුලුතැන්ගෙයි සිට විසිත්ත කාමරය වෙත පැමිණියහ.

"අම්මා... අංජලීව මතකද අම්මාට..."

දෑස් පුළුල් කර මද වෙලාවක් ඈ දෙස බලා සිටි අම්මා ඇයව අඳුරගන්නට විය." අා මේ දරුවනේ... මට ඊයේ මෙයා කිව්වට එච්චර මතකයක් තිබුනේ නෑ... දැන්නේ මතක් වුනේ... ඉතින් කොහොමද දුව...... කොච්චර කාලෙකට පස්සෙද මේ......"

sinhalaebooks.com



"හොඳයි ආන්ටි..."

"අම්මලා සනීපෙන් ඉන්නවද දුව.."

"ආ ඔව් ආන්ටි වරදක් නෑ...."

"මං එහෙනම් ඔය දෙන්නට බොන්න මොනවහරි හදන් එන්නම්කෝ.."

එසේ පවසමින් අම්මා මුළුතැන්ගෙය වෙත ගියාය. පසුව මා ද අංජලී ගේ අසුන සමීපයේම අසුන් ගනිමින් අපගේ සතුටු සාමිචිය ආරම්භ කලෙමු. සුළු මොහොතකට පසු අම්මාගේ තේ පැන් සංග්‍රහය ද බුක්ති විදින අතරවාරයේ අංජලී මෙසේ විමසන්නට විය.

"ඉතින් කෙල්ලේ කියන්නකෝ මොකක්ද ඔයාගේ ප්‍රශ්නේ..."

"ඒක මෙහෙම කියන්න බෑ අංජලී.... දැන් නැන්දත් එයි. ඒක නිසා අපි මෙහෙ උඩ තට්ටුවට යමු. එතන නිදහසේ කතා කරන්න පුළුවන්.."

මොහොතක් නිහඬව සිටි මා පැවසුවෙමි. තේ පානය අවසන් කල අපි දෙදෙනා අමාගේ නිවසේ උඩුමහල වෙත යන්න සැරසුණි.

"අපි යමුද උඩට.."

" හ්ම් යමු.."

කිසිදු ඉදිකිරීමක් නොකළ අපගේ උඩුමහලේ ආරක්ෂාව සඳහා කුඩා වැටක් පමණක් ඉදිකර ඇත. අපි ඒ වැටේ එක් කොනකට වුනෙමු. පසුව අංජලි විසින් කතාව ආරම්භ කරන්නට විය. "මෙතන හරි ශෝක්නෙ අමා.... " එම මොහොතේම සිසිල්

RAY PUBLISHING

sinhalaebooks.com



සුළං රැල්ලක් ඇවිත් අප ගත වෙලාගන්නට වූ අතර අව් රශ්මියේ තිබූ විඩාව ද ඒයින් පහව ගියහ.

"ඉතින් අමා.. කියන්නකෝ ඔයාගේ අවුල මොකක්ද....."

මද වෙලාවක් නිහඬව හිඳ දිග සුසුමක් ලා මා කතාව ආරම්භ කලෙමි.

"අංජලී ඔයා දන්නවනේ අපේ තාත්තා ඉස්සර ඉඳලම බොනවනේ.. ඒත් ඒ දවස් වල බිවුවාට කාඑක්කවත් රණ්ඩු උනේ නෑ... නමුත් දැන් ටික කාලෙකට කලින් එයා කොළඹ රස්සාවකට ගියා. ඊට පස්සේ බීමත් කමත් වැඩි උනා, ඒ විතරක් නෙමෙයි. එයා ගෙදර එන්නේ සතියකට සැරයයි. ඒ එන හැම දවසකම අම්මා එක්ක රණ්ඩු වෙනවා හොඳටම. පස්සේ පස්සේ අම්මාට ගහන්නත් පටන් ගත්තා. අම්මටයි මටයි ගෙදර ඉන්න එකත් එපා උනා. පස්සේ අපි මේ ළඟදි තමයි නැන්දලගේ ගෙදර නවතින්න ආවේ.. මෙහෙ ආවට පස්සේ නම් මං හිතුවා කරදර අඩු උනා කියලා. එත් එහෙම උනේ නෑ....

"මෙහෙ ඔයාට තියන ප්‍රශ්නේ මොකක්ද...?"

"මෙහෙත් ගිනි ගොඩක් අංජලී... ගෙදර කවුරුත් නැති වෙලාවට මාමාගෙන් කරදරයි..."

"කරදරයි කිවුවේ..?"

"එයා අනවශ්‍ය විදියට මාව අල්ලන්න එනවා... ඒ විතරක් නෙමෙයි මං කාමරේ ඉන්න වෙලාවට හොරෙන් මං දිහා බලන් හිටියා දැන් දවස් දෙක තුනක්ම...?"

"ඉතින් ඔයා අම්මාට කිවුවේ නැද්ද..?"

RAY PUBLISHING

sinhalaebooks.com



"අම්මාට ඕක කියලා නැන්දට කිවුවොත් මෙහෙනුත් යන්න වෙයි කියලා මට බයයි. අම්මාටයි මටයි දැන් යන්න තැනක් නැහැ අංජලි..."

"එහෙම කියල හරියන්නෙ නෑනෙ කෙල්ලේ... ඔයාට මොනවහරි කරදරයක් උනොත්..."

"දැනට නම් ඔය අල්ලන්න එහෙම එන වෙලාවට මං කොහොමහරි ශේප් වෙලා යනවා... ඊට වඩා කරදරයක් වෙනවා වගේ නම් මෙහෙන් යන්න බලාගෙන හරි අම්මාට කියනවා..."

"ඒ උනාට දෙයක් උනාට පස්සේ කියලා වැඩක් නැනේ ළමයෝ..."

මං බිම බලාගෙන නිහඬව සිටියෙමි. අංජලි මගේ සුරත ඇගෙ දෑතට ගෙන එක් අතකින් සියුම්ව පිරිමදින්නට විය.

"ඔයාට මෙහෙත් ඉන්න බැරි උනොත් ඔයා ඕන වෙලාවක අපේ ගෙදර එන්න අමා.... ඔයාගේ ඕනම දේකට මං ඔයත් එක්ක ඉන්නවා... හරිද ඕන දෙයක් මට කියන්න..."

අංජලී මගේ කරට අත දමමින් පැවසීය. ඒ වචන පොද මගේ හදවතට දැනුනේ ඉඩෝරය වෙලාගත් කතරකට මහා වරුසාවක් ඇදහැලුනාක් මෙනි.

"ඔයා මාත් එක්ක මේ වෙලාවේ ඉන්න එක මට ලොකු ශක්තියක් Dear.... මං ගොඩක් අසරණ වෙලා හිටියේ.... ඇත්තටම ඊයේ ඔයාව මුණගැහුන වෙලාවේ ඉඳල මගේ හිතට හරි අමුතු සතුටක් දැනෙනවා අංජලී...."

මේ මොහොතේ මගේ දෙනෙත් කඳුලින් බරවන්නට විය. "හරි හරි කෙල්ලේ.... මම හැමදාම ඔයත් එක්ක ඉන්නවනේ... දැන් අඬන්නේ නැතුව ඉන්නකෝ...."

RAY PUBLISHING

sinhalaebooks.com



අංජලී එක අතකින් මගේ දෙනෙත් පිස දමමින් පවසීය.

"අංජලී...."

මා බිම බලාගෙන ඈ අමතන්නට විය. ඈ ඇගේ එක අතක් මගේ නිකට මත තබා මගේ හිස ඔසවමින් සුන්දර සිනහවක් පාන්නට විය.

"ඔය දන්නවද.... මං ආසයි ඔයා වගේ වෙන්න...."

"මං වගේ වෙන්න....!" නැවතත් ඈ සිනහ මුසු බැල්මක් මා වෙත හෙළීය.

"ඔව්.... ඔයා වගේ නිදහසේ ඉන්න... ඔයත් එක්ක මේ කතාකරපු ටිකටත් මගේ හිත ගොඩක් සැහැල්ලු උනා.... ඔයා මගේ ළඟින් හිටියත් මට ඒ සැහැල්ලුව දැනෙනවා අංජලී...." මා ඈත අහසේ පාවී යන වලාකුලක් දෙස බලමින් පැවසුවෙමි. ඇගේ දෙනෙත් තවමත් මගේ මුහුණින් ඉවත් වී නොමැත.

"අනේ Dear... ආයෙත් නම් අඬන්න එපා. මං ඔයාගේ ඇස් වල කඳුළු දකින්න කැමති නෑ... අපි වෙනදෙයක් ගැන කතා කරමු..."

ඈ මෙසේ පවසද්දී දෑතින් කඳුළු පිසදමාගත් මා ද ඇගේ මුව දෙස බලමින් සිනාසෙන්නට උත්සහ කලෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com





අමා කුමක් හෝ සිත් තැවුලකින් පෙලෙන බව මා හට දැනුන මුත් ඇ මෙතරම් අසරණ භාවයකින් පෙළෙනු ඇතැයි මා කිසිසෙත් නොසිතූ කාරණාවකි. පාසල් කාලයේ මිතුදමක් ලෙස ගොඩ නැගුනු අප දෙදෙනාගේ සබැඳියාව ඉන් ඔබ්බට ගොස් ඇති බවක් මා හට සිතෙන්නට විය. මේ හේතුවෙන් ඇගේ කඳුලින් පිරෙනු දැකීමට මා ප්‍රිය නොකලෙමි. ඇගේ සිත සැනසීමට මේ කතාව වෙනත් මගකට යොමු කර යුතු යයි මා සිතුවෙමි. කඳුළු පිස දමමින් සිනාසෙන්නට වෙර දරන ඇගේ මුව දෙස බලමින් මා මෙසේ පවසන්නට විය.

" දැන් අඬන වෙලාව ඉවරයි...අපි චොක්ලට් කමු.."

මං මගේ සාක්කුවේ තිබූ කුඩා චොක්ලට් එකක් එලියට ගත්තෙමි. එසැනින් ඈ සුරතල් සිනාවක් පාමින් එය මගේ අතින් උදුරාගෙන කටේ දාගන්නට විය.

" කෝ මට නැද්ද..."

මාද සිනාවෙමින් ඇගෙන් විමසීය. ඉන්පසු ඇය විසින්ම තවත් චොක්ලට් කෑල්ලක් මට කවන්නට විය. ඒ සමගම ඇගේ මුහුණේ තිබූ දුක්මුසු බැල්ම පහව යන හැටි මා දුටුවෙමි. එය මගේ සිතට ද ඉමහත් සතුටක් ගෙනදෙන්නට විය.

"අමා..... අපේ අම්මා කිව්වා මං නිකන් ගෙදර ඉන්න එකේ මොනවා හරි Cource එකක් කරන්න කියලා.."

RAY PUBLISHING

sinhalaebooks.com



"මම නම් යනවා English Class එකකට. අපි මෙහෙ ආපු ගමන් නැන්දා අම්මාට කියලා මාව දැම්මා ඒකට."

"මං නම් හිතුවේ IT Cource එකක් කරන්න, ඔයාගේ Class එක කොහෙද තියෙන්නේ......"

"නුවර ටවුමෙමයි..."

"අමා... ඔයාට පුලුවන්ද මටත් හොඳ තැනක් තියනවාද කියලා බලන්න IT වලට නුවර පැත්තේ.."

"හරි Dear, මං බලන්නම්..."

අමාගේ මුහුණේ තිබු අඳුරු බව මේ වන විට මුළුමනින්ම පහවගොස් ඇත. මෙසේ අප දෙදෙනා කතා කරමින් සිටින අතර වාරයේ මගේ දුරකථනය නාද වන්නට විය. ඇමතුම අම්මාගෙනි. වෙලාව දුටුවේද ඒ මොහොතේය.

"Hello...."

"Hello දුව..."

"කියන්න අම්මා..."

"කොහෙද දැන් ඉන්නේ..."

"තාම අමාලගේ ගෙදර...."

"එන්නේ නැද්ද ගෙදර.. දැන් එකටත් කිට්ටුයි නේද...."

"හරි අම්මා මං දැන් එන්නම්..."

"එහෙනම් පරිස්සමින් එන්න දුව..."

RAY PUBLISHING

sinhalaebooks.com



"යාළුවාව මතක්කලා කියලත් කියන්න..."

"හරි අම්මා මං කියන්නම්.. මං තියන්නද අම්මා..."

"හොඳයි දුව Bye..."

"Bye අම්මා..." දුරකථනය විසන්ධි කල මා අමාට මෙසේ පැවසුවෙමි.

"මං දැන් යන්නම් අමා... දන්නේම නැතුව වෙලාවත් ගිහින්... එකටත් ළඟයි."

"අනේ Dear, දවල්ට කාලම යමු..."

"බැහැ අනේ.. අම්මා බලන් ඉන්නවා මං ආයෙත් එන්නම්කෝ කාලා බීලා යන්න..."

"හරි එහෙනම් අපි පහලට යමු.."

අමාගේ අම්මා සමඟ ද මද වෙලාවක් කතා කරමින් හිඳ ඔවුන් දෙදෙනාට සමු දී මා නැවත නිවස බලා ඒමට පිටත් උනෙමි.

නිවසට පැමිණි මා දහවල් ආහාරය ගනිමින් අම්මා සහ තාත්තා සමග විවිධ දේ පිලිබඳව සාකච්ඡා කරමින් සතුටු සාමීචියේ යෙදුනෙමි. ආහාර ගෙන තවත් සුළු මොහොතක් අම්මා තාත්තා සමඟ කතා කරමින් හිඳ මාගේ කාමරය වෙත ගියෙමි. කාමරයට ඇතුලුවෙත්ම මාගේ දුරකථනය නාද වනු ඇසුනි. ඇමතුම අමාගෙනි. "මේ කෙල්ලට නම් පිස්සු" මා මටම කියාගනිමින් දුරකථනය ඇමතුවෙමි.

"Hello...."

RAY PUBLISHING

sinhalaebooks.com



"Hello...."

"අපි මේ දැන් මුණගැහුනා නේද ආ...." මම සිනාසෙමින් පැවසුවෙමි.

"ඔව් ඔව් ඒක හරි... ඒත්.. මට ඔයාට ආයෙත් ස්තුති කරන්න ඕනේ කියලා හිතුනා මාත් එක්ක කතාකරාට..."

"ඔයාට මගේ නීතිය අමතක වෙලාද...?"

"Ohh... මතකයි.. මතකයි.., No Sorry, No Thanks, We Are Friends "

"පිස්සු කෙල්ල"

"But Thanks.... ඒක මට ගොඩක් වටිනවා..."

"හරි.. ඉතින් දැන් සතුටුයිනේ..."

"ඔව් ඇත්තටම... ඔයා හිතනවා ඇති මං පිස්සු කෙල්ලෙක් කියලා නේද..?"

"ඔව් ටිකක් විතර... නමුත් ටිකක් ආදරණීයයි වගේ.." මා සිනාසෙමින් පැවසුවෙමි.

"Ohh.... Really..... මං ආදරණීයයි කියලා හිතෙන්න නම් ඔයාටත් පිස්සු වෙන්න ඕනේ.."

පෙරටත් වඩා සුරතල් සිනහවක් පාමින් ඇ එසේ පවසීය.

"මං කිවුවේ ඉතින් මට හිතුන දේ. අපි මෙච්චර ළඟින් කතා කරන්න අරගෙන තාම දවසයි නේද?.. ස්කොලේ යන කාලේවත් මෙච්චර ලගින් හිටියේ නැනේ..."

sinhalaebooks.com



"ඒ දවස මට නිකන් අවුරුදු ගාණක් වගේ දැනෙනවා Dear.... ඒ තරමටම මට ඔයාව දැනුනා..."

"ඔය ඇත්තමද කියන්නේ....."

"හ්ම්..... "

"අනේ අම්මෝ.... පිස්සු කෙල්ල හිතලා තියන දුරක්.... මේ ඒක නෙමෙයි.... මං දැන් තියන්නද අමා...."

"හරි එහෙනම්..... Bye....."

"Bye Dear...."

දුරකථනය විසන්ධි කල මා සයනේ වැතිරෙමින් කල්පනා ලොවකට වැටෙන්නට විය. මා ඇයට පිස්සු කෙල්ල කියා කීවත් ඇයට පමණක් නොව මටත් ඇයව තදින්ම දැනුනෙමි. ඒ සුරතල් සිනහව ඒ හුරතල් වචන නැවතත් සිහියට නැගෙන්නට විය. මෙතරම් ලෙන්ගතුකමක් මාගේ සිතේ ඇති වුයේ කෙසේ දැයි මට සිතාගත නොහැක. නමුත් එය සිත ප්‍රීතියෙන් පුරවන සුන්දර හැඟීමකි. මටත් නොදැනීම මා තනියම සිනාසෙන බව වැටහුනේ නිවස අවටින් ඇසුන කුමක් හෝ ශබ්දයක් හේතුවෙන් මෙතෙක් වෙලා සිත වෙලාගෙන සිටින සිහින ලොවෙන් අවදි වීමෙන් පසුවය.

දින කිහිපයකට පසු අමා විසින් සොයාදුන් නුවර ප්‍රසිද්ධ ආයතනයක තොරතුරු තාක්ෂනය පිලිබඳ පාඨමාලාවක් ආරම්භ කිරීමට අවස්තාව ද ලැබුණි. මේ අතර අපේ ලෙන්ගතු කමත් දිනෙන් දින වැඩිවන්නට විය. බොහෝ දිනයන් හි රාත්‍රිය වන තුරුම අපි විවිධ දේ ගැන කතාකරමින් කෙටි පණිවිඩ හුවමාරු කරගත්තෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



# මසකට පසු....

RAY PUBLISHING

sinhalaebooks.com



මගේ පාඨමාලාව ආරම්භ වී දැන් මාසයක් පමණ ගත වී ඇත. අපි දෙදෙනාගේම පාඨමාලාවට යා යුතු දිනයන් එකම දිනයකට යෙදී තිබූ හෙයින් අපි දෙදෙනාගේ ආශ්‍රය තවත් සමීප විය. මේ වන විට අපි අතර ඇති බැඳීම නොදැනීම මිතුදමට එහා ගිය සබැඳියාවක් වී ඇත. එය කුමක් දැයි මා හට තවමත් වටහා ගත නොහැකිය. ඇයටත් එසේම යැයි මා සිතමි. කෙසේ නමුත් දැන් අප දෙදෙනාගේ බැඳීම කොතෙක්ද කිවහොත් දෙදෙනාටම එක දවසක් කතා නොකර සිටීමට නොහැක.

RAY PUBLISHING

sinhalaebooks.com



2000/03/26

පාඨමාලාවේ මාසික පරීක්ෂණයක් සඳහා මා පාඩම් කරමින් සිටින අතරවාරයේ මාගේ දුරකථනය නාද උනෙමි. වෙලාව රාත්‍රී එකොළහ පසුවී විනාඩි දහයක් පමණ ගත වී තිබුනි. මේ මොහොත අධික වර්ෂාවක් ද ඇද හැලෙමින් තිබූ මොහොතකි. දුරකථන ඇමතුම අමාගෙනි. අපි දෙදෙනා කොතෙක් රෑ වන තුරු කෙටි පණිවිඩ හුවමාරු කරගත්තත් ඇය කිසිම දිනක රාත්‍රී ඇමතුම් ගෙන නැත. ඇයට කුමක් හෝ කරදරයක් වී ඇති දැයි සිතමින මා දුරකථනය අතට ගෙන ඇයව අමතුවෙමි.

"Hello "

"I'm sorry dear......, මේ වෙලාවේ කරදර කරනවට"

"It's Ok Darling..... මොකද මේ වෙලාවේ..... ඔයාට මොකක් හරි ප්‍රශ්නයක්ද.....?"

"ඔයාට ඔයාලගේ ගේට්ටුව ළඟට ඇවිත් මාව මුණගැහෙන්න පුලුවන්ද.....?"

RAY PUBLISHING

sinhalaebooks.com



"දැන්..."

"ඔව් දැන්... ඔයාට කරදරයක්නම් කමක් නැහැ.."

"No No Darling, ඔයා එන්න..."

මා හනිකට අපේ ගේට්ටුව වෙත දිව ගියෙමි. මද වෙලාවකින් ඈ අනෝරා වර්ෂාව නොතකා තෙමි තෙමි සීතලට ගැහෙමින් දුව එන්නට විය. ඇයට කුමක් වී දැයි සිතා ගත නොහැකිව මා ඇය ළඟට එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටියෙමි. ගේට්ටුව අසලට පැමිණි ඇයව මා අපේ පෝටිකෝව වෙත රැගෙන ගියෙමි.

"අමා මොකද උනේ... ඔයා හොඳටම තෙමිල නේද...?"

ඇය බිම බලාගෙන හඬ වැටෙන්නට විය. මා ඇයව ළඟට ගෙන හිස අතගා සනසමින මෙසේ පැවසුවෙමි.

"හරි හරි දැන් අඬන්නේ නැතුව මොකක්ද ප්‍රශ්නේ කියන්නකෝ..."

"තාත්තා අපිව හොයාගෙන මෙහෙට ආවා දැන්... එයා හොඳටම බීල අංජලී.... අම්මා එක්ක හොදටම රණ්ඩු වෙනවා "

"නැන්දා නැද්ද ගෙදර.....?"

"නැන්දට මුකුත් කරගන්න විදියක් නැහැ..... තාත්තා අතේ ආයුධයකුත් තිබුනා...... මාමාත් ගෙදර නැහැ...... මට ඒ දෙන්නව පාලනය කරන්න බැහැ"

"ඉතින් ඔයා මේ අනෝර වැස්සේ ගෙදරින් එලියට බැස්ස... ඔයා දන්නවද දැන් වෙලාව කීයද කියලා......"

"ඔව් මං දන්නවා.... ඒත් මට වෙන කරන්න දෙයක් තිබුනේ

RAY PUBLISHING

sinhalaebooks.com



නැහැ අංජලී...... ඒකයි ඔයාව හොයා ගෙන ආවේ, ඔයාටත් කරදරයක් නම්..... මං ආපහු යන්නම්..... I'm Sorry.... "

"ඔයාව කරදරයක් නෙවෙයි Dear...."

මම ඇගේ දෑත් මගේ දෑතින් තදකරගනිමින් පැවසුවෙමි. එසේ ඇගේ සිත සැනසීමට උත්සහ කල නමුත් ඇය එක්වරම හයියෙන් ඉකි ගසා හඬමින් මා වැළඳ ගන්නට විය. මා ද තදින් වැළඳගෙන ඇගේ සිත සැනසෙන තුරුම එසේ ඉන්නට හැරියෙමි. ඇගේ උණුසුම මැද මාගේ දෙනෙත්ද පියවී සුළු මොහොතකට අවට පරිසරයම අමතක වී ගියා සේ දැනුනි. මද වෙලාවකට පසු මා ඇයට මෙසේ පැවසුවෙමි.

"ආයෙත් මේ වගේ දේවල් කරන්න එපා කෙල්ලේ..... එයාලගේ ප්‍රශ්න ඔයා ඔලුවට ගන්න එපා..."

"මම ගොඩක් එහෙම ඉන්න උත්සහ කරා..... ඒත් ඉන්න බැරිම තැන තමයි අම්මයි මමයි මෙහෙ ආවා. දැන් මෙහෙටත් ඇවිත්....."

ඇය මාගේ තුරුලේම හිඳිමින් පැවසන්නට විය. මේ මොහොතේ කවුදෝ කුඩයකුත් ඉහලාගෙන අපි සිටිනා දෙසට එනු මා දුටුවෙමි. ඒ අමාගේ මාමා ය. ඔහු එන්නේ අමා සොයාගෙන විය යුතුයි....

"Dear ඔයාගේ මාමා එනවා."

අමා ක්ෂණිකව මාගේ තුරුලෙන් මිදී කඳුළු පිස දමමින් ඒ දෙස බලන්නට විය. මේ මොහොතේ කුමක් කර යුතු දැයි සිතා ගත නොහැකිව අපි දෙදෙනාම බිරන්ත වී ඔහු දෙස බලා සිටියෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



"අමා.... ඔයා මොකද මෙතන කරන්නේ.... අරෙහේ අම්මා ඔයාව හොයනවා....."

"අනේ මට එන්න බැහැ මාමා...."

"බැහැ කියලා හරියන්නේ නැහැ යමු ගෙදර....."

"අමාට කරදර කරන්න එපා අන්කල්..... අමා අද මෙහෙ හිටපුදෙන්...."

මාමා අමාගේ එක් අතකින් අල්ලාගෙන ඇයව රැගෙන යන්නට උත්සහ කල මොහොතේ මා එසේ පැවසුවෙමි. ඒ මොහොතේ මාමා මෙතෙක් කතා කරමින් සිටි වචන විලාසය වෙනස් විය.

"ඔය ළමයා මේකට මැදිහත් වෙන්න එපා... මේක අපේ පවුලේ ප්‍රශ්නයක්. අමා.... දැන් හොඳටම ඇති... යමු ගෙදර....."

මාමා එසේ පවසද්දී අමා නැවතත් ඉකි ගසමින් අඬන්නට වූ අතර මා ඇගේ එක් අතක් තදින් අල්ලා ගත්තෙමි.

"මං යන්නම් අංජලී..."

ඇය හඬමින්ම එසේ පවසා මාමා සමග යන්න පිටත් විය. කිසිවක් කරකියගත නොහැකිව මා පිටව යන ඔවුන් දෙදෙනා දෙස බලා සිටියෙමි. මේ මොහොතේ මගේ දෙනෙතට ද කඳුළු පිරෙන්නට විය. ඔවුන් දෙදෙනා නොපෙනී යන තෙක් බලා හිඳ මා කාමරය වෙත ගියෙමි. උදෑසන තුරුම මා හට නින්ද ගියේ නැත. දැන් ඇයට කුමක් සිදුවේ දැයි සිතන විට මාගේ දෙනෙත් තව තවත් කඳුලින් පිරෙන්නට විය.

sinhalaebooks.com



පෙර දින රාත්‍රිය පුරාවටම ආඬන්නට වූ හෙයින් උදෑසන වනවිට අධික හිසරදයක් ද දැනෙන්නට උනි. පෙර දින සිදු වූ සිදුවීම් සමග ඇයට ද කුමක් වුයේ දැයි දැනගැනීමට සහ අද ඇය පාඨමාලාට පැමිණෙන්නේ දැයි දැනගැනීමට ඇයට දුරකථන ඇමතුමක් ගැනීමට සිතුනත් මේ මොහොතේ ඇගේ තත්වය කුමක් දැයි නොදන්නා නිසා මා ඇයට කෙටි පණිවිඩයක් යැවුවෙමි. එයට ද පිළිතුරක් නොමැති නිසා ඇය සොයා ඇගේ නිවසට යා යුතු යයි මට සිතුනි.

මා නිවසින් පිටව යාමට සැරසෙන මොහොතේම අමා ගෙන් ඇමතුමක් පැමිණෙන්නට විය.

"Hello...."

" Hello අංජලී.... මං Station එකේ ඉන්නවා.... ඔයා එන්න....."

"හරි Dear.... මන් එන්නම්....."

"ඉක්මනින් එන්න.... මං බලන් ඉන්නවා....."

"Ok Bye....."

" Bye......"

RAY PUBLISHING

sinhalaebooks.com



මා දුම්රියපල වෙත යන විට ඇ එහි පිහිටි බංකුවක වාඩි වී ගැඹුරු කල්පනාවක ගිලී හිටිනු දුටුවෙමි. ඇයට නොපෙනෙන සේ ඇ හිඳගෙන සිටි බංකුව පිටිපසට ගොස් මාගේ දෑතින් එක්වරම ඇගේ දෙනෙත් වැසුවෙමි.

"අංජලී.... මං ඔයාව අඳුරගත්තා..... "

ඇය සුරතල් සිනහවක් පාමින් පැවසීය. පසුව මා ඇ වාඩි වී සිටි අසුනේ අනෙක් පසින් වාඩි වී කතාවට එක් උනෙමි.

"කොහොමහරි කෙල්ල මාව අඳුරගත්තා නේද......?"

"ඔයා ඇස් දෙක වහනකොටම මං දැනගත්තා ඔයා කියලා..."

"ඒකත් එහෙමද......? මේ... ඒක නෙමෙයි.... දැන් ගෙදර තත්වේ මොකද.....?"

"දැන් අවුලක් නැහැ.... තාත්තා අද පාන්දරම ගියා කොළඹ"

"මට ඊයේ මුළු රෑම නින්ද ගියේ නැහැ Dear..... එළිවෙනකල්ම කල්පනා කලේ ඔයා ගැන....."

"අනේ මං හින්දා ඔයාටත් කරදරයි නේද....."

"මට මොන කරදරයක්ද කෙල්ලේ..... ආයේ එහෙම ඕක කිව්වොත් මං තරහා වෙනවා හරිද....?"

"හ්ම්.... හරි හරි...., ඔයාගේ Text එක බැලුවේ Station එකට එන ගමන්... මං Phone එක Silent දාලා තිබුනේ..."

"ඔව් මං ඔයාට උදේ Call එකක් ගන්නත් හදල ගෙදර තත්වේ මොකද දන්නේ නැති නිසා Text එකක් දැම්මා. එකටත් Reply

RAY PUBLISHING

sinhalaebooks.com



නැති නිසා ඕන එකක් කියලා ඔයාගේ ගෙදර එන්න හැදුවේ. ගෙදරින් එන්න හදන කොටම තමා ඔයා Call කලේ..."

"අනේ Sorry Dear..."

" It's Ok"

"අන්න Train එක එනවා අමා....."

ඒ සමගම දුම්රියපලේ නිවේදනය ද ඇසෙන්නට විය. එය බදුල්ල යන සීග්‍රගාමී දුම්රියක් විය. දුම්රිය වේදිකාවට පැමිණි පසු අපි දෙදෙනා මැදිරියට ගොඩවී අසුන් ගත්තෙමු. දුම්රිය ගමන ආරම්භ වී මද වෙලාවකට පසු මා කතාවට එක් විය.

"අමා... මං ඔයාගෙන් දෙයක් අහන්නද?...."

"හ්ම් අහන්න..."

"ඊයේ රෑ ඔයා ගෙදර ගියාට පස්සේ ඇත්තටම මොකද උනේ?...."

එකවරම අමාගේ මුහුණ අඳුරු වී ඇය බිම බලාගන්නට විය. කුමක් හෝ අමිහිරි සිදුවීමක් සිදුවී ඇති බැව් මා හට එයින් පසක් උනෙමි.

"මට ඒ වෙලාවේ කේන්තිත් ගියා, ඔයාගේ මාමා නිසා මං ඉවසුවේ..."

"අපි ඒ ගැන කතා නොකර ඉමු අංජලී...."

"Ok.... But I'm Sorry...." මා ඇගේ සුරත පිරිමදිමින් පවසුවෙමි.

"අද ලස්සන උදෑසනක් නේද අංජලී...."

RAY PUBLISHING

sinhalaebooks.com



ඈ කවුළුවෙන් අවට පරිසරය දෙස මද වෙලාවක් බලාහිඳ සුන්දර සිනහවක් පාමින් පවසන්නට විය. නමුත් එය ඇය විසින්ම ඇගේ සිත සනසාගනු පිණිස පැවසූවක් බව මා දනිමි.

"හම්.... ඔයත් අද ඒ වගේම ලස්සනයි"

ඇය ලැජ්ජාවෙන් බිම් බලගනිමින් සිනාසෙන්නට විය. ඇගේ ඒ සුන්දර සිනහවට නම් මා බොහෝ සේ ඇලුම් කලෙමි.

"අම්මෝ.... කෙල්ලගේ ලැජ්ජාව.... දැන්නම් තවත් ලස්සනයි...."

"අනේ මේ යන්න බොරු කියන්නේ නැතුව...."

"බොරු නෙවෙයි ඉතින් මන් ඇත්ත කිව්වේ...."

"හරි හරි අපි දැන් බහිමු....."

දුම්රිය අපගේ ගමනාන්තය වූ නුවර දුම්රියපලට පැමිණි හෙයින් ඉක්බිතිව දුම්රියෙන් බැස අපගේ අධ්‍යාපන ආයතන කරා ගියෙමු. මගේ ආයතනයට යා යුත්තේ අමාගේ ආයතනය පසුකරමින්ය. අමාගේ ආයතනය අසලට පැමිණි නිසාවෙන් අමා මගෙන් සමුගන්නට සැරසුණි.

"මම එහෙනම් Class එකට යනවා අංජලී... Lunch time එකට එන්න එහෙනම්.... Bye......"

නමුත් මේ මොහොතේ ඇගෙන් සමුගෙන යාමට මා හට සිත් නොවුනු හෙයින් ඇය පංතිය වෙතට යාමට හැරෙද්දී මා ඇගේ අතකින් අල්ලාගෙන ඇයව නැවැත්තුවෙමි.

"අමා...." ඈ නැවතී මා දෙස බලන්නට විය.

"අද ඔයාට Class එකට යන්නම ඕනෙද?...."

RAY PUBLISHING

sinhalaebooks.com



ඇය සුරතල් සිනහවක් පාමින් මගේ මුව දෙස බලා ඉන්නට විය.

"අපි වැව රවුමට ගිහින් මොනවා හරි කමුද...?"

"ඒත්..." ඇ පංතිය  දෙස මදක් හැරී නැවතත් මා දෙස බලමින් සිනහවක් පාන්නට විය.

"Come on darling..... එන්න යමු..."

මා ඇගේ අතින් අදිමින් පැවසුවෙමි. ඈ ද නැවතත් සුරතල් සිනහවක් පා මා අල්ලා සිටි අතේ වෙලෙමින් මා සමග පැමිණියෙමි.

අපි විවිධ දේ කරමින් සහ සිනාසෙමින් අත්වැල් පටලාගෙන වැව රවුම පුරා ඇවිද්දෙමු. විටෙක වැව රවුමේ ඇති බංකු මත වාඩි වී විවිධ රසකැවිලි රස වින්දෙමු. පංතියේ දහවල් ආහාරය ගන්නා වේලාව වන තුරුම අපි මේ අයුරින් සතුටු සාමීචියේ යෙදුනෙමු. දහවල් ආහාර ගන්නා වේලාවට අපි සුපුරුදු පරිදි අමාගේ මිතුරියන් සමග ආහාර ගැනීමට අමාගේ පංතිය අසල පිහිටි අවන්හල වෙත යාමට කතිකා කරගත්තෙමු.

අවන්හලට යන විට අමාගේ මිතුරියන් දෙදෙනෙක්ද එහි පැමිණ සිටියහ. අපි සිවුදෙනා අවන්හලේ මේසයක අසුන්ගෙන ආහාර ගැනීමට සූදානම් වුනෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



අද අංජලී මා පංතියට යාමට සැරසුණු මොහොතේ පංතියට නොගොස් ඇය සමඟ ඇවිදින්නට යමු දැයි අසන්නට විය. එය මා කිසිසේත් බලාපොරොත්තු නොවූ ඉල්ලීමක් වූ නමුත් ඇය ඉතා ප්‍රීතියෙන් පේරත්ත කල නිසාවෙන් සහ එය මා හට නුහුරු අත්දැකීමක් ද වූ හෙයින් මා හට එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නට සිත් නොවුනෙමි. අපි දෙදෙනා නුවර වැව රවුම පුරා ඇවිදිමින් ප්‍රීති වුනෙමු. සැබවින්ම එය මා කිසි දිනෙක අත් නොවින්ද ඉතාම සුන්දර අත්දැකීමක් උනෙමි. පෙර දින රාත්‍රියේ සිදු වූ අමිහිරි සිදුවීම් සමග මගේ සිත දැඩි වේදනාවකින් පෙළුණු නමුත් උදෑසන ඇයව දුටු සැනින් ඒ සියල්ල පහව යන්නට විය. අපි දෙදෙනා මෙතරම් ලෙන්ගතුකමින් බැඳීමට හේතුව කුමක් දැයි මට සිතාගත නොහැකි කාරණයකි. පෙර දිනක ඇය විසින් මා ආදරණීයයි යනුවෙන් කියා ඇති නමුදු ඇය ද එලෙසම ආදරණීය චරිතයක් ලෙස මා හට සිතුනෙමි.

උදේ වරුවම වැව රවුම වටා ප්‍රීතියෙන් ගතකල අපි දෙදෙනා පංතියේ දහවල් ආහාර ගන්නා වෙලාවේ මගේ පංතිය අසල ඇති අවන්හල වෙත ගියෙමු. අපි එහි යන විට මගේ පංතියේ මිතුරියන් දෙදෙනෙකු වන නිරාෂා සහ ලක්ෂි ද එහි පැමිණ සිටියෙමු. අපි සිව් දෙනා අවන්හලේ එක කොනක තිබූ

RAY PUBLISHING

sinhalaebooks.com



මේසයක පුටුවල වාඩි වී ආහාර ඇනවුම් කළෙමු. අංජලී සහ මම එක් බත් පාර්සලයක් පමණක් ඇනවුම් කළ අතර මගේ මිතුරන් දෙදෙනා ඔවුන් දෙදෙනාට වෙන වෙනම ආහාර ඇනවුම් කරන්නට විය. පසුව නිරාෂා විසින් කතාව ආරම්භ කරන්නට විය.

"අද දෙන්න කොහෙද ගියේ Class Cut කරලා ආ..."

"අපි දෙන්න වැව රවුමේ ඇවිදින්න ගියා...." සිනහවක් පාමින් මා පැවසුවෙමි.

"ඔය දෙන්න තනියම....!!!" ලක්ෂි ද එසේ අසමින් කතාවට එක් විය.

"ඔව්... අපි දෙන්න විතරයි...."

මා පිළිතුරු දුන් අතර අංජලී කිසිවක් නොකියා සිනාසෙමින් සිටියාය.

"අනේ මන්ද උඹල දෙන්න ගැන නම් මට හිතා ගන්න බෑ, කොහොම උනත් අමා උඹ Class Cut කරන එක නම් හොඳ නෑ...." ලක්ෂි පවසන්නට විය.

"එක නම් ඇත්ත Dear..... අපි ආයේ නම් Class Cut නොකර ඉමු.... ඒක නෙවෙයි මං වොෂ් රූම් එකට ගිහින් එන්නද?...."

මෙතෙක් නිහඬව සිටි අංජලී අසුනෙන් නැගිට මගේ යටි තොලේ කොනක ගෑවී තිබූ කෑම ස්වල්පයක් ඇගේ ඇඟිලි තුඩු වලින් පිස දමමින් පවසන්නට විය. කිසිවක් සිතා ගත නොහැකිව මා ඇගේ මුහුණ දෙස බලා සිටියෙමි.

"මාත් එනවා අංජලී...."

RAY PUBLISHING

sinhalaebooks.com





එකවරම නිරාෂා ද අසුනෙන් නැගිට එසේ පවසන්නට වූ අතර ලක්ෂි පුදුමයෙන් මෙන් අංජලී ගේ ක්‍රියාව දෙස බලා සිටින්නට විය. නිරාෂා සහ අංජලී පිටව ගිය පසු ලක්ෂි එකවරම මෙසේ අසන්නට විය.

"මොනවද අනේ ඔය දෙන්න ඔච්චරටම කතා කරන්නේ?...."

"අහ්....." නිරාෂා අංජලී සමග යාමට එක් වූයේ ඇයි දැයි කල්පනා කරමින් සිටි මා තිගැස්සී ලක්ෂි දෙස බලන්නට විය.

"ඔයාල දෙන්න මොනවද ඔච්චරටම කතා කරන්නේ "

"එහෙම විශේෂ දෙයක් නෑ ඉතින්... ඔය එක එක දේවල් ගැන කතා කරනවා.... ම්..... එයා... ගොඩක් ආදරණීයයි..... අනික එයා මගේ ළඟින් ඉන්න වෙලාවට මගේ හිතට හරිම සැහැල්ලුවක් දැනෙනවා...."

"එයත් එක්ක ඉන්කොට විතරද එහෙම දැනෙන්නේ.... අපි එක්ක ඉන්නකොට එහෙම දැනෙන්නේ නැද්ද...."

"අනේ මන්ද.... මට ඒක තේරෙන්නේ නෑ ලක්ෂි.... ඒක නෙවෙයි අද මොනාද Class එකේ මොනවද කරේ...?"

මේ කතාබහ තවදුරටත් ඉදිරියට ගෙනයාමට මට රුචියක් නොවූ හෙයින් කතාව වෙනස් කිරීමේ අරමුණින් මා එසේ පැවසූ අතර අංජලී සහ නිරාෂා තවම ප්‍රමාද ඇයි දැයි යටි සිතට නැගෙන්නට විය.

RAY PUBLISHING

sinhalaebooks.com



අමාගේ මිතුරියක් වන නිරාශා එතරම් මා සමඟ කුළුපග නොවූ නමුත් අද ඇය මා සමඟ වොෂ් රූම් යාමට පැමිණෙමින් කුළුපග වීමට උත්සහ දැරීම පුදුමයට කරුණකි. කෙසේ නමුත් ඇය අංජලිගේ අනිත් මිතුරිය වන ලක්ෂිට වඩා නම් මිත්‍රශීලි තැනැත්තියකි.

වොෂ් රූම් එකේ කැඩපත ඉදිරියට පැමිණි නිරාශා කැඩපතෙන් මුහුණ බලමින් මේසය මත ඇති ජල කරාමයෙන් දැත් සෝදන අතරවාරයේ මාගෙන් මෙසේ අසන්නට විය.

"අංජලී...., ඉතින් අද Class එක මිස් උනාට ඔයාට අවුලක් වෙන්නේ නැද්ද?....."

"අවුලක් නැත්තෙත් නෑ...., ඒත් අද අමා එක්ක ඉන්න ඕනෙම කියල හිතුනා...."

"අහ්...මං අහන්නමයි හිටියේ.... ඔයයි අමයි හැම වෙලාවේම එකට ඉන්නේ..... මොකක් හරි විශේෂ සම්බන්දයක් තියනවද ඔයාලා අතරේ....?

"අපි ඉතින් පොඩි කාලේ ඉඳලා යාලුවෝ.."

sinhalaebooks.com



"යාලුවෝ... එච්චරද...? මටනම් පෙන්නේ ඊට එහා දෙයක් වගේ..."

ඇඟිලි තුඩු කම්මුල මත තබා හැඩ බලමින් කවට සිනහවක් පාමින් එසේ පවසන්නට විය.

"හුම්..... එය හරිම සියුමැලී...."

"ආ.... හා...."

"හරි අහිංසකයි.... මට එයත් එක්ක ඉන්නකොට මගේ ජීවිතේ හැම දෙයක්ම සම්පූර්ණයි වගේ දැනෙනවා..... අනේ මන්ද.... මට තේරෙන්නේ නෑ ඇයි මට එහෙම හිතෙන්නේ කියල...."

මා ලැජ්ජාශීලී සිනහවක් පාමින් බිම බලාගෙන එසේ පවසද්දී නිරාෂා ද කට කොනකින් කවට සිනහවක් පාමින් මදෙස බලා සිටියහ.

"So sweet... එයත් හැම වෙලාවේම කතා කරන්නේ ඔයා ගැනමයි....."

"Really.... "

"Yeah.... එයා කියනව ඔයා එයාට ගොඩක් විශේෂ කෙනෙක් ලු.... අනික ඔයා ළඟ ඉන්නකොට ජීවිතේට හරිම සැහැල්ලුවක් දැනෙනවලු...."

එය අසූ විට මගේ සිත ප්‍රීතියෙන් ඉතිර ගියත් මා කිසිවක් නොකියා සිනහවක් පමණක් පෑ අතර අපි දෙදෙනාම වොෂ් රූම් එකෙන් පිටවී කෑම මේසය වෙත ගියෙමු. අපි එහි යනවිට අමා මා එන දිශාව දෙස බලා සිටි අතර ඔවුන් දෙදෙනා ආහාර ගෙන අවසන් වී තිබුනෙමු. අපගේ ආහාර ගැනීමේ කාල වේලාවත්

RAY PUBLISHING

sinhalaebooks.com



අවසන් වෙමින් තිබූ හෙයින් අමා සහ මා අමාගේ මිතුරියන් දෙදෙනාගෙන් සමුගන්නට සැරසුණි.

"දැන් දෙන්න කොහෙද යන්නේ..."

නිරාෂා අපි දෙදෙනා දෙස බලමින් ඇසුවෙමු.

"දැන් ආයේ Class එකට එන්න බැනේ.... දෙන්න එක්ක කොහේ හරි රවුමක් ගහල ගෙදර යනවා."

අමා මගේ අතේ පැටලෙමින් පවසන්නට වූ අතර ඔවුන් ගෙන් සමුගත් අපි නුවර නගරය දෙසට නැවතත් පියනැගුවෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



මිතුරියන් ගෙන් සමුගත් අපි දෙදෙනා නුවර නගරයේ විවිධ කඩ සාප්පු වල ඇවිදිමින් විනෝද වූනෙමු. මා මෙන්ම අමා ද අද ඉතා ප්‍රීතිමත් වූ බව ඇගේ මුහුණෙන් පිළිබිඹු විය. සවස නැවත නිවසට පැමිණීමට දුම්රියට ගොඩ වූ අපි එක් කොනක හිස්ව තිබූ අසුනක වාඩි වූනෙමු. එය අපිටපම වෙන්වූ වා සේ මට සිතුනි. මඳ වෙලාවක් දෙදෙනාම නිහඬව හිඳ අමා විසින් කතාව ආරම්භ කරන්නට විය.

"අංජලී.... අද නම් මාර සතුටුයි මට..."

"ඇත්තද?..."

"හ්ම්..."

"එහෙනම් මටත් සතුටුයි..."

"ඔයා තරම් මගේ හිත තේරුම් ගත්ත කෙනෙක් මට මුණගැහිලම නෑ අංජලී..."

එසේ කියමින් අමා මගේ උරහිසට බර විය. ඒ මොහොතේ මට ද නොදැනීම මගේ දෑත ඇගේ දෑතේ පැටලුණි. අමාගේ හිස මාගේ හිස මත තිබුනත් ඇගේ හිත කුමක්දෝ සිහින ලෝකයක පාවෙන බව ඇයට නොහැඟෙන පරිදි ඇස් කොනින් මා ඇගේ මුව දෙස බැලූ ඒ මොහොතේ මා හට පසක් උනෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



කුමක් නමුත් එය සුන්දර සිහින ලෝකයක් යැයි මා සිතමි. ඈට මගේ උරතලේ පහස විදින්නට හැර මෙසේ මඳ වෙලාවක් නිහාඬ කල්පනාවක හිඳ මා හඬ අවදි කලෙමි.

"ඇයි ඔය එහෙම කියන්නේ...?"

"ඔයා මගේ හිත ගැන හොඳට දන්නවා... අද මං ගොඩක් දුකින් හිටියේ.... ඉතින් ඒ හැමදේම අමතක වෙන්න ඔයා මාව ගොඩක් සතුටු කලා..... හා මං බොරුද කිවුවේ..."

මගේ උරහිසේ තිබූ ඇගේ හිස එක්වරම ඔසවා සුන්දර සිනහවක් පාමින් මා දෙස බලන්නට විය.

"ඒක නම් එහෙම තමයි... නමුත් මං ගෙදර ඉඳලම එහෙම හිතාගෙන ආවේ නෑ.... ඒක හිතුනේ උදේ Train එකට නැග්ගටත් පස්සේ..."

"හරි ඉතින් එහෙම හරි ඔයාට හිතුනානේ..." අමා නැවතත් මගේ උරහිසට බරවෙමින් පැවසීය.

"කොහොම හරි අද ඔයා සතුටු උනානේ... මට ඒ ඇති...."

සුළු මොහොතක් නිහඬව සිටි මා උරහිසේ ඇති ඇගේ මුව දෙස බලන්නට විය. ඇගේ දෙනෙත් පිය වී තිබුණි. පෙරදින රාත්‍රියේ ඇය ද මා සේම නිදිවර්ජිතව ඉන්නට ඇත. ඒ නිසා ඇයව අවදි කිරීමට සිත් නොවූ හෙයින් පේරාදෙණිය ළං වන තුරුම ඇයට එසේ ඉන්නට හැර මා ද කල්පනා ලොවකට වැටුනෙමි.

අද දහවල් තිරාශා කී දේවල් සිහියට නැගෙන්නට විය. අමා මං නිසා ගොඩක් සතුටින් සිටින බව ඇයගේ කතාවෙන් මා හට පසක් විය. ඒ තරම් සතුටක් මා හට තවත් නැත. එපමණක්

RAY PUBLISHING

sinhalaebooks.com



නොව, එතරම් අහිංසක පිරිසිදු හිතක් මා කිසි දිනක දැක නොතිබුනෙමි. පාසල් කාලයෙන් පසු අපි මුණගැහුණු මේ ටික කලට ඇගේ සිත තුල මාත් මාගේ සිත තුල ඇත් මෙතරම් පැලපදියම් විමට තරම් අපේ සිත් තුල ඇති ආකර්ෂණය කුමක් දැයි මා හට සිතා ගත නොහැක. ඇයව සිහිවන හැම මොහොතකම මගේ සිත තුල කුමක්දෝ අමුතු සුන්දර හැඟීමක් ඇතිවනු ඇත. අමාට ද එසේම ඇතිවන බව විටෙක ඈ මට පවසා ඇත. එය ආදරයක් දැයි එක්වරම මගේ සිහියට නැගෙන්නට විය. මම ඇයට ආදරේ කරනවද..., එතකොට ඇයත් මට...., අනේ මන්දා.... කුමක් නමුත් ඇය හා මා එදා උද්‍යානයේ මුණගැහුණු මොහොතේ සිට මාගේ සිතට යම් දෙයක් සිදු වී ඇති බව නම් පැහැදිලිවම කිව හැක.

මේ වනවිට අමා සුව නින්දක පසුවන අතර ඇයව මේ සුව නින්දෙන් අවදි කිරීමට සිත් නොවූවත් දුම්රිය පේරාදෙණියට ළං වී ඇති බැවින් මා ඇයව අවදි කෙරුවෙමි.

"අමා..... අමා.... නැගිටින්න... අපි දැන් බහින්න ලඟයි...." අමා හෙමිහිට දෙනෙත් විවර කරන්නට විය.

"හොඳට නිදාගත්තා නේද කෙල්ල...?"

"අනේ මට දන්නෙම නැතුව නින්ද ගියා අංජලී...."

"නිදාගෙන හිටපු විදිහ දැක්කහම මට ඇහැරවන්න හිතුනෙත් නෑ...."

මේ අතර දුම්රිය පේරාදෙණිය දුම්රියපලට පැමිණි හෙයින් අපි දුම්රියෙන් බැස නිවෙස් බලා පිටත් උනෙමු. වෙනදාටත් වඩා විශාල සතුටක් අද ඇගේ සිත තුල ගැබ් වී ඇති බැව් ඇගේ හැසිරීමෙන් මා හට හොඳින් පසක් විය.

RAY PUBLISHING

sinhalaebooks.com



# තෙමසකට පසු.....

RAY PUBLISHING

sinhalaebooks.com





මේ වන විට අමා මා හට පේරාදෙණියේදී මුනගැසී තෙමසක් ගතවී ඇත. පාඨමාලාව ආරම්භ වී ද මේ වනවිට තෙමසක් පමණ වේ. මෙසේ අපි දෙදෙනාගේ බැඳීම දිනෙන් දින ශක්තිමත් වී යන අතරවාරයේ මගේ පංතියේ මිතුරෙක් ද මා ගැන යම් උනන්දුවක් දක්වන බව මා හට වැටහෙන්නට විය.

ඔහු ගේ නම ශාන් වන අතර ඔහු පංතියේ මා සමග එකට ඉගෙනගන්නා මිතුරාය. පාඨමාලාවේ මා නොදන්නා බොහෝ දේ ඔහු මට කියා දී ඇත. මා ඔහුව හොඳ මිතුරෙක් ලෙස ආශ්‍රය කලද ඔහු ගේ සිත තුල මා ගැන යම් අදහසක් ඇති බව දින කිහිපයක සිටම මා හට වැටහී තිබුහණෙමි. මාගේ සැකය නිවැරදි කරමින් ඔහු දිනක් මා හට එය පැවසීය.

sinhalaebooks.com



*2000/05/16*

අද උදෑසන පංතියට පැමිණි විට ආයතනයේ යම් කටයුත්තක් හේතුවෙන් පංතිය ආරම්භ කිරීමට පැයක පමණ කාලයක් ප්‍රමාද වන බව ආයතනයේ කාර්යමණ්ඩලයේ පුද්ගලයෙකු විසින් අපව දැනුවත් කරන්නට විය. එම කාලය ආයතනයේ භෝජනාගාරයේ ගතකිරීමට පංතියේ සියලුම දෙනා කතිකා කරගත් හෙයින් අපි භෝජනාගාරය වෙත ගියෙමු. මා එහි එක් මේසයක පුටුවක අසුන්ගත් අතර මාගේ මිතුරා වන ශාන් ද මගේ මේසයේම යාබද පුටුවක අසුන් ගන්නට විය.

"අපි මොනවහරි බොමුද අංජලී?....."

"මට එපා ශාන්.... ඔයා බොන්න.... මන් උදේට කාපු ගමන් ආවේ...."

"කමක් නෑ එහෙනං.... මේ දැන් ඔයාට සර් කියන ඒව තේරෙනව නේද...."

"දැන් අවුලක් නෑ.... අර මුල ටික තමයි අවුල් ගියේ.... "

sinhalaebooks.com



"ඒක නෙවෙයි අංජලී මම ඔයාට කියන්නමයි හිටියේ...."

"මොකද්ද?..."

"මම හැමදාම යන්නේ පේරාදෙණිය පහු කරලනේ.... ඉතින් මට පුළුවන් ගෙවල් ගාවින් ඩ්‍රොප් කරන්න..."

"අනේ ශාන් මුකුත් හිතන්න එපා... මං මගේ යාලුවෙක් එක්ක තමයි හැමදාම උදේ හවස යන්නේ එන්නේ...."

"ආ.... එහෙමද.... කමක් නෑ එහෙනං.... ඔයා අර දවසක් කිව්වේ අමා කියල... එයාද?...."

"හම්.... ඔව්.... එයා එක්ක තමයි...."

"ඔයාල දෙන්න පොඩි කාලේ ඉඳලම යාලුවොද?...."

"ඔව්... ස්කොලේ යන කාලේ ඉඳලම...."

මේ අතරේ මා අමා සමග ද කෙටි පණිවිඩ හුවමාරු කරගනිමින් සිටියෙහ. ඇයත් පංතියේ සිටින අතරතුර මා හට මොනවා හරි එවනු ඇත. එසේ මා අමාගේ කෙටි පණිවුඩයකට පිළිතුරු සපයමින් සිටි හෙයින් මඳ වෙලාවකට නතර වූ අපේ කතාබහ ආරම්භ කරමින් නැවත ශාන් මා අමතන්නට විය.

"අංජලී...."

මෙවර ඔහුගේ කතා විලාසය මදක් වෙනස් වී ඇත.

"මම....." දුරකථනය දෙස බලාගෙන සිටි මා හිස ඔසවා ඔහු දෙස බලන්නට වූ අතර මෙතෙක් මා දෙස කෙලින් බලාගෙන සිනහමුසු මුහුණින් කතා කරපු ශාන් බිම බලාගෙන හොරගල් අහුලන්නට විය.

RAY PUBLISHING

sinhalaebooks.com



"ඒපාර මොකද්ද?....." මද සිනහවක් පාමින් මා ඔහුගෙන් ඇසුවෙමි.

"දවස් කීපයක ඉඳලා මං ඔයාට දෙයක් කියන්න හිටියේ... එත් ඔයා තරහවෙයි කියලා හිතලා මට කියන්න හිතුනේ නෑ.... එත් අද නම් ඕන එකක් කියලා කියනවමයි කියලා හිතුනා..."

ශාන් මෙවර කුමක් ගැනද කියන්නට උත්සහ කරන්නේ කියා සිතාගත නොහැකිව මා පුදුමයෙන් ඔහු දෙස බලා සිටියෙමි.

"මං තරහ වෙන්නේ නෑ ශාන් ඕන දෙයක් කියන්න.... අනික ඔයා දන්නවනේ මං ගැන...."

"Promise....!"

" Promise....! අනේ කියන්න..."

"මං ඔයාට කැමති....."

එය ඇසීමෙන් නිරුත්තර වූ මා මද වෙලාවක් යන තුරු නිහඬව සිටින්නට වූ අතර ශාන් ද බිම බලාගෙන සිටියහ.

"ශාන්... ඔයා ඔය විහිළුවක් නේද කරන්නේ...."

"නෑ මං ඔයාට ඇත්තටම කිව්වේ.... මං ඔයාට කැමති...."

නැවතත් මා කිසිවක් කියාගත නොහැකිව නිහඬව බිම බලා සිටියෙමි.

"කමක් නෑ.... ඔයා හිමිහිට කල්පනා කරල මට උත්තරයක් දෙන්නකෝ....."

RAY PUBLISHING

sinhalaebooks.com



"හරි මම ඔයාට හිතලා බලලා උත්තරයක් දෙන්නම්.... හැබැයි මං මොන විදිහේ උත්තරයක් දුන්නත් මාත් එක්ක තරහ වෙන්න බෑ..."

කුමක් කලයුතු දැයි සිතාගත නොහැකි වූ මා ශාන් ට එසේ පැවසුවෙමි.

"ඔව් අංජලී... ඔයත් මාත් එක්ක තරහ වෙන එකක් නෑ කියල මං හිතනවා..."

ශාන් එසේ කීමෙන් පසු මඳ වෙලාවක් අපි දෙදෙනාම නිහඬව හිඳ නැවතත් පංතිය වෙත ගියෙමු. පංති කාමරයේ දී ද අද අපි අතර වැඩි කතාබහක් ඇති නොවුනෙමු. අද දවසේ පංති කාමරයේ කල කිසිවක් මාගේ මතකයේ රැඳී නැත. හැම මොහොතකම ශාන් ගේ යෝජනාව සිහියට නැගෙන්නට වූ හෙයින් අද දවස නිමාවනතුරු මා සිටියේ නොඉවසිල්ලෙනි.

වෙනදාටත් කලින් අද මා නිදියහනට පැමිණියේ ශාන් ට මා කුමක් කිවයුතු දැයි කල්පනා කිරීමටය. මගේ සිත තුල ශාන් පිළිබඳව එවන් හැඟීමක් මේ තාක් දැනී නැත. එවන් හැඟීමක් කිසිම දිනෙක ඇති නොවන බවට ද මට විශ්වාසය. මක්නිසාදයත් මේ වන විට හැම මොහොතකම සිත තුල සක්මන් කරනුයේ අමා පමණක් නිසාවෙන් වෙන කිසිවකුටවත් මාගේ සිත තුල ඉඩක් නොවීය. සැබවින්ම ශාන් හොඳ මිතුරෙකු බැවින් එම මිත්‍රත්වය පලුදු කරගැනීමට ද මා හට සිත් නොවුනෙමි. එම නිසා කාරුණිකව ශාන් ට කරුණු පහදා දී ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට මා අවසානයේ තීරණය කලෙමි.

මීලඟට මාගේ සිත වදදෙන්නට වුයේ අමා පිලිබඳවය. සැබවින්ම මගේ සිත තුල ඇත්තේ අමා පිලිබඳව අසීමිත ආදරයක් බව අද මා හට හොඳින් පසක් උනෙමි. මා කෙසේ ඇයට ඒ ගැන කියන්න දැයි සිතාගත නොහැක. කෙසේ නමුත්

FAN PUBLISHING

sinhalaebooks.com



අමා ගේ සිත තුල ද මා ගැන කුමක් හෝ ආදරණීය හැඟීමක්ඇතැයි ඇයගේ හැසිරීමෙන් මා හට පසක් වී තිබුනෙමි. එය එසේ නොවුනහොත් මගේ අදහස ඇයට පැවසීමෙන් පසු අපි අතර ඇති බැඳීම ද පලුදු විය හැකි යැයි සිතේ බයක් ද ඇත. මා නිසා ඇයට යම් සිත රිදීමක් ඇති වුවහොත් එය මා හට දරාගත නොහැකි කරුණකි. එම නිසා ඇයට මෙය එකවරම නොකියා පළමුව යම් ඉඟියකින් පවසා ඇගේ ප්‍රතිචාරය කුමක් දැයි බැලීමට මා තීරණය කලෙමි. මේ සඳහා හෙටම අමා මුණගැසිය යුතු යයි මට සිතුනෙමි. හෙට ඇය මුණගැසිය හැකි දැයි දැන ගැනීමට මා අමා ට දුරකතන ඇමතුමක් ගත්තෙමි.

"Hello.... අංජලී... "

"Hello.... අමා... මම මේ වෙලාවේ කතාකරන එක ඔයාට කරදරයක් නෑ නේද?...."

"අනේ නෑ Dear.... කියන්න.... හදිස්සියක්ද?..."

"නෑ... නෑ... හදිස්සියක්ම නෙවෙයි... හෙට අපිට Meet වෙන්න පුළුවන් වෙයිද?...."

"හෙට..... ආ.... පුළුවන්, හෙට අම්මයි නැන්දයි දෙන්නම උදේ කොහෙද යනවා කිව්වා. හවස් වෙයි එන්න, ඔයා එන්න අපේ ගෙදර"

"Really..... ශා මරුනේ.... ඒ කියන්නේ අපි දෙන්නට හවස් වෙනකම්ම කතා කර කර ඉන්න පුළුවන් නේද?...."

"හ්ම්ම්.... හෙට දවල්ට මගේ අතින් හදපු කෑම වේලකුත් කන්න පුළුවන්..."

RAY PUBLISHING

sinhalaebooks.com



"Wow.... ඉතින් මං හෙට කීයටද එන්න ඕනේ?...."

"මං හෙට උදේ ට කියන්නද අංජලී?..."

"හරි මං එහෙනම් ඔයා උදේ කතා කරනකම් බලන් ඉන්නවා...."

"හ්ම්ම්... එහෙනම් මං තියන්නද Dear?..."

"හරි... Good Night... Bye Dear"

" Good Night... Bye... අංජලී...."

ඇමතුම විසන්ධි කල මා සයනයේ වැතිරී හෙට දිනයේ කුමක් කලයුතු දැයි සිතමින් කල්පනා ලොවකට ගියෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



## 2000/05/17

අද සෙනසුරාදා දිනයක් වූ නමුත් උදෑසනම අවදි වී බලා සිටියේ අමා ගෙන් ඇමතුමක් ලැබෙන තුරුය. අවදි වී මද වෙලාවක් සයනයේ වැතිරී බලා සිටි මා නාන කාමරයට ගොස් පිරිසිදු වී මුළුතැන් ගෙට යන්න සැරසෙනවාත් සමගම දුරකථනය නාද වෙන්නට විය. එය මා මෙතෙක් නොඉවසිල්ලෙන් බලා සිටි අමා ඇමතුමය. මා ඉක්මනින් සයනය වෙත දිව ගොස් දුරකථනය ගෙන ඇමතුවෙමි.

"Hello අංජලී..."

" Hello කියන්න අමා... මං කීයටද එන්න ඕනේ..."

"අම්මෝ තියන හදිස්සිය...."

"ඔව් ඔව් හදිස්සී තමයි.... කියන්නකෝ ඉතින් මං කීයටද එන්න ඕනේ...."

"අම්මයි නැන්දයි 11 ට විතර යනවා. 11 පහුවෙලා එන්න..."

"11 වෙනකම්ම ඉන්න ඕනේ නේද... හරි එහෙනං Bye අමා..."

" Bye .... අංජලී...."

RAY PUBLISHING

sinhalaebooks.com



අමා ගේ වචන වල ගැබ් වී තිබූ ප්‍රීතිය මගේ සිතෙහි ඇති ප්‍රීතියට දෙවැනි නැත.

උදෑසන 11.00 ට පමණ අම්මලා ගෙදරින් පිටවූ බව දන්වමින් අමාගෙන් කෙටි පණිවිඩයක් ලැබුණි. එසැනින් ලෑස්ති වී ගෙදරින් පිට වූ මා අමා ගේ ගෙදරට යන විට 11.20 ට පමණ වී තිබුණෙමි. මා එහි යන විට ප්‍රීතියෙන් පුරවාගත් මුහුණින් අමා ඇගේ ගේ දොරකඩ සිට මා එන මග දෙස බලා සිටින අයුරු බලමින් මා ටිකෙන් ටික ඇගේ නිවසට ළං උනෙමි.

"Hi... අංජලී... යමු ගෙට..."

මගේ දෑතින්ම අල්ලාගත් අමා මාව නිවසට කැඳවාගෙන යන්නට විය. සාලයේ නතර නොවූ ඇය ඇගේ කාමරයට මා කැඳවාගෙන යන ලදී.

"වාඩි වෙන්න අංජලී...."

ඈ ඇගේ සයනට අත දිගුකරමින් පැවසූ අතර මා වාඩි වූ පසු ඇය ද මා අසලින් වාඩි විය.

"ඉතින් අංජලී..... කියන්න..."

"අම්මල කීයටද එනවා කිව්වේ?...."

"4 විතර වෙයි. එතකන් ඔය අපේ ගෙදර හරිද?...."

"ශෝක් නේ... මේ එක නෙවෙයි... ඔයා Class එකේ ඉන්නකොට මැසේජ් කරන්න අවුලක් නැද්ද?..."

"මොකද නැත්තේ.... මම හොරෙන් කරන්නේ...."

"ඒක ඔයාට ප්‍රශ්නයක් වෙයි නේද?..."

RAY PUBLISHING

sinhalaebooks.com



"නෑ නෑ මම Phone එක Pencil Case එක ඇතුලේ තියාගෙන ඉන්නේ...."

"ඒ උනාට.... පංතියේ කියන දේවල් එහෙම මතක හිටිනවද ඔහොම ආ..."

"කොහොමත් හැම වෙලාවේම ඔයාව මතක් වෙන එක තමයි වෙන්නේ.... ඒ වෙලාවට අනික් දේවල් අමතක වෙනවා...."

අම්මා එසේ කියමින් සුරතල් සිනාවක් පාන්නට වූ අතර මා ද සිනහවක් පාමින් නිහඬව සිටියෙමි. එසේ මද වෙලාවක් නිහඬව බිම බලාගෙන සිටි මා අම්මා ගේ එක අතක් අල්ලාගෙන මගේ අතේ ඇඟිලි තුඩු වලින් ඇගේ අතේ ඇඟිලි පිරිමදිමින් මෙසේ පැවසුවෙමි.

"අම්මා...."

"ම්...."

"අපේ Class එකේ Boy කෙනෙක් මට කැමති කිව්වනේ...."

එසේ කියන විට මෙතෙක් වෙලා සුරතල් සිනහවකින් පිරී තිබුණු අම්මාගේ මුහුණ අඳුරු වී ගිය අයුරු මා හොඳින් දුටුවෙමි. නමුත් ඇය ඒ බව සඟවා සිටීමට මහත් වෙහෙසක් දැරීය.

"කවුද ඒ Boy... ලස්සනයි ද?..." යන්තන් මුවගට සිනහවක් පාමින් අම්මා ඇසීය.

"නම ශාන්.. Class එකේ යාළුවා...."

"ආ... අර ඔයාට උදවු කරනවා කියපු කෙනාද?...."

"ඔව් ඔව් එයා තමයි...."

RAY PUBLISHING

sinhalaebooks.com



"ඉතින් ඔයා මොකද කිව්වේ... ඔයා කැමතිද එයාට?....."

අමා බිම බලාගෙන අසන්නට වූ අයුරින් මා හට නොපෙන්වූ නමුත් ඇ හිතේ ලොකු කණගාටුවකින් සිටින බව හොදින් පසක් විය.

"කැමතී... එත් ඒ විදිහට නෙවෙයි... එයා මට හොඳ යාලුවෙක් විතරයි.... මගේ හිතේ එයා ගැන එහෙම අදහසක් නෑ... අනික ඇයි එයාට එහෙම අදහසක් ආවේ...."

"එයාට ඔයාව ඒ විදිහට දැනෙනවා ඇති...."

"ඔයාටත් එහෙම දැනිල තියනවද?...." මා එසේ අසූ විට අමා කිසිවක් නොකියා බිම බලා සිටින්නට විය.

"ඒක නෙවෙයි අමා... ඔයා ඔය ඇඳන් ඉන්න ඇඳුම ට හරි ලස්සනයි...."

ඇගේ සිතේ ඇති වී ඇති කණගාටුදායක තත්වය මගහැරීමට එසේ පැවසූ විට අමා යන්තම් කට කොනකින් සිනහවක් පාන්නට විය.

"ඇයි ඔහොම හිනාවෙන්නේ... මං මීට කලිනුත් ඔයාට එහෙම කියලා තියනවනේ..."

"ඔව් ඔව්... ඔයා එහෙම කියල තියනවා තමයි... එක නෙවෙයි ඔයා ශාන්ට මොකද්ද කියන්නේ?..."

ශාන් පිළිබඳව මගේ හිතේ ඇති අදහස දැන ගැනීමට ඇ දැඩි උනන්දුවකින් සිටින බව අමා ගේ කතාවෙන් මා හොඳින් තෙරුම් ගත්තෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



"ඔය මොකක් හරි කියනවා..... අපි හොඳ යාළුවො විතරයි අමා..... සමහර විට එයා මාත් එක්ක තරහ වෙයිද දන්නෙත් නෑ..... අනේ මන්දා..."

"එයාගේ හිතේ ඇත්තටම ඔයා ගැන ආදරයක් තියනවනම්..... එයාට කොහොමත් දුක හිතේවි..."

"එත් අමා... මගේ හිත තියෙන්නේ මෙතන...." මා එසේ පවසමින් අමා ගේ අත තදින් අල්ලාගන්නට වූ අතර අමා එක්වරම තිගැස්සී පුදුමයෙන් සහ අවිහිංසකව මා දිහා බලා හිඳින්නට විය.

"Can I kiss here " මා එසේ අසමින් මගේ අතින් තදකරගෙන සිටි ඇගේ අතේ ඇඟිලි දෙස බැලුවෙමි. ඈ ද කිසිවක් නොකියා තදකරගෙන සිටි ඇඟිලි දිගහරිමින් මගේ මුව දෙසට ළං කරන්නට විය. මා ඇගේ අතේ ඇඟිලි එකින් එක සිපගන්නට වූ අතර නිහඬව දෑස් පියාගෙන වේගයෙන් හුස්ම ගනිමින් ඒ පහස විඳින්නට වූ අමා සෙමෙන් සෙමෙන් මගේ උරහිසට බාරවන්නට විය. අමා වේගයෙන් හුස්ම ගන්නා අයුරු මට තවත් හොඳින් ඇසෙන්නට විය.

එක්වරම කවුදෝ ගෙදර දොරට තට්ටු කරන ශබ්දයක් ඇසීම නිසා අපි දෙදෙනා තිගැස්සී මෙතෙක් වෙලා පාවෙමින් සිටි සිහින ලෝකයෙන් අවදිවුනෙමු .

"මං ගිහින් කවුද කියලා බලලා එන්නම් අංජලී....."

එක්වරම සයනයෙන් නැගිටින්නට වූ අමා කවට සිනහවක් පා එසේ කියමින් ගෙයි ප්‍රධාන දොරටුව වෙත දිව ගියහ.

මාගේ උත්සාහය මේ වන විට බොහෝ දුරට සාර්ථක වී ඇති බව මා හට වැටහී යන්නට විය. මේ නිසා මගේ සිතෙහි මේ

sinhalaebooks.com



මොහොතේ ඇති වී ඇති ප්‍රීතිජනක හැඟීම වචනයෙන් විස්තර කල නොහැකි තරම් ය. අමා ගේ සිත තුළ මා ගැන යම් හැඟීමක් ඇති බව ඇගේ හැසිරීමෙන් මා හට අවබෝධ කරගත්තෙමි. සැබවින් ම එය ආදරණීය හැඟීමක් බව මේ වන විට මා හට හොඳින් පසක් වී තිබුනෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



අංජලී වෙනදාටත් වඩා වැඩි උද්යෝගයකින් අද මගේ නිවසට පැමිණීම ඇය මට නොකී නමුත් කුමක් හෝ විශේෂයක් ඇති බව මා හට වැටහී තිබුණෙමි. මා නොදැනීම මගේ සිත ද අද වෙනදාටත් වඩා නොඉවසිලිමත් බවක් ඇති වී ඇත. උදෑසන 11.00 වන විට මා අංජලී ට කෙටි පණිවිඩයක් දී ඇගේ පැමිණීම බලාපොරොත්තුවෙන් නිවස ඉදිරියට වී ඈ එන මග බලා සිටියෙමි.

සෙමෙන් සෙමෙන් ඈතින් මතුවන ඇගේ රුව දුටු මාගේ සිත තවත් ප්‍රීතියෙන් උතුරා යන්නට විය. ඇය මගේ නිවස අසලට පැමිණි පසු මා ඇයව මගේ කාමරයට කැඳවාගෙන ගියෙමි.

සයනයේ වාඩි වී සුහද පිළිසඳරක යෙදී සිටින අතර වාරයේ අංජලී ගේ පංතියේ පිරිමි ළමයෙකු ඇයට කැමැත්ත ප්‍රකාශ කල බව පවසන්නට විය. අංජලී ගේ පංතියේ ඇයට බෙහෙවින් සමීප මිතුරෙකු වූ ඔහු ගේ නම ශාන් ය. ඇය මින් පෙර දිනක ඔහු ඇයට පංතියේ පාඩම් වැඩ වලට බොහෝ සේ උදවු කරන බව පවසා ඇත.

අංජලී ශාන් ගේ යෝජනාව පිළිබඳව පැවසූ මොහොතේ ඇය සහ මා අතර ඇති බැඳීම දුරස් වී යාවි දැයි යන සිතුවිල්ල මාගේ සිතට පැමිණි හෙයින් මෙතෙක් වෙලා සිත තුළ රජ වී සිටි ප්‍රීතිජනක හැඟීම ක්ෂණයෙන් පහව ගියහ. එය මා අංජලීට නොපෙන්වා සිටීමට මහත් උත්සාහයක් දැරුවෙමි. නමුත් ශාන් ඇයට හොඳ මිතුරෙක් පමණක් බව ඇය පවසූ නිසාවෙන් මාගේ සිතේ එකවරම ඇති වූ ශෝකජනක හැඟීම

sinhalaebooks.com



ක්‍රමයෙන් වියැකී යන්නට විය. අංජලී ගේ සිතෙහි සැබවින්ම ශාන් පිළිබඳව ඇත්තේ කුමන හැඟීමක් දැයි සැකහැර දැනගැනීම පිණිස මා ඇයගෙන් ඒ පිළිබඳව නැවතත් විමසුවෙමි. ඒ මොහොතේ කිසිසේත් නොසිතූ වදනක් ඇගේ මුවින් පිටවිය." මගේ හිත තියෙන්නේ මෙතැන" යනුවෙන් පවසමින් ඈ ඇගේ අතින් පිරිමදිමින් සිට මගේ සුරත තදින් අල්ලාගන්නට විය. මේ සිදුවන්නට යන්නේ කුමක් දැයි සිතාගත නොහැකි වූ මා තිගැස්සී ඇගේ මුහුණ දෙස බලා සිටින්නට වූ අතර ඉතා සුන්දර වූ ආදරණීය බැල්මක් ඇගේ මුහුණින් සනිටුහන් විය.

මද වෙලාවක් අපි එකිනෙකා ගේ මුහුණු දෙස බලා සිට අනතුරුව අංජලී විසින් නැවත මාව පුදුමයට පතකරන්නට විය. මෙතෙක් වෙලා තදින් අල්ලාගෙන සිටි මගේ සුරතේ ඇඟිලි දෙස බලමින් ඈ ඉතා ආදරණීය ස්වරයකින් "මට මෙතැන සිපගන්න පුළුවන්දැයි" අසන්නට විය. කිසිවක් සිතාගත නොහකි වූ මා ඇගේ ඒ ආදරණීය වදනට වශීවූවාක් මෙන් මා නොදැනීම මගේ සුරත ඇගේ මුව වෙත දිගු වුනෙමි. එවිට ඇය මගේ සුරතේ ඇඟිලි තුඩු එකින් එක සිපගන්නට විය. එකවර මගේ මුළු සිරුර පුරාම විදුලි සැරක් ගියා සේ හිරිවැටී යන්නට විය. එය මා ජීවිතේ විඳින ලද සුන්දරතම සහ චමත්කාරජනක අත්දැකීමකී. මේ හැඟීම කෙතරම් සුන්දර ද කිවහොත් මා නොදැනුවත්වම මාගේ දෙනෙත් පියවී හිස අංජලී ගේ උරතලය මතට බරවන්නට උනෙමි. එක වරම ගෙදර දොරට තට්ටු කරන ශබ්දයක් ඇසීම නිසාවෙන් අපි දෙදෙනාම තිගැස්සී නැවතත් පියවි සිහියට පැමිණියෙමු.

අපේ නැන්දාගේ හිතවතියක පැමිණ නැන්දා ගැන විමසන්නට විය. නැන්දා ගෙදර නොමැති බව පවසා මා නැවතත් කාමරයට පැමිණෙන විට අංජලී තනිවම සිනා සෙමින් කල්පනා ලෝකයක තනි වී සිටියහ. ඇයගේ මුහුණේ පිරී ඉතිරී යන සතුට දුටු විට ඇයව එම ලෝකයෙන් අවදි නොකරන්නට සිතුන නමුත්

sinhalaebooks.com



දහවල් ආහාරය ප්‍රමාද වෙමින් තිබූ හෙයින් මා ඇයව ඇමතුවෙමි.

"අංජලී.... " ඇය තිගැස්සී මා දෙස බලන්නට විය.

"අපි කෑම කාල ඉමුද?..."

"හ්ම්... කවුද ආවේ?..."

"නැන්දා අඳුරන කෙනෙක්.... නැන්දා නෑ කියල මං යැව්වා..."

මා එසේ කියමින් අංජලීව කෑම කන කාමරය වෙත කැඳවාගෙන ගියෙමි. ඇයට කෑම මේසයේ අසුනක වාඩිවෙන්නට පවසා මා කෑම මේසයට ආහාර පිළියෙළ කිරීම සඳහා මුළුතැන්ගෙය වෙත ගියෙමි. මා කුඩා භාජන වලට ආහාර බෙදමින් සිටින අතර වාරයේ අංජලී මා අමතමින් මුළුතැන්ගෙය වෙත පැමිණියහ.

"අමා... මං එන්නද?..."

"එන්න Dear..."

"කෙල්ල ගොඩක් මහන්සි වෙලා වගේ..."

"රහද බලන්නකෝ මගේ කෑම..."

"සුවඳේ හැටියට නම් රහයි වගේ... කාලම බලමුකෝ..."

ඇය එසේ කියමින් මගේ පිටුපසට ඇවිත් කන්පෙති පිටුපසට ඇගේ මුව ළං කර ගෙල පිටුපසට ගෙනයමින් සිපගන්නට වූ අතර ඇගේ දෑත් මගේ ඉන වටා යවමින් උදරය පෙදෙස වෙලාගන්නට විය. පෙරටත් වඩා දැඩිව මගේ මුළු සිරුරම හිරිවැටී ගොස් නොදැනීම දෙනෙත් පියවිය. මා ද මගේ

sinhalaebooks.com



උදරය මත තිබූ ඇගේ දෑත් මත මගේ දෑත් තබමින් ඇයට වෙතට බරවී ඒ ශෘංගාරාත්මක මොහොත වින්දගත්තෙමි. මෙතෙක් ජීවිතේ කිසිඳු දිනක නොදැනුනු ඒ උණුසුමෙන් ඈත් වීමට මට සිත් නොවුනෙමි. ක්‍රමයෙන් මගේ හදගැස්ම වේගයෙන් වැඩි වී මුළු ශරීරයම පණ නැති වී ගියා සේ දැනෙන්නට විය එසේ මද වේලාවක් ගතවෙද්දී මේසය මත තිබූ හැන්දක් බිම වැටීම හේතුවෙන් දෙදෙනාම තිගැස්සී අවදි උනෙමු. පියවි සිහියට පැමිණි අපි දෙදෙනා එකිනෙකා ගේ දෑස් මදවේලාවක් බලා හිඳ ලැජ්ජාශීලී සිනහවක් නගමින් බිම බලාගත්තෙමු. අනතුරුව අංජලී විසින් බිමට වැටුණු හැන්ද ඇහිඳගෙන මගේ අතට දී ඇයද කෑම මේසය පිළියෙළ කිරීමට සහය විය. ආහාර ගන්නා මොහොතේ ද අපි දෙදෙනා කිසිවක් කතා නොකළ මුත් එකිනෙකා ගේ මුහුණු දෙස බලමින් ලැජ්ජාවෙන් සිනාසුනෙමු. නමුත් ආහාර ගෙන අවසන් වීමට පෙර අංජලී ඇගේ හඬ අවදි කරන්නට විය.

"අමා... ඇත්තටම ඔයාගේ කෑම හරිම රසයි..."

මා තවමත් පෙර ගතකල ආදරණීය ලෝකයේ අතරමං වී ඇති බැවින් කිසිවක් කියාගත නොහැකි වූ මා සිනහවක් පමණක් පා බිම බලගත්තෙමි. අනතුරුව ඇය හා මා එකතු වී කෑම මේසය අස්කර නැවත මාගේ කාමරයට ගොස් සතුටුසාමීචියේ යෙදෙන්නට වූ නමුත් අංජලී පමණක් කතා කල අතර ඇයට පිළිතුරු වශයෙන් මා සිනහවක් පමණක් පා නිහඬව සිටියෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



අපිට නොදැනීම කාලය ගත වී මා අමාගෙන් සමුගන්නා මොහොත එළඹුනෙමි.

"අමා... මම දැන් යන්නද.... ගොඩක් හවස් උනා..."

"තව ටිකක් වෙලා ඉන්න බැරිවෙයිද අංජලී...."

අමා එසේ අසමින් අවිහිංසක බැල්මක් පාන්නට විය. ඇගේ බැල්ම හමුවේ ඇයගෙන් සමුගැනීමට සිත් නොවූ වත් කාලය ඉක්ම ගොස් ඇති බැවින් මා යායුතුවම තිබුණෙමි.

"බෑ අමා... දැන් ගොඩක් හවස් උනා... අම්මා ගෙදරට ගේන්න බඩු ටිකකුත් කිව්වා. යන ගමන් ටවුමෙන් ඒ ටික අරන් යන්නත් ඕනේ. අනික දැන් ඔයාලගේ අම්මලත් ඒවි නේ..."

"ම්ම්.... හරි එහෙනම්.... පුලුවන්නම් රෑට මට call එකක් දෙනවද?..."

"Sure darling... Bye..."

"Bye..."

අමා ගේ නිවසින් සමුගත් මා අම්මා කියූ බඩු ගැනීම සඳහා ටවුම වෙත ගියෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



*සත්‍ය ආදරය*

රාත්‍රියේ සයනයට පැමිණි වහාම දහවල් මතකය සිහියට නැගෙන්නට විය. අමාගේ මුහුණේ තිබු ඒ අවිහිංසක සිනහව සහ ආදරණීය බැල්ම මට මැවි මැවී පෙනෙන්නට වූ අතර ඇගේ ඒ උනුසුම තවමත් මගේ වත පුරා දැවටෙනවා සේ දැනෙන්නට විය. මා දුරකථනය ගෙන ඇයට ඇමතුමක් ගත්තෙමි.

"Hello..."

"Hello my baby....."

"මං ඔයාගෙන් Call එකක් එනකන් බලන් හිටියේ...."

"හ්මම්..... අමා I'm sorry dear....."

"Why sorry...?"

"අද වෙච්ච දේවල්...."

"Ohh... no.... no.... dear.... I like it... "

"Really?....."

"Yeah.... මට ඒක ගොඩක් දැනුන අංජලී.... මට තාම හිතාගන්න බෑ මට මොකද්ද උනේ කියල.... මට තාම හිතෙන්නේ මං අද දවල් හිටියේ හීනෙක කියල...."

"ඒක හීනයක් නෙවෙයි dear.... මට ඔයාට කියන්න තවත් දෙයක් තියනවා...."

"මොකද්ද?..."

"ඒක මෙහෙම කියන්න බෑ... මං ඒක ඔයාට කියන්නම්කෝ වෙන වෙලාවක...."

RAY PUBLISHING

sinhalaebooks.com



"හරි... ඔන්න කියනකන් මං බලන් ඉන්නවා...."

"හරි dear..... මං අනිවාරයෙන්ම කියනවා. මේ මං දැන් තියන්නම්. Good Night.... Bye...."

"Ok..... Good Night.... Bye...."

RAY PUBLISHING

sinhalaebooks.com



2000/05/19

ශාන් පිළිබඳව තීරණාත්මක දිනය උදාවිය. නමුත් ඒ පිළිබඳව කීමෙන් පසු ඇතිවන තත්වය කුමක් වේ දැයි සිතාගත නොහැකි නිසාවෙන් මා සවස් වනතුරුම ඒ සම්බන්දව ඔහු සමග කතා නොකිරීමට සිතාගත්තෙමි. මා පංති කාමරයට ඇතුල් වන විට ශාන් මා එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටින අයුරු දක්නට ලැබුණෙමි. මා එම මොහොතේම ඔහු ගාවට ගොස් සවස ගෙදර යාමට පෙර බෝජනාගාරදී මාව මුණගැහෙන ලෙස ඔහුට පවසා මා මාගේ ආසනය වෙත ගියෙමි.

කතිකාකරගත් පරිදි මා බෝජනගරයට ගොස් එහි එක් කොනක හිස්ව තිබූ මේසයක අසුනක වාඩි වී ශාන් එන තුරු බලා සිටියෙමි. වැඩි වෙලාවක් යන්නට මත්තෙන් ශාන් ද පැමිණි අතර ඔහුගේ මුහුණේ ප්‍රීතිය සහ තැතිගනීම යන හැඟීම් දෙකම සටහන් වී තිබුණි. නමුත් ඉතිරි විනාඩි කිහිපය තුල එම ප්‍රීතියට කුමක් සිදු වේ දැයි සිතන විට ශාන් ගැන ඇති වන්නේ සිතට ලොකු වේදනාවකි. නමුත් ශාන් කෙසේ හෝ මාව තේරුම් ගනීවි යැයි සිතමින් මා සිත සනසාගත්තෙමි.

ශාන් බෝජනාගාරයට ඇතුළු වී හිස ඒ මේ ඇත කරකවමින් මා සොයන්නට වූ අතර මා අත ඔසවා ඔහුට ආරාධනා කලෙමි. ඔහු මා අසලට පැමිණි පසු මාගේ අසුනට

sinhalaebooks.com



යාබද අසුන පෙන්වමින් ඔහුට අසුන් ගන්න ලෙස පැවසීය. පසුව මා කතාව ආරම්භ කලෙමි.

"ශාන් මට වැඩි වෙලා ගතකරන්න බෑ... මගේ යාළුව මං එනකන් බලන් ඉන්නවා...."

"හරි කමක් නෑ... ඉතින් කියන්නකෝ ඔයාගේ තීරණය මොකද්ද කියල...."

දිග සුසුමක් හෙලූ මා නැවතත් කතාවට අවතීරණ විය.

"ශාන් මම මේ කියන දේ අහල ඔයා මං එක්ක තරහ වෙන එකක් නෑ කියාල මං හිතනව."

මා එසේ කියන විට ශාන් ගේ මුහුණ ක්‍රමයෙන් වෙනස් වන අයුරු මා හට හොඳින් දක්නට ලැබුණෙමි.

"ඔයා මට හොඳ යාලුවෙක් ශාන්... අනික ඔයා මට ගොඩක් උදවු කරලා තියනවා. ඉතින්..... මට ඒ යාළුකම නැති කරාන්න බෑ... මට ඔයා ගැන එහෙම හැගීමක් ඇතිවෙන්නේ නෑ.... මගේ හිතේ වෙන කෙනෙක් ඉන්නවා ශාන්... මං හිතනවා ඔයා මාව තේරුම් ගනී කියල..."

එසේ පවසා මා නිහඬව බිම බලාගත්තෙමි. මේතෙක් නිහඬව බිම බලාගෙන මා හට සවන්දීගෙන උන් ශාන් මද වෙලවකට පසු ඔහුගේ හඬ අවදිකරන්නට විය.

"ඇත්තටම ඔයා ගොඩක් හොඳ කෙනෙක් අංජලී.... මම ඔයත් එක්ක තරහ වෙන්නේ නෑ.... මට ඔයාව තේරුම් ගන්න පුළුවන්.... මං ඔයාගේ හිතේ වෙන කෙනක් ඉන්නවා කියල දන්නවා නම් ඔයාගෙන් මෙහෙම අහන්නෙත් නෑ... දැන් කමක් නෑ අපි මේක අමතක කරමු....."

RAY PUBLISHING

sinhalaebooks.com



"Thank you so much ශාන්.... ඇත්තටම ඔයා මාව තේරුම් ගත්ත එකට ගොඩක් සතුටුයි...."

"It's ok අංජලී.... ඒක නෙවෙයි.... මං තව දෙයක් අහන්නම්.... කැමති නම් විතරක් උත්තරයක් දෙන්නකෝ...."

"මොකද්ද?..."

"දැන් ඔයාගේ හිතේ ඉන්න කෙනා ඒ ගැන දන්නවද?...."

"තාම මං එයාට ඒ ගැන හරියටම කිව්වේ නෑ..... ඒත් මං දන්නවා එයා මට කැමතී කියල..... ශාන් ඒක නෙවෙයි... මම දැන් යන්න ඕනේ... මං ඔයාට Call එකක් ගන්නම් රෑට...."

"ආ හරි කමක් නෑ... ඔයා ගෙදර ගිහින් කතාකරන්නකෝ... හැබැයි කියන්න අකමැති නම් කියන්න එපා... මං මුකුත් හිතන්නේ නෑ..."

"නෑ නෑ එහෙම දෙයක් නෑ... මං රෑට කතා කරන්නම්කෝ... අම්මා බලන් ඇති මං එනකන්....."

"හරි අංජලී... Bye...."

"Bye ශාන්...."

ශාන් ගෙන් සමුගත් මා ඉක්මනින්ම අම්මා ගේ පංතිය අසලට ගියෙමි. මා එහි යනවිට ගේට්ටුව අසල බැංකුවක වාඩි වී සිටි ඇ මා එනු දැක ප්‍රීතියෙන් මා වෙත දුවගෙන එන්නට උනෙමි.

"I'm sorry darling..... හිතුවට වඩා ටිකක් පරක්කු උනා..."

RAY PUBLISHING

sinhalaebooks.com



"It's ok අංජලී..... ඒ තරම් පරක්කුවක් නෑ... Train එකට තව වෙලාව තියනවනේ..."

"එහෙනං දැන් අපි යමු නේද?... "

"හ්ම්ම්... යමු.... " අමා මගේ අතක පැටලෙමින් පවසන්නට වූ අතර මද දුරක් යන විට අමා මගෙන් මෙසේ අසන්නට විය.

"අංජලී.... ඔයා මට මොකද්ද කියනවා කිව්වා නේද? "

"හරි හරි මං ඒක ඉකමනින් කියන්නම්කෝ... "

"මට ඒක දැනගන්නකන් ඉවසිල්ලක් නෑ...."

මෙසේ සතුටුසාමිචියේ යෙදෙමින් අපි දුම්රියපලට පැමිණියෙමු. වෙනදාටත් වඩා ප්‍රමාද වී පැමිණි හෙයින් වැඩි වෙලාවක් යන්නට පෙර අපගේ දුම්රිය වේදිකාව වෙත පැමිණියහ.

මා නිවසට පැමිණි වහාම ඇඳුම් මාරු කර පිරිසිදුවී ශාන් හට දුරකථන ඇමතුමක් දුන්නෙමි. ඒ අම්ම පැමිණීමට පෙර මෙම කතාව නිමාකල යුතු නිසා වෙනි.

"Hello..... අංජලී"

"Hello.....ශාන් ඔයා ගෙදර ගියාද?..."

"ඔව් අංජලී කියන්න...."

"ඔයා මාත් එක්ක තරහ නෑ කිව්වේ ඇත්තටම නේද?..."

"අයියෝ නෑ අංජලී.... මං තරහ නෑ..... "

RAY PUBLISHING

sinhalaebooks.com



"ඇත්තටම Thanks lot dear.... ඔයා මාව තේරුම් ගත්ත එකට.... මේ මං අර මගේ හිතේ ඉන්න කෙනා ගැන මං ඔයාට කියන්නම්..... හැබැයි මේක අපේ Class එකේ කිසිම කෙනක් දැනගන්න බෑ හරිද?..."

"හරි හරි ඔයා දන්නවනේ ඉතින් මං ගැන..."

"හ්ම්ම්.... ඔව්.... ඔව්..... ඒක නෙවෙයි ඔයා මේක දැනගත්තට පස්සේ මං ගැන මොනවා හිතයි ද දන්නේ නෑ..."

"මොනවා හිතන්න හරි කියපන්කො ඉතින්...."

"ශාන්.... මගේ හිතේ ඉන්නේ අමා..."

"ඈ.... ඔය ඇත්තමද?.... "

"ඔව් ශාන්.... මට අමාව තරම් වෙන කිසිම කෙනෙක් දැනිල නෑ..... මං හිතනවා අමාටත් එහෙමයි කියල..... "

"මට නම් හිතාගන්න බෑ අංජලී.... "

"මේක වෙනස්ම හැඟීමක් තමයි.... ඒත්..."

"අංජලී..... උඹල දෙන්නට දෙන්න ආදරෙයි නම් සමාජේ ගැන හිතන්න එපා..... තමන්ගේ සතුට තියෙන්නේ එතනම් අනික් අයගෙන් වැඩක් නෑනේ.... "

"ඒක නම් ඇත්ත..... "

"අනික උඹල දෙන්න කිසි දෙකට බයවෙන්න එපා... ඕන දේකට මම ඉන්නවා...."

"අනේ Thank you so mush ශාන්.... ඒ වචනෙම ඇති.... කවදාවත් අමතක වෙන්නේ නෑ..."

RAY PUBLISHING

sinhalaebooks.com



"It's Ok... අංජලී.... මම එහෙනම් මං තියන්නනම්.... මොනවා හරි තිබ්බොත් ඕන වෙලාවක කියපන්..."

"හරි ශාන් Bye.... "

" Bye...."

ශාන් මා සිතුවාටත් වඩා මේ මොහොතේ මාව තේරුම් ගැනීම සහ ඔහු මා සමග සිටීම මට ලොකු සතුටක් සේම විශාල ශක්තියක් විය. මීළඟට මගේ සිහියට නැගෙන්නට වූ කරුණය නම් මා අමාට ආදරය කරන බව ඇයට කෙලින්ම කියන්නේ කෙසේද යන්නයි. ඇය කිසි දිනෙක මාව ප්‍රතික්ෂේප නොකරන බවට මගේ සිතේ දැඩි විශ්වාශයක් තිබුනත් අපගේ මිත්‍රත්වයට සුළු හෝ පලුදුවීමක් ඇති වේ දැයි මගේ සිතේ කුඩා බියක් ද ඇති වී තිබුණි. නමුත් තවදුරටත් මා හට මේ ආදරය සිරකරගෙන සිටිය නොහැකි නිසාවෙන් මා එය ඇයට ලිපියකින් දැනුවත් කිරීමට සිතාගත්තෙමි. මේ සිතමින් සිටින අතර වාරයේ අමා ගෙන් දුරකථන ඇමතුමක් පැමිණෙන්නට විය.

"Hello....."

" Hello අංජලී....."

"කියන්න Dear....."

"ඔයාට මාව හෙට Meet වෙන්න පුලුවන්ද....?"

"ඔව් පුළුවන්.... විශේෂයක්ද....?"

"නැහැ එහෙම විශේෂයක් නෑ.... මට ඔයත් එක්ක ඉන්න ඕනේ කියලා හිතුණා...."

RAY PUBLISHING

sinhalaebooks.com



"ඇත්තමද....?"

"ඔව් ඔව්...."

"හ්ම්... හරි මං කීයටද එන්න ඕනෙ?....."

"දවල්ට එන්න....හෙටත් දවසම අම්මයි නැන්දයි නැහැ...."

"හෙටත් ඔයාගේ අතින් උයපු කෑම වේලක් කන්න පුලුවන්ද?...."

"අනේ.... හෙට නම් අම්මලා උයලා යන්නේ Dear...."

"It's ok darling.... මම නිකන් ඇහුවේ.... මං දවල්ට එන්නම්කෝ...."

"හරි එහෙනම් ඔන්න මං බලන් ඉන්නවා...."

"හරි.... Good night... bye...."

"Good night... bye.... අංජලී.... "

දුරකථනය විසන්ධි කල මා නැවතත් කල්පනා ලෝකයට වැටුනෙමි. මාගේ හිතේ ඇය ගැන ඇති හැඟීම කියන්න හොඳම දවස හෙට යැයි මට සිතුණි. මද වෙලාවක් කල්පනා කරමින් සිටි මා කොලයක් හා පෑනක් අතට ගෙන ඇයට ලිපියක් ලිවීමට සුදානම් වුනෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



## 2000/05/20

මා අපේ නිවසේ ඉහත මාලයේ කොනකට වී අංජලී පැමිණෙන තුරු බලා සිටියෙමි. ඇය මට නෑසෙන පරිදි මාගේ පිටුපසට ඇවිත් මගේ උරහිසට තට්ටු කරන්නට විය. මා තිගැස්සී ඇය වෙත හැරුණු අතර ඇය මා දිහා බලමින් සිනාසෙන්නට විය.

"බය වුනා නේද ආ...?"

"හොරා වගේ පස්සෙන් ඇවිත් තට්ටු කලාම බය වෙන්නේ නැද්ද?...."

"හ්ම්.... මේ ඇත්තටම ඇයි බය වෙන්නේ....?" අංජලී සිනාසෙමින් අසන්නට විය.

"අනේ මන්දා.... ඒ වෙලාවට එකපාරටම එහෙම වෙනවනේ...."මා ද සිනාසෙමින් ඇයට පැවසිය.

"හ්ම්... ඒකත් එහෙමද... ආ මෙන්න ඔයාට පොතක්...." අංජලි එසේ කියමින් ඇයගේ බෑගයෙන් නවකතා පොතක් ගෙන මා වෙත දික්කරන්නට විය.

"මේ මොකක්ද...?"

"මේක ලස්සන Love story එකක්... කියවලා බලන්නකෝ...."

RAY PUBLISHING

sinhalaebooks.com



*සත්‍ය ආදරය*

මා එහි පිටකවරය පෙරලූ විට "To My Lovely Anjali" යනුවෙන් ලියා එති අයුරු දක්නට ලැබුනෙමි. එය දුටු විගස මා පොත දිහා බලාගෙනම සිනහවක් පෑවෙමි. ඇය ද බිම බලාගෙන ලැජ්ජවෙන් සිනාසෙන්නට විය. මේ අතර අපේ යාබද නිවසේ මාමා අපේ උඩු මහලේ අවුරශ්මිය වැඩි නිසාවෙන් එහි වැල මත වන තිබූ රෙදි කිහිපයක් එකතු කරගෙන යාමට පැමිණියහ. රෙදි එකතු කරන අතරවාරයේ ඔහු අප දෙදෙනාට මෙසේ පවසන්නට විය.

"ආ.. අමා... ඔයාලා දෙන්නා කොයි වෙලෙත් එකටම නේද ඉන්නේ?..."

"ආ... ඔව් මේ මගේ හොඳම යාලුවා..."

"හ්ම්...හොඳයි හොඳයි......"

"ඒක නෙවෙයි මම ඊයේ Class යනකොට මාමා Station එකේ ඉඳලා එනවා දැක්කා..."

"ආ.. ඔව් දුව මම ගියා නැන්දව Station එකට දාන්න. එය ඊයේ කොළඹ ගියානේ...."

මේ අතරේ අංජලී මගේ පිටුපසින් අත දමා මාමාට නොපෙනන පරිදි මාගේ අතක ඇඟිලි ස්පර්ශ කරන්නට විය. මා පෙර දා සේම තිගැස්සී යන්නට වූ අතර මා දැඩි වෙහෙසක් දරමින් සිතට එන හැඟීම් පාලනය කරගත්තෙමි.

"ඇයි මාමා හදිස්සියේම..." මා එසේ අසනවත් සමගම අංජලී මගේ කනට ලංවී "මේ අංකල් යන්නේ නැද්ද අනේ...." යනුවෙන් අසන්නට විය. එක වරම මට සිනහවක් නැගෙන්නට ආ මුත් මා එය සඟවා සිටියෙමි.

"නැන්ද බෙහෙත් ගන්න ගියා... අද Clinic දවසනේ...."

RAY PUBLISHING

sinhalaebooks.com



මාමා එසේ පිළිතුරු දීමෙන් පසු මා නැවත මාමා සමග කතාකිරීමට සැරසෙද්දීම අංජලී මගේ අතේ ඇඟිල්ලක් නියපොත්තෙන් තද කරන්නට විය. එකවරම කැගසුනු නිසාවෙන් මාමා මා දිහා බලන්නට වූ අතර මා මුව තදකරගෙන සිටියෙමි.

"දුව මොකක් හරි ප්‍රශ්නයක් ද?...." මාමා එසේ අසද්දී අංජලී ද සිනාසෙමින් මෙසේ අසන්නට විය.

"ඔව් අමා... මොකද්ද ප්‍රශ්නේ ආ?..."

"ආ නෑ නෑ මුකුත් නෑ අංකල්" මා අංජලී ගේ කකුල පාගමින් පැවසුවෙමි.

"මම යන්නම් දුව...."

"හරි මාමා...." මාමා ගිය ක්ෂණයෙන් අංජලී මාගේ ඉදිරියට පැමිණෙන්නට විය.

"අම්මෝ අංකල් එක්කනම් දවසක්ම කතා කරන්න පුළුවන්...."

අංජලී එසේ කියන විට මා ඇගේ මුහුණ දෙස බලා හිඳ මෙතෙක් වෙලා හිතේ සිරකරගෙන සිටි හැඟීම් සමුදාය මුදාහරිමින් ඇයව වැලඳගත්තෙමි. අංජලී ද මාව තදින් වැළඳගෙන මාගේ හිස අතගාන්නට විය. අංජලී ගේ පපුවට තුරුළු වුනු විට දැනෙන ඒ උණුසුමට මුළු ලෝකයම අමතක වී යනු ඇත.

අපට නොදැනිම අහස අඳුරු වී ගොස් සීතල සුළං රැල්ලක් සමග වැහි බින්දු කිහිපයක් වත පුරා දැවටෙන්නට වූ හෙයින් අපි දෙදෙනාම විඳිමින් සිටි උණුසුමෙන් මිදෙන්නට උනෙමු. අංජලී මා හට දුන් පොත ද අතෙන් වැටි ඇති බව දැන

RAY PUBLISHING

sinhalaebooks.com



ගත්තේ ඒ මොහොතේය. පොතත් අරගෙන අපි දෙදෙනා වැස්සට පෙර ගෙදරට දිව ගියෙමු.

වර්ෂාව එන්න එන්නම දැඩි වූ හෙයින් මා අතින් පිළියෙළ කෙරුණු උණුසුම් තේ කෝප්පයක් රස විඳිමින් අපි සුහද පිළිසඳරක යෙදුනෙමු.

"අංජලී....."

"ම්ම්...."

"ඔයා ශාන්ට මොකද කිවුවේ..."

"ආ..... මට ඔයාට ඒ ගැන කියන්න බැරි උනානේ.... මම ශාන්ට කිව්වා මගේ හිතේ එයා ගැන එහෙම දෙයක් නැහැ කියලා..."

"ඉතින් ශාන් මොකද කිවුවේ?...."

"ඇත්තට ශාන් හරිම හොඳ කෙනෙක්.... එයා මාව තේරුම් ගත්තා අමා.... මට ඇත්තටම ඒක ලොකු සැනසීමක්.... මං හිතුවේ එයා මාත් එක්ක තරහා වෙයි කියලා....."

ඇය මීලඟට කුමක් කියාවි දැයි සිතමින් මා නිහඬව ඇයට සවන් දීගෙන සිටියෙමි. මේ මොහොත වන විට වර්ෂාව නැවතත් ටිකෙන් ටික පහව යමින් තිබුණි.

"අමා.... වැස්ස පායාගෙන එනවා මම යන්නද?...."

"ඔයාට යන්නම ඕනේ නේද?..."

"ඇයි අනේ හෙට ආයෙත් Meet වෙනවානේ...."

"කොච්චර හිටියත් මදි මට..."

RAY PUBLISHING

sinhalaebooks.com



මා හුරතල් වෙමින් ඇයට පවසන්නට වූ අතරවාරයේ ඇය විසින් ඇගේ බෑගයෙන් ගත් කුඩාවට නවන ලද කොලයක් මා අත තැබීය.

"අම්මා මේක හෙමින් සැරේ කියවන්නකෝ..."

"මොකක්ද මේ අංජලී?...."

"අර මං ඔයාට කියන්නම් කිවුවේ... ඒක...."

ඇය එසේ පවසද්දී මා අතේ තැබූ කොලය දිග හැර බැලීමට සැරසුණි..

"Please අම්මා... දැන් බලන්න එපා... මං ගිහාම බලන්න හරිද... මං එහෙනම් යන්නම්..."

"හරි අංජලී.... Bye...." ඇයට තව මොහොතක් රැඳෙන්නට පවසන්නැයි සිත කීවත් ඇය මා අතේ තැබූ ලිපිය කියවීමට තිබූ දැඩි ආශාව නිසා මා ඇයට යාමට අවසර දුන්නෙමි...

"Bye Dear...."

නිවසින් පිටව ගිය අංජලී මාර්ගයේ නොපෙනී යන තෙක්ම බලා සිටි මා නැවතත් හනිකට මාගේ කාමරය වෙත පැමිණ සයනයේ වැතිරී අංජලී දුන් ලිපිය කියවන්නට පටන්ගත්තෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



සත්‍ය ආදරය

2000/05/19

ආදරණීය අමා,

මේ ලිපිය කියවීමෙන් පසු අපි දෙදෙනාගේ මිත්‍රත්වයේ බැඳීමට කිසිඳු හානියක් ඇති නොවේවා යයි මා පතමි. මක්නිසාදයත් මේ ලිපිය නිසා ඔයාගේ සිත දුකට පත් වුවහොත් එයා මා හට දරාගත නොහැකි වේදනාවක් නිසාවෙනි.

මීට මාස තුනකට පෙර අපි මල් උද්‍යානයේ දී මුණගැසුණු මොහොතේ සිටම මගේ ජීවිතයට අමුතු වෙනසක් සිදුවිය. දිනෙන් දින වැඩි වූ අපේ ලෙන්ගතුකම හැම මොහොතකම මගේ හිතේ ඔයා සැරිසරන්නට තරම් ශක්තිමත් විය. ඔබ හමු වූ දින සිට මගේ සිත තුල ඇති වූ ප්‍රීතිජනක හැඟීම මට වචනයෙන් විස්තර කිරීමට නොහැකි තරම් සුන්දරය. එදින සිට මගේ ජීවිතේ ඔයා නිසා ගොඩක් සුන්දර විය. එය ඔබටත් එසේම යයි මා විශ්වාස කරමි. මක්නිසදයත් මා නිසා ඔබ සැබවින්ම ප්‍රීතිතිමත්ව ජීවිතය ගතකරන බව ඔබේ මුවින්ම පවසා ඇති නිසාවෙනි. තවද මා ඔබේ අහිංසක කම බෙහෙවින්ම ඇලුම් කරන කරුණකි. එපමණක් නොව ඔයා මා ලඟින් සිටිනා විට මගේ ජීවිතයේ සියල්ල සම්පූර්ණ වී ඇති බවක් මට හැඟෙයි. අමා.... මගේ හිතේ ඔයා ගැන ඇති හැඟීම කෙටියෙන්ම කිවහොත් මම ඔයාට ගොඩක් ආදරේ කරමි.

*I Love you so much my lovely angel Ama.....*

ඔබේ ආදරණීය මිතුරිය
*Anjali*

RAY PUBLISHING

sinhalaebooks.com



මෙය කියනවන විට මගේ සිතේ ඇතිවූ ප්‍රීතිය කෙතරම් දැයි මට වචනයෙන් කියාගත නොහැකිය. මා හට මෙතෙක් කල් අංජලී ට කියා ගත නොහැකි වූ ඒ ආදරණීය හැඟීම මේ මොහොතේ ඇය විසින්ම මා හට ප්‍රකාශ කර ඇත. ලිපිය මගේ පපුවට තදකරගත් මා දෙනෙත් පියාගෙන ඇගේ උණුසුම සිහිකරගෙන විඳින්නට උනෙමි.

පසු දින උදෑසන මා ඇයව දුටු මොහොතේ ඇය සමග කතා කිරීමට බොහෝ දේ තිබුනත් ඒ කිසිවක් කියාගත නොහැකිව ඇය ඉදිරියේ ගොළු වූ මා ලජ්ජාවෙන් සිනාසෙමින් බිම බලා ගත්තෙමි. ඇය ද එසේම ලැජ්ජාශීලී සිනාවක් පාමින් බිම බලාගන්නට විය. එදින දුම්රියේ දී ද අංජලී මා සමග කතා කිරීමට උත්සහ කලත් හිතේ තිබූ චකිතය නිසා වෙන් කෙටියෙන් පිළිතුරු දී සිටියෙමි. දහවල් ආහාර ගන්නා වෙලාවේ හෝ ඇය සමග ඇගේ ලිපිය ගැන කතා කිරීමට සිතුනත් අපේ මිතුරියන් දෙදෙනා අපි සමග සිටි නිසාවෙන් ඒ මොහොතේ ද කිසිවක් කියාගත නොහැකි විය. සවස ගෙදර යන විට නම් කෙසේ හෝ ඇය සමග ඒ පිළිබඳව කතාකරයුතු යැයි සිතාගත්තෙමි. අංජලී ගේ උපන්දිනය ද තව දින කිහිපයකින් පැමිණෙන බව මට ඒ මොහොතේම සිහිඋනෙමි. ඒ ගැන කතා කරමින් ඇය සමග කතාවට අවතීරණ විය හැකි යැයි මට සිතුනි.

RAY PUBLISHING

sinhalaebooks.com



RAY PUBLISHING

*2000/05/21*

පෙර දින අමාගෙන් සමුගත් මොහොතේ සිටම සිත තුල වදදෙන්නට වූ කාරණාව නම් මාගේ යෝජනාව පිළිබඳව ඇය කුමන ප්‍රතිචාරයක් දක්වාවිද යන්නයි. මා රාත්‍රියේ සිටම කොයි මොහොතේ හෝ ඇය මා සමග ඒ පිළිබඳව කතා කරාවී යන්න බලාපොරොත්තුවෙන් සිටියෙමි. නමුත් අද උදැසන හමුවූ මොහොතේ සහ දහවල් ආහාර ගැනීමේ වෙලාවේ හමුවූ මොහොතේත් ඇය ඒ පිළිබඳව කිසිවක් නොකියා සිටීම නිසා මාගේ සිතට දැඩි කම්පා ඇති වන්නට විය. ඇගේ මුහුණේ කිසිඳු ශෝකජනක ස්වරූපයක් නොතිබුනත් සිත යටින් ඇය මේ පිළිබඳව දුක්වනවා දැයි මට සිතෙන්නට විය. නමුත් ඒ පිළිබඳව කිසිවක් නොකියා සිටින්නේ ඇයි දැයි යන්න සිත තුල ඇත්තේ ප්‍රශ්නාර්ථයකි.

සවස හෝ ඇය මාගේ ලිපිය පිළිබඳව යම් අදහසක් ඉදිරිපත් කරාවී යන බලාපොරොත්තුවෙන් මා ඇයගේ පංතිය අසලට ගියෙමි. අමා සිනහාමුසු මුහුණෙන් මා වෙත දුවගෙන ඇවිත් මගේ අතේ පැටලෙන්නට විය. මේ මොහොතේ ඇය

sinhalaebooks.com



ඇගේ අදහස පවසාවි යන්න මා බලාපොරොත්තු වුනෙමි. නමුත් එය එසේ නොවීය.

"අංජලී..... ඔයාගෙන් අහන්නමයි හිටියේ..."

"මොකක්ද?...."

"ඔයාගේ උපන්දිනේ මේ ඉරිදා නේද?..."

"හ්ම්..."

"ඉතින් මොනවද ඕනේ?..."

ඇගේ මේ ප්‍රශ්නය මාගේ බලාපොරොත්තුව සුනුවිසුනු කරන්නට වූ හෙයින් මාගේ හිතේ දැඩි වේදනාවක් සහ තරහක් ඇති විය.

"මට මුකුත් ඕන නැහැ... මං කැමති නැහැ ඔය ගැන මගෙන් අහනවට...."

මා ඇගේ අත ගසා දමා ඉදිරියට ඇවිද ගියෙමි. අමා නැවතත් මාගේ පසුපසින් දුවගෙන ඇවිත් මාගේ අතකින් අල්ලා මාව නවත්තන්නට විය. මා නැවතත් ඇගේ අත ගසා දැමුවේ සිතේ ඇති වේදනාවටය.

"Please Dear...... කියන්නකෝ මොනවද ඔයාට ඕනේ?..."

"අමා... ඇයි ඔයා මං දුන්න ලියුම ගැන මුකුත් කියන්නේ නැත්තේ?..."

"ආ.... ඒකයි මේ එහෙනම් අද අමුතු විදියට හැසිරෙන්නේ..."

"ඔව් මං දැන් අමුතුයි තමයි."

RAY PUBLISHING

sinhalaebooks.com



මා එසේ පවසමින් නැවතත් ඉදිරියට ඇවිද ගිය අතර අමා නැවතත් මා පසුපසින් දුවගෙන ඇවිත් මාගේ අතින් අල්ලා නවත්තන්නට විය.

"ඔයා අද මාව දාලා යනවද?..."

ඇය එසේ ඇසූ විට මා කිසිවක් නොකියා සිටියෙමි. මේ මොහොතේ මගේ හිතේ ඇති වේදනාවට මා ඇයට කිසිවක් නොකියාම සිටීමට සිතුවත් ඇගේ කතාබහ මාගේ සිත වෙනස් කරන්නට විය.

"Don't worry dear.... ඔයාගේ යෝජනාව ගැන මාගේ හිතේ කිසිම තරහක් නෑ..."

"ඒත් අමා මට ඔයාව නැතිකරගන්න බැහැ..."

"එහෙම වෙන්නේ නෑ අංජලී.... මාව විශ්වාස කරන්න...."

"ඒත්....."

ඇය මාගේ දෙනෙත් වෙතට අවිහිංසක බැල්මක් පාමින් මාගේ දෑතින් අල්ලාගත් හෙයින් මට කිසිවක් කියාගත නොහැකිව මුව ගොළුවී ගියේය. ඒ අවිහිංසක මුහුණ මගේ සිතේ ඇති බලාපොරොත්තු නැවතත් පලගන්වන්නට සමත් විය.

"අංජලී... ඔයාගේ උපන්දිනේට ලස්සන Gift එකක් ලැබේවි...."

ඇගේ සුපුරුදු ලැජ්ජාශීලී සිනහව පාමින් මා හට පැවසීය. එයින් පසු මා ඇයත් සමග ඒ පිළිබඳව කතානොකර සාමාන්‍ය පරිදි විහිලුතහළු කරමින් සිටීමට වගබලාගත්තෙමි.

sinhalaebooks.com



*2000/05/25*

**අමාගෙන්** සුභපැතුම් පණිවිඩයක් ලැබේවි යන බලාපොරොත්තුවෙන් පෙරදින මධ්‍යම රාත්‍රිය වන තුරුම මා නිදිවරාගෙන සිටියෙමි. නමුත් එම බලාපොරොත්තුව ඉටු නොවුනු නිසා තවත් ශෝකාන්විතව නින්දට ගියෙමි. අද ඉරිදා දිනයක් වූ හෙයින් අම්මා ඇවිත් මා අවදි කරන්නට විය.

"දුව... දුව... නැගිටින්න...." මා හෙමිහිට දෙනෙත් විවර කලෙමි.

"ඉක්මනට වොෂ් එකක් දාගෙන එන්නකෝ... තාත්ති ඔයා එනකල් බලන් ඉන්නවා...."

"ඒ මොකටද?...."මා නිදිමතින්ම ඇසුවෙමි.

"ඒ මොකටද බලන්න ඉක්මනටම එන්නකෝ...."

"නිදිමත වැඩි නිසා මා නැවතත් දෙනෙත් පියා ගන්නට උත්සහ කලත් අම්මා එයට ඉඩ නොදෙන්නට විය.

"කෝ ඉතින්.... කිවුවම අහලා නැගිටින්නකෝ යන්න ඉක්මනට වොෂ් එකක් දාගෙන එන්න..."

අම්මාගේ පෙරත්ත කිරීම මත මා හෙමිහිට ඇඳෙන් බැස නාන කාමරයට ගොස් පිරිසිදු වී සාලයට පැමිණියෙමි. එකවරම මා දුටු දර්ශනය මා පුදුමයට පත් කලෙමි. මාගේ ජීවිතේ කිසිම දිනෙක මෙවන් සිදුවීමක් සිදු වී නැත. අමාගේ මිතුරියන් දෙදෙනා වන නිරාශා සහ ලක්ෂි සමග ශාන් සාලයේ සොපාවේ වාඩි වී

RAY PUBLISHING

sinhalaebooks.com



සිටියහ. සෝපාව ඉදිරියේ ඇති මේසය මත උපන්දින කේක් එකක් සමග තවත් සැරසිලි එක්කර තිබුණි. අම්මා සහ තාත්තා ද සොපවට යාබද අසුන්වල මා එනතුරු බලා සිටියහ. නමුත් මෙතන අමා නැතිවීම ගැන සිතට ශෝකයක් ද ගෙන එන්නට විය. මා පුදුමයෙන් මෙන් වටපිට බලමින් ඔවුන් දෙසට ගියෙමි. මා එනු දුටු සියල්ලෝම නැගිට මා හට සුභපතන්නට පටන් ගත්තාය. මාගේ සිත ඒ මොහොතේ ප්‍රීතියෙන් ඉතිර ගිය මුත් අමා නැති අඩුව සිතට තදින්ම දැනෙන්නට විය. නමුත් මා එය සඟවා සිනාසුනෙමි. සුභපතා කේක් කැමෙන් පසු අම්මා සහ තාත්තා එතනින් ඉවත්ව ගියහ. මොවුන් මාගේ නිවස කෙසේ සොයා ගත්තා දැයි සිතේ ඇති කුතුහලය නිසාවෙන් මා මෙසේ ඇසුවෙමි.

"ඔයාලා කොහොමද අපේ ගේ හොයාගත්තේ?..."

"ඒක රහසක්...." නිරාශා පැවසිය.

"එතකොට ශාන් ඔයා කොහොමද මෙයාලට සෙට් වුනේ?...."

"ඒකත් රහසක් නේද ශාන්?...." නිරාශා පැවසිය.

"අමාගෙන්ද දැනගත්තේ?..."

"අපි කිවුවනේ ඒක රහසක්.... ඒක නෙවෙයි අමා කතා කලේ නැද්ද?... ලක්ෂ්මි විසින් විමසීය.

"නෑ... අනේ... එයා තාම කතා කලේ නෑ... මං හිතුවා එයා රෑම කතා කරයි කියලා....." කණගාටුවෙන් යුතුව මා එසේ පවසද්දීම දුරකථනය නාද විය. ඇමතුම අමාගෙනි.

"Hello "

"Happy Birthday My Sweet Heart.... "

RAY PUBLISHING

sinhalaebooks.com



"Thanks Darling...."

"හා... හා... No Thanks ආ...."

"Oh... Sorry... "

"ඒක නෙවෙයි අංජලී.... යාලුවෝ උදේම ආවා නේද ඔයාගේ උපන්දිනේ සමරන්න ආ..."

"ඔයා කොහොමද ඒක දන්නේ.... ඒ කියන්නේ... ඔයා තමයි මෙයාලට අපේ ගේ කොහෙද කියලා කියලා තියෙන්නේ...."

"හරි හරි ඒක නෙවෙයි... එන්නකෝ අපේ ගෙදර...."

"දැන්.... මේ කට්ටියත් ඉන්නවනේ....."

"Please..."

"හරි Dear මං එන්න බලන්නම්..." එසේ කියමින් මා දුරකථනය විසන්ධි කරන්නට කලෙමි.

"කවුද අංජලී... අම්මා ද?..." ශාන් අසන්නට විය.

"හ්ම්... හ්ම්... මේ ඒක නෙවෙයි මං පොඩි වෙලාවකට එයාව Meet වෙලා එන්නද?...."

"හරි... හරි.... ගිහින් එන්න.... ගිහින් එන්න.... ලක්ෂි සිනාසෙමින් පවසන්නට වූ අතර අනිත් දෙදෙනා ද සිනහවක් පාන්නට විය.

"එහෙනම් මං ගිහින් ඉක්මනට එන්නම්... අම්මා ඇහුවොත් මං අමාගේ ගෙදරට ගිහින් එන්න ගියා කියන්න..."

RAY PUBLISHING

sinhalaebooks.com



"ආ... හරි... හරි.... කලබලයක් නෑ ගිහින් එන්න... අපි කොහොමත් ඔයා එනකල් ඉන්නවා...." නිරාශා පැවසීය.

අපේ නිවසින් පිටත් වූ මා අමාගේ නිවසට යන විට ඇගේ නිවසේ ඉදිරි දොර වසා තිබුන අතර දොරේ අගුල ලග රිබන් පටියකින් ඔතන ලද කොලයක් රඳවා තිබුණි. මා එය දිග හැර බැලුවෙමි.

"Happy Birth Day My Sweet Heart.... Please Come To our up stair"

විවිධ අයුරින් සැරසිලි කර තිබූ එම කොලයේ එසේ ලියා තිබුණි. මා එයත් රැගෙන අමාගේ නිවසේ ඉහත මාලයට යන විට ඇය මා එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටිනු දුටුවෙමි. සැබවින්ම ඇගේ දෙනෙත් ආදරයෙන් බර වී තිබුණි.

"happy Birthday my sweet Heart"

ඇගේ මේ කතා විලාසය ද මට විශේෂත්වයක් පෙනෙන්නට විය. මා ඇය අසලට ගිය විට ප්‍රථමයෙන්ම කුඩා බෑගයට බහාලු සුභපැතුම් කාඩ්පත් දෙකක් මා අතේ තැබුවහ.

"කාඩ් දෙකක්?..."

මා එසේ කියනවිට ඇය ලස්සනට සරසන ලද තවත් කුඩා පෙට්ටියක් මා අතේ තැබුවහ.

"මං කඩලා බලන්නද අමා?..."

"මෙතන එපා... ගෙදර ගිහින්ම බලන්න..."

මා ඇගේ තෑගි දෙස බලා සිටින අතර ඇ එසේ කියමින් මාගේ මුවට හාදුවක් දී ලැජ්ජවෙන් බිම බලාගන්නට විය.

RAY PUBLISHING

sinhalaebooks.com



"It is My Special Gift..."

"Really?..."

කිසිවක් සිතා ගත නොහැකි වූ මාගේ සිත ප්‍රීතියෙන් ඉතිර යන්නට විය. මා සිතූ පරිදි මගේ ජීවිතේට අමතකම නොවන උපන්දිනය මේ උපන්දිනය උනෙමි.

මද වෙලාවක් දෙදෙනාම ලැජ්ජවෙන් සිනාසෙමින් බිම බලාගෙන ඉන්නට වූ අතර අමාගේ හුස්ම ගන්නා වේගයද වැඩි වී තිබුණි. එක්වරම මගේ අතින් ඇදගත් අමා මාව තදින් වැලඳගන්නට විය.

"I Love you so much අංජලී"

"I Love You Too Darling"

එසේ කියමින් අපි දෙදෙනාම මොහොතක් ආදරණීය උණුසුම විඳගත්තෙමු. එසේ සිටින අතරවාරයේ අමා විසින් මෙසේ පවසන්නට විය.

"අංජලී..."

"මම...."

"ඇත්තටම මටත් ඔයාට කියාගන්න බැරුව හිටපු දෙයක් තමයි මේක...."

"මට ඒක දැනුනා Dear...."

"අපි දෙන්නට හැමදාම මෙහෙම එකට ඉන්න පුළුවන් වෙයි නේද?...."

RAY PUBLISHING

sinhalaebooks.com



"අනිවාර්යෙන්ම.... මට නම් කවමදාකවත් ඔයා නැතුව ඉන්න බැරි වෙයි....."

"මටත් එහෙම තමයි අංජලී..."

මෙසේ අමා ව තුරුළු කරන් සිටින අතර වාරයේ අපේ මිතුරන් සිහියට නැගෙන්නට වූ හෙයින් මා අමාට මෙසේ පැවසුවෙමි.

"අමා... කට්ටිය ගෙදර බලන් ඉන්නවා...."

"ඔව්.... ඔව්... මන් දන්නවා...." මගේ තුරුලෙන් මිදුණු ඈ සිනාසෙමින් පවසන්නට විය.

"ඒ කියන්නේ ඔයා නේද මේ වැඩේ කලේ..."

"හුම්ම්.... ඔව්... මං තමයි...."

"අහිංසකී වගේ හිටියට මෙයාගේ වැඩ...."

"හරි හරි දැන් අපි යමු ඔයාල ගේ ගෙදර..... මං යන ගමන් විස්තරේ කියන්නම්...."

"ඔය ඇත්තමද?...."

"ඔව් ඔව්.... අපි දැන් යමු..."

ඇය මා සමග මේ මොහොතේ මගේ නිවසට යාමට පැමිණීම ගැන මා හට ඇත්තේ ඉමහත් ප්‍රීතියකි. අමා ගේ නිවසින් පිට වූ අපි දෙදෙනා වෙනදාටත් වඩා ප්‍රීතියෙන් සිනාසෙමින් මගේ නිවාස වෙත ගියෙමු. අපි සවස් වන තුරුම විවිධ දේ ගැන කතාකරමින් ප්‍රීති උනෙමු.

සවස මිතුරු මිතුරියන් සියල්ලෝම ගෙදරින් පිටවූ පසු අමා පමණක් නිවසේ ඉතිරි විය. ඇගේ නැන්දා සහ මව ද ආපසු

RAY PUBLISHING

sinhalaebooks.com



නිවස බලා පැමිණෙන වෙලාව ළං වුනු හෙයින් මා ඇයව ද නිවසට ඇරලුවෙමි. මා නැවත පෙරලා නිවසට පැමිණියේ අමා දුන් තෑග්ග සහ සුභපැතුම් පත් බැලීමට නොඉවසිල්ලෙනි. නිවසට පැමිණි වහාම සයනයට ගොඩ වූ මා ප්‍රථමයෙන්ම සුභපැතුම් පත් දෙක දිගහැර බලන්නට විය. එහි එක් සුභපැතුම් පතක් මාගේ උපන්දිනය වෙනුවෙන් සුබ පැතීමට දී ඇති අතර අනිත් කාඩ්පත ඇගේ ආදරය ප්‍රකාශ කර තිබුණි. මීළඟට මාගේ සිත යොමු වූයේ ඇ දී තිබූ කුඩා ත්‍යාගයටය. මා එය විවර කර බැලුවෙමි. විදුරු වලින් නිපදවන ලද එය හංසයන් දෙදෙනෙක් ආදරයෙන් වෙලී සිටින ප්‍රතිමාවකි. සැබවින්ම මා එයට බෙහෙවින් ප්‍රිය කලෙමි.

මෙසේ සිතමින් සිටින අතරවාරයේ මා හට අමා සමග කතා කිරීමට සිතේ ආශාවක් ඇති උනෙමි. දුරකථනය අතට ගත් මා ඇයට ඇමතුමක් ගත්තෙමි. නමුත් ඇය ඇමතුම විසන්ධි කරන්නට වූ අතර සුළු මොහොතකට පසු අම්මා සහ නැන්දා ළඟ ඇති නිසා කතා කල නොහැකි බව දන්වමින් කෙටි පණිවිඩයක් ලැබෙන්නට විය. නමුත් ඇය පාන්දර 1ට පමණ මා හට ඇමතුමක් ලබා දෙන්නට විය.

"hello අමා..."

"කතා කරන්න පුළුවන් නේද අංජලී?..."

"පුළුවන් Darling කියන්න..."

"අනේ.... රෑ අම්මයි නැන්දයි එක්ක කතාවක හිටියේ...."

"ඒකට කමක් නෑ අපි දැන් කතා කරමු"

"මගේ හිතේ තියන සතුටට මට කියන්න වචන නෑ අංජලී"

sinhalaebooks.com



"මටත් එහෙම තමයි පැටියෝ...."

"ඇත්තටම මගේ හිතේත් ඔයා ගැන ආදරයක් ඇති වුනේ අපි එදා පාර්ක් එකේදී මුණගැහිච්ච දවස් වලම... මට එහෙම වුනේ ඇයි කියලා හිතාගන්න බෑ අනේ.... ඔයාට වගේම ඔයා මගේ ළඟ ඉන්නකොට මට ජීවිතේ ලොකු සැහැල්ලුවක් දැනෙනවා ඔයා මගේ ලඟින් ඉන්න හැම මොහොතකටම මං හරි ආසයි...."

"ඔයාගේ හිතේ මං ගැන එතරම් ආදරයක් තිබුනාද පැටියෝ...."

"ඔව්... මට ඒක කියාගන්න බැරුව හිටියේ.... ඔයාට වගේම මටත් ඔයාව නැති වෙයි කියලා බය හිතුණා.... මේ ඒක නෙවෙයි... මං විතරනේ කතා කරන්නේ ආ?...."

"මං හරිම ආසයි... ඔයා කතා කරන කොට අහගෙන ඉන්න...."

"එහෙම බෑනේ ඔයත් මොනාහරි කියන්න...."

"හ්ම්... දන්නවද දැන් වේලාව කීයද කියලා?...."

"ඉතින් දැන් තියමු කියලද කියන්නේ?...."

"දෙකත් පහුවෙලා.... හෙට Class එකේදී දෙන්නටම නිදාගන්න වෙන්නේ..."

"හරි එහෙනම් නිදාගමු.... Good night my Sweethaeart.... "

"Good night පැටියෝ....."

"ආ... මේ... මේ... I love you...."

"Ohh... I love you too darling..."

RAY PUBLISHING

sinhalaebooks.com



අංජලී ගේ උපන් දිනය දවසින් පටන් ගත් අපේ ආදර කතාව නිසා අපි දෙදෙනාගේම ජීවිත දිනෙන් දින ඉතා සුන්දර වුනෙමු. අංජලි මා හට කෙතරම් ආදරෙයි ද කිවහොත් මගේ දෙනෙතින් පුංචි හෝ කඳුලක් වැටෙනවාට ඇය කැමති නැත. මගේ අම්මා හැරුණුකොට ඇය තරම් මගේ ජීවිතය තේරුම් ගත් කෙනෙකු මෙතෙක් මා හට හමු වී නැත. මාගේ ජීවිතේ දුක සතුට දෙකේදීම ඇය මට විශාල ශක්තියක් විය. අවට ලෝකයටම රහසක් වූ මෙය අසම්මත පෙම් කතාවක් වූ නමුත් අපි ඒ තුළ ඇති ජීවිතයේ උපරිම රස වින්දෙමු. මාගේ අම්මා මා දැන් ගතකරන ප්‍රීතිමත් ජීවිතය ගැන දිනක් දෙකක් විමසා ඇත. ඒ මාගේ ජීවිතේ සැබෑ වෙනසක් ඇති බැව් ඇයටත් වැටහී ඇති නිසා වෙන් යැයි මා සිතමි. නමුත් ඒ සතුටට සැබෑ හේතුව ඇයට කීමට තරම් ශක්තියක් මාගේ හිතේ නොතිබුණි. නමුත් ඇය මාව තේරුම් ගනීවි යන විශ්වාසය මා තුල ඇත.

නැන්දා සහ අම්මා නැති බොහෝ දිනයන්හි අංජලී මගේ නිවසේ හෝ මම අංජලීගේ නිවසේ හෝ දවස ගෙවන්නෙමි. අපි දෙදෙනාට වැඩි ආරක්ෂාවක් ඇත්තේ අංජලිගේ ගෙදර නිසාවෙන් අපි බොහෝ දිනයන්හි ඇගේ ගෙදර මුණ ගැසීමට පුරුදු වී සිටියෙමු. එයින් ඇගේ උපන්දිනය යෙදී තිබු දිනයෙන් පසු මා තනිවම ඇගේ නිවසට ගිය පළමු දිනය ජීවිතයට කිසි දිනක අමතක නොවන ඉතා සුන්දර සහ ශෘංගාරාත්මක අත්දැකීම් වලින් පිරුණු දිනයක් උනෙමි.

sinhalaebooks.com



*2000/05/27*

ඇයි මාව ඇගේ කාමරය වෙත කැඳවාගෙන ගිය අතර අපි දෙදෙනා සයනයේ වාඩි උනෙමු. මා මාගේ අත ඇගේ අතක පටලවා ගනිමින් ඇගේ ලය මතට හිස තබා ගත්තෙමි. බොහෝ වේලාක් ඇගේ ලය මත උණුහුම විඳින්නට වූ අතර ඇය ද පෙම් බස් දොඩමින් මගේ හිස පිරිමදින්නට විය. විටෙක ඇය මාගේ නළල සහ දෙකම්මුල් සිපගන්නට විය. මා ද ඇයට රිසි පරිදි ඒ හැඟීම විඳින්නට ඉඩ හැරියෙමි. සුළු මොහොතක් යන විට ටික ටික ඇගේ හදගැස්ම වේගවත් වන්නට වූ අතර ඇගේ ගත තව තවත් උණුසුම් වන අයුරු මා හට දැණුනි. මේ සමගම මගේ සිත තුල ද ශෘංගාරාත්මක හැඟීම් උද්දීපනය වන්නට විය. මා හෙමිහිට ඇගේ ලය මතින් හිස ඉවතට ගෙන ඇගේ නළල මත මාගේ නළල තබා ඇගේ දෙනෙත් දිහා බලා සිටියෙමි. ඇය ද අනුරාගී දෙනෙතින් මා දිහා බලාසිටින්නට විය. ටිකෙන් ටික ඇගේ දෙතොල් මගේ දෙතොල් වෙතට ළං වී මගේ තොල් පෙති මත ඇගේ තොල් පෙති තබමින් සිපගන්නට පටන් ගත්තහ. ඒ සමගම මගේ දෙනෙත් පියවූ අතර මා ද අයව තදින් වැළඳගෙන

sinhalaebooks.com



ඇගේ තොල්පෙති සිපගත්තෙමි. දැන් ඇය මාගේ දෙතොල් පමණක් නොව ගෙල ප්‍රදේශය ද සිපගන්නට වූ අතර ඇගේ දෑත් මගේ ඇඳුම යටින් යවමින් මගේ ඉන සහ පිට ප්‍රදේශය සියුම්ව ස්පර්ශ කරන්නට වූ අතර මා ද එලෙසින්ම ඇයව ස්පර්ශ කලෙමි. එය මා ද නොසිතූ ලෙස සිදු වූ දෙයකි. මේ මොහොතේ මාගේ මුළු ශරීරය පුරාම අමුතු ශෘංගාරාත්මක හැඟීමක් දුවන්නට විය. එතරම් සුන්දර හැඟීමක් මා ජීවිතේ කිසිම දිනක විඳ නොතිබුනෙමි. අවට මුළු ලෝකයම අමතක වූ අපි දෙදෙනා සුළු මොහොතකට පසු සයනයේ වැතිරී තව තවත් ඒ ශෘංගාරාත්මක රසය වින්දිගත්තෙමු.

ටික වෙලාවකට පසු සිපගැනීම නතරකල කල අපි දෙදෙනා ලජ්ජාශීලී සිනහවක් පාමින් බිම බලා සිටියෙමු. ජීවිතේ ප්‍රථම වරට විඳගත් මේ සරාගී ප්‍රේමණීය අද්දැකීම නිසාවෙන් ප්‍රීතියෙන් මුසපත් වූ මා නැවතත් අංජලී ගේ ළය මතට තුරුළු වෙමින් අයව වැලඳ ගත්තෙමි. ඇයද මාව තදින් වැළඳගෙන ආදරයෙන් හිස පිරිමදින්නට විය. මා ඇගේ ප්‍රේමණීය උණුහුම විඳිමින් මගේ හිතේ ඇති ආදරය ඇයට ප්‍රකාශ කලෙමි. ඇය ද එලෙසින්ම මා හට ආදරය ප්‍රකාශ කරමින් මගේ හිත ආදරයෙන් පුරවන්නට විය.

එදිනෙන් පසු මෙවන් දිනයන් බොහොමයක් ඇයගේ සහ මාගේ ජීවිතය තුළ ඉතා සුන්දර ලෙස ගතවන්නට විය. අපි තවත් බොහෝ දිනයන්හි අනික් පෙම්වතුන් පෙම්වතියන් මෙන් මල් උද්‍යානයේ සහ නුවර වැව රවුම වටා ආදරයෙන් වෙලී ඇවිද ගියෙමු. අවට සමහර පුද්ගලයින් අපි දෙදෙනා දෙස පුදුමයෙන් මෙන් බලා සිටිනු දුටු නමුත් අපි දෙදෙනාට ඒ කිසිවක් බාධා නොවුනෙමු.

මා පෙරටත් වඩා බොහෝ ප්‍රීතියෙන් කාලය ගත කිරීම නිසා අම්මගේ සිත ද සතුටින් බරවී ඇති බව දුටුවෙමි. එය මගේ

RAY PUBLISHING

sinhalaebooks.com



ද සිතට ඉමහත් සතුටකි. මේ නිසා තාත්තා ගෙන් අපිට ඇති වූ කරදර ද දැන් ටිකෙන් ටික අමතක වී යමින් පවතී.

අංජලී ඉතා ආදරණීය ලෙස නිසදෙස් ලිවීමට ඉතා දක්ෂ තැනැත්තියකි. ඇය මා හට ලියා දුන් ආදර නිසදෙස් බොහෝ ප්‍රමාණයක් ඇත. ඒව අතරින් ඇය මා හට ප්‍රථමයෙන් ලබා දුන් නිසදෙස මා ඔබට ඉදිරිපත් කිරීමට සිතුවෙමි. එය මෙම පොත අවසානයේ ඇති විශේෂ ලිපි කවරයක බහා ඇත.

RAY PUBLISHING

sinhalaebooks.com



# සය මසකට පසු.....

sinhalaebooks.com



අමා ගේ සහ මගේ ආදරය මේ වන විට බොහෝ දුරක් පැමිණ තිබුණෙමු. සැබෑ ආදරේ සුන්දරත්වය විඳගත්තේ මා ඇය ගෙනි. විටෙක ඇය මා තුරුලේ සිටින විට කුඩා දරුවකු වැනිය. ඒ අවිහිංසක ආදරය මගේ සිත සෑම මොහොතකම ප්‍රීතියෙන් පුරවන්නට විය. මා නිසා ඇයට දැන් ඇයගේ පවුලේ ප්‍රශ්න ද අමතක වී ඇත. ඒ අවිහිංසක සුරතලිය ගේ සිතට ජීවිතය පුරාවටම සතුටක් ගෙන ඒමට හැකි වීම ගැන මගේ සිතට තවත් සතුටකි. ඇය ද ජීවිතේ සුන්දරත්වය දුටුවේ මාගෙන් බව ඇය නිතරම මා හට පවසන කරුණකි.

අප ගේ මීළඟ අභියෝගය වනුයේ මෙතෙක් කල් අවට සමාජයට සඟවා ගෙන ආ අපේ ආදර කතාව දෙමවුපියන් වෙත් ඉදිරිපත් කිරීමයි. මක්නිසාදයත් තව වැඩි කාලයක් යන්නට පෙර ඔවුන් විසින් අපගේ විවාහය සැලසුම් කරන බැවිනි. ඊට පෙර අපගේ සම්බන්ධය ගැන දෙමවුපියන්ට දැනුවත් කල යුතුය.

මේ අතර තවත් විශේෂ සිදුවීමක් සිදුවිය. ශාන් ගේ සිතේ අමාගේ මිතුරියක වන නිරාෂා පිළිබඳව අදහසක් ඇති වී ඇත. මගේ උපන් දිනය දවසේ ඔවුන් ගේ හමුවීම මෙහි මූලික ආරම්භය වී ඇතැයි මා සිතමි. මේ පිළිබඳව මා අමාව ද දැනුවත් කරන්නට වූ අතර ඇය ද බෙහෙවින් සතුටට පත් විය. අපි දෙදෙනාගේ සහයෝගය මැද ඔවුන් ගේ ආදර කතාව ද ආරම්භ උනෙමු.

මේ අයුරින් කාලය ගතවන අතරේ අපේ පාඨමාලා වල අවසානය ද ළඟා වී තිබුණෙමු. පෙර සේ නැවතත් නිකරුනේ නිවසට වී කාලය ගත කිරීමට සිත් නොවූ නිසාවෙන් ඉකමනින්ම රැකියාවක් සොයා ගත යුතු යැයි මට සිතුනි. අමා ද ඒ අදහසට එකඟ විය. මා මේ පිළිබඳව අම්මා සමග ද කතා කිරීමට සිතාගත්තෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



*2000/08/05*

**නොදැනීම** කාලය ගත වී අපේ පාඨමාලා වල අවසානය ළඟා වූ හෙයින් අංජලී සහ මා අපේ ඉදිරි අනාගතය ගැන සැලසුම් ගැන සිතමින් සිටියෙමු. මේ අතර දිනක් මා කිසි සෙත් නොසිතූ සිදුවීමක් සිදුවිය. ඒ නැන්දා සහ අම්මා අතර විවාහ යෝජනාවක් පිළිබඳව කතාවක් ඇතිවීමය. එය සවනට වැටුණු මා කාමරයේ හිඳ ඔවුන් දෙදෙනා ගේ කතාවට සවන්දීගෙන සිටියෙමි. මේ කතාකරන්නේ මා පිළිබඳව බව වැඩි වෙලාවක් යන්නට පෙර මා තේරුම් ගත්තෙමි. නැන්දා විසින් ඇගේ හිතවත් පවුලක පිරිමි ළමයෙකු මා හට යෝජනා කරන්නට වුහ. ඔවුන් දෙදනා ගේ කතා බහ මෙසේ සිදුවිය.

"නංගි.... මං පොඩි කාරණාවක් කතාකරන්න කියල හිටියේ..."

"මොකද්ද අක්කේ?..."

"කෙල්ල ගේ කලවයසත් හරි නේද?... Class ඉවර වෙන්නත් ළඟ එකේ නරකද හොඳ තැනකින් කටයුත්තක් බැලුවොත්..."

"ඒක නම් ඇත්ත තමයි... අක්ක දන්න කවුරු හරි ඉන්නවද?...."

FRAY PUBLISHING

sinhalaebooks.com



"එක්කෙනක් නම් ඉන්නවා..."

"කවුද?..."

"අර ගම්පොල ඉන්න වසුන්දරා ගේ පුතා... නංගි දන්නවනේ ඒ ළමය ගැන..."

"ඔව් ඔව් මං දන්නවා... ඒ ළමය නම් හොඳයි තමයි.... ඒත් ඒ පවුල් වලින් කැමති වෙයිද?..."

"ඒක මං බලාගන්නම්..... නංගි මොකද කියන්නෙ කියන්නකො...."

"ඒ ළමයට මං මොකට අකමැති වෙන්නද අක්කේ.... ඒත් අපේ කෙල්ල මොනවා කියයි ද දන්නේ නෑ..."

"කෙල්ල මොනාට අකමැති වෙන්නද?...."

"බලමුකෝ අක්කේ... කෙල්ල කැමති උනොත් නම් මට ඒකිගේ අනාගතේ ගැන බය නෑ..."

දෙදෙනාගේ සංවාදය ඇසුණු මා කුමක් කරන්නේ දැයි සිතාගත නොහැකිව කල්පනා කරන්නට උනෙමි. මා මේ යෝජනාවට අකමැති වුවහොත් අම්මා ගේ සිත දැඩි ලෙස දුකට පත් විය හැකිය. මාගේ අහිංසක අම්මගේ සිත මා කෙසේ රිදවන්නද... අංජලී ගේ සහ මගේ සම්බන්දය අම්මට කිව හැකි නමුත් නැන්දා දැනගත්තොත් කුමක් සිදුවේද... මෙවැනි සිතුවිලි සමුදායකින් සිත පිරෙන්නට විය. එම මොහොතේම මා අංජලී ට දුරකථන ඇමතුමක් දී මේ ගැන ඇයට දැනුවත් කිරීමට සිතුවත් අම්මා සහ නැන්දා නිවසේ ඇති නිසා වෙන් මා එය පසු දින ඇයව මුණ ගැසී පැවසීමට තීරණය කලෙමි.

පසු දින උදෑසන මා අවදිවන වී අද දහවල් මල් උද්‍යානයේ දී මුණගැහෙන ලෙස කෙටි පණිවිඩයක් යැව්වෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



පසුව මා සයනයෙන් බැසීමට සුදානම් වෙද්දීම අම්මා කාමරයට පැමිණියහ.

"දුව දැන් ද නැගිට්ටේ?..."

"නෑ අම්මා දැන් ටිකක් වෙලා...."

"මට දුව එක්ක කාරනාවක් තියනව කතාකරන්න..."

අම්මා මේ ඇසීමට සුදානම් වන්නේ ඊයේ නැන්දා විසින් ගෙන එන ලද යෝජනාව ගැන බව මා දැනගෙන සිටි නමුත් ඒ බව සඟවා සිටියෙමි.

"ඒ මොකද්ද?..."

"ඊට ඉස්සෙල්ල කියන්නකෝ Class එකේ වැඩ කොහොමද කියල?... "

"වරදක් නෑ අම්මා... තව සති දෙකකින් Class එක ඉවරත් එක්ක.... ඉතින් අම්මා මොකක් ගැන ද අර කතාකරන්න තියෙනවා කිව්වේ?..."

"දුව.... හැමදාම ඔහොම ඉඳල බෑ නේද?..."

"ඒ කිව්වේ අම්මා..."

"නෑ මං කිව්වේ දුවත් දැන් පිළිවෙලක් වෙන්න ඕනේ නේද?...."

"අයි අම්මා මං අපිළිවෙලයි ද?..." කවට සිනහවක් පාමින් මා පැවසුවෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



"විහිළු නෙවෙයි ළමයෝ.... කලවයසත් හරි එකේ... නරකද දැන් පෙලවහක් ගැන හිතුවොත්..... දුවගේ හිතේ කවුරු හරි ඉන්නවා නම් කියන්න?..."

මගේ හිතේ ඉන්නේ අංජලී බව අම්මට මා මේ මොහොතේ එක පාරටම කෙසේ කියන්නද?... කිසිවක් කියාගත නොහැකිව අසරණ වූ මා මෙසේ පැවසුවෙමි.

"එහෙම කවුරුවත් නෑ අම්මා... අම්මලම හොයල බලල කියන්නකෝ..."

"නැන්දා දන්නා පවුලකින් යෝජනාවක් ගෙනාව නැන්දා.... දුවත් එයාලව දන්නවා..."

"කවුද?...."

"අර නැන්දා ගේ යාලුවෙක් ඉන්නේ වසුන්දරා කියල... එයාගේ පුතා.... පවුලේ එකම දරුවා මං හිතන්නේ.... දුව ඒ ළමයව දන්නවා නේද?...."

"ඔව්... ඔව්... එක දවසක් ආව නේද වසුන්දරා ආන්ටි එක්ක මෙහෙ?..."

"ආ.... ඔව් ඔව්... ආව තමයි.... ඉතින් දුව මොකද හිතන්නේ ඒ ගැන..."

"අම්මා මොකද හිතන්නේ කියන්නකෝ..."

ඒ පිළිබඳව අම්මා ගේ අදහස දැනගැනීම පිණිස මා එසේ ඇසුවෙමි.

"මම නෙවෙයිනේ ළමයෝ ඔයානේ කියන්න ඕනේ.... හැබැයි ඉතින් ඔයා මේකට කැමති උනොත් නම් මට ඔයා ගැන බයක් නෑ.... මොකද ඒ ළමයට මොනවයින් අඩුවක් ද...."

RAY PUBLISHING

sinhalaebooks.com



"අම්මලගේ කැමැත්තක් කරන්නකෝ...."

මේ මොහොතේ අම්මගේ මුහුණේ තිබූ ප්‍රීතිය දුටු මා මේ කටයුත්තට අකමැත්ත ප්‍රකාශ කර අම්මගේ ඒ ප්‍රීතිය විනාශ කිරීමට සිත් නොවූ හෙයින් මා එසේ පැවසුවෙමි. මක්නිසාදයත් අම්මා මේ තරම් ජීවිතේ සතුටින් ගතකරන කාලයක් මා මින් පෙර කිසි දිනෙක දැක නොතිබුනෙමි. සැබවින්ම ඇයගේ අතීතය බෙහෙවින් අප්‍රියජනක වූ දුක්බර අතීතයකි. එපමණ දුක් කරදර රාශියක් මැදින් මාව මේ තැනට ගෙන ඒමට ඇය කෙතරම් වෙහෙසක් දරන්නට ඇති දැයි සිතාගතවත් නොහැකි තරම් ය. මේ නිසා අංජලී සමගත් මේ පිළිබඳව සාකච්ඡා කර අම්මා ගේ සිත නොරිදෙන පරිදි ඇයට මේ ගැන පැහැදිලි කර දිය යුතු යැයි මා සිතුවෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



*2000/08/06*

**යොදාගත්** පරිදි මා දහවල් අමාව මුණගැසීම සඳහා මල් උද්‍යානය වෙත ගියෙමි. මා එහි යන විටත් අමා පැමිණ සිටියහ. ප්‍රවේශපත්‍ර මිලදී ගෙන උද්‍යානයට ඇතුලු වූ අපි උද්‍යානයේ මලින් බරවුණු එක් වීදියක ඇවිද ගියෙමු. මද දුරක් ඇවිද ගිය අපි මාර්ගයේ එක් පසෙක හමුවූ විශාල ගසක් යට එම ගැසීම පොළොවෙන් උඩට නෙරා ආ විශාල මුලක් මත වාඩි උනෙමු.

"ඉතින් අමා කියන්නකෝ.... මොකද මේ මූණ අඳුරු කරගෙන...."

"අංජලී..... අපේ නැන්ද.... මට යෝජනාවක් ගෙනල්ල...."

"ඉතින්...."

"අම්ම මාත් එක්ක ඒ ගැන කතා කළා..."

"ඉතින් මොකද උනේ...."

"ඒ පවුල නැන්දයි අම්මයි හොඳට දන්නා පවුලක්.... අම්ම නම් කැමතී.... මගෙන් අහනවා මොකද හිතන්නේ කියල...."

"ඉතින් ඔයා මොකද කිව්වේ?...."

RAY PUBLISHING

sinhalaebooks.com



"අම්ම ඒ වෙලාවේ ගොඩක් සතුටින් හිටියේ අංජලී.... ඔයා දන්නවනේ අපේ අම්ම ගැන... මට ඒ වෙලාවේ එක පාරටම අම්මට අපි ගැන කියන්නත් බෑ.... යෝජනාවට අකමැතී කියන්නත් බෑ...."

"ඔව් එක ඇත්ත.... මොකද ඉතින් කිව්වේ?...."

"මං කිව්වා අම්මලාගේ කැමැත්තක් කරගන්න කියල.... මට වෙන කියන්න දෙයක් තිබුනේ නෑ අංජලී..... අනේ අංජලී.... අපි දැන් මේකට මොකද කරන්නේ...."

"හරි හරි... දුක් වෙන්න එපා... තාම හරියටම කිසිම දෙයක් තීරණය උනේ නෑනේ..... අපි බලමුකෝ ඉස්සරහට මොකද වෙන්නේ කියල...."

මා ඇයව සැනසීමට ඇගේ හිස අතගාමින් එසේ කීවත් මගේ සිතට ද දැඩි වේදනාවක් ඇති වී ඇත. මා එය ඉතා අපහසුවෙන් සඟවාගෙන සිටියෙමි.

"අනේ අංජලී.... මට ඔයා නැතුව නම් ඉන්න බෑ... " අමා මගේ උරතලයට හිස තබමින් පැවසීය.

"හරි හරි... කලබල වෙන්න එපා පැටියෝ... අපි කල්පනා කරලා මොනවා හරි කරමු.... කොහොම උනත් ඔයාගේ අම්මට අපි ගැන කියන්න වෙනවා"

"අම්මට අපි ගැන පැහැදිලි කරලා දුන්නොත් මට හොඳටම විශ්වාසයි අම්ම අපිට අකමැති වෙන්නේ නෑ කියල..."

"අපි මුලින්ම කරන්න ඕනේ මේ වැඩේ නවත්තන එක.... ඊට පස්සේ අම්මට හිමිහිට කියමු..."

RAY PUBLISHING

sinhalaebooks.com





"අම්ම නෙවෙයි ලොකුම ප්‍රශ්නේ නැත්ද.... එයා මේක දැනගත්තහම මොනවා වෙයිද දන්නේ නෑ..."

"එන ඕනෙම දෙකට මම ඔයත් එක්ක ඉන්නවා අමා... ඔයා බයවෙන්න එපා... මට කියන්නකෝ ඒ Boy ගැන ඔයා දන්නවද?... ගෙවල් එහෙම කොහෙද කියල?..."

"වැඩි විස්තරයක් නම් දන්නේ නෑ.... මං එක පාරයි දැකල තියෙන්නේ.... ඉන්නේ ගම්පොල... හරියටම කොහෙද කියල නම් දන්නේ නෑ.... "

"එය කොහෙද ජොබ් එක කරන්නේ?... "

"මං දන්නා හැටියට නම් ගන්නෝරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ..."

"හ්ම්ම්.... අපි ශාන් එක්කත් කතා කරලා බලමු... ඔයා දැන් දුක් වෙන්නේ නැතුව ඉන්නකෝ.... හරිද?..."

අමාගේ අම්මා අද නිවසේ සිටින නිසාවෙන් වැඩි වෙලා නොගෙන අපි අපේ කතාව ඉක්මනින් අවසන්කර නිවෙස් බලා පිටත්ව ගියෙමු. එදින දවසම නැවතත් අමා සමග කතා කිරීමට නොහැකි උනත් කෙටි පණිවුඩ හුවමාරු කරගනිමින් මා ඇගේ සිත සැනසුවෙමි.

එදින රාත්‍රියේ මා ශාන් සමග අමා ගැන කතා කෙරුවෙමි.

"Hello..... "

" Hello..... ශාන්..."

"ඔව් කියන්න අංජලී...."

RAY PUBLISHING

sinhalaebooks.com



"අපිට පොඩි ප්‍රශ්නයක් ශාන්..."

"මොකද්ද?...."

"අමාට ගෙදරින් යෝජනාවක් ගේන්න හදනවා....."

"දැන්ම...."

"ඔව්.... එයාගෙ නැන්ද තමයි කතාකරලා තියෙන්නේ.... නැන්ද අඳුරන තැනක් ලු...." අමා කී පරිදි සියලු විස්තර මා ශාන් ට පැවසුවෙමි.

"ඉතිං ශාන්.... අපි මේකට මොකද කරන්නේ?...."

"ඔය කියන විදිහට නම් දැන්ම ඔයාල ගැන අමා ගේ අම්මට කියලත් බෑ නොකියත් බෑ...."

"ඔව් ශාන්.... අපිට මුලින්ම මේ වැඩේ නවත්ත ගන්න ක්‍රමයක් නැද්ද?... පස්සේ අම්මට කියන්න පුළුවන් අපි ගැන..."

"කිච්චා විස්තර වල හැටියට මට ඔය කෙනාව හොයාගන්න බැරි වෙන එකක් නෑ.... ඒත් අපි මේ වෙලාවේ කලබල වෙලා බෑ අංජලී.... එයාගෙ අම්මයි නැන්දයි ඊ ළඟට මොකද කරන්නේ කියල බලමු...."

"ඔව් ඒක ඇත්ත.... ඔයා කෝකටත් ඒ Boy ගැන හොයල බලන්නකෝ...."

"හරි අංජලී.... අපි මොනවහරි කරමු. විශේෂ දෙයක් උනොත් මට කියන්නකෝ.... අමාට කියන්න කලබල වෙන්න එපා කියාල මේ වෙලාවේ. අනික සාමාන්‍ය විදිහට ඉන්න කියන්න.... නැත්තන් සැක හිතයි නේ...."

RAY PUBLISHING

sinhalaebooks.com



"හරි ශාන්.... මං කියන්නම්..."

"මං එහෙනම් තියන්නනම් අංජලී...."

"අනේ Thanks lot ශාන්... Good Night.... Bye.... "

"It's ok.... Good Night.... Bye අංජලී...."

මේය මා බලාපොරොත්තු වූ දෙයක් වූ නමුත් එය මා සිතුවාටත් වඩා ඉක්මනින් සිදු වූ හෙයින් අමා මෙන්ම මා ද කිසිවක් සිතාගත නොහැකිව සිටියෙමි. නමුත් ශාන් සමග කතාබහෙන් පසු මගේ සිතට යම් සැනසීමක් ලැබෙන්නට විය. පසු දින උදෑසන දුම්රියේ පන්තියට යන අතරවාරයේ මා ශාන් කී දේවල් අමාට ද පැවසූ අතර ඇගේ සිතට ද යම් සැහැල්ලුවක් ලැබුණු බව ඇගේ මුහුණින් සනිටුහන් විය.

RAY PUBLISHING

sinhalaebooks.com



*2000/08/16*

**නිහඬව** කාලය ගත වී තවත් එක් තීරණාත්මක දිනයක් උදාවිය. එනම් අපේ පන්තියේ අවසාන දිනයට පෙර දිනයයි. එදින සවස් යාමයේ මා කිසිසේත් බලාපොරොත්තු නොවූ සිදුවීමක් සිදුවිය. එකවරම තාත්තා නිවසට පැමිණෙනු මා මගේ කාමරයේ ජනේලයෙන් දුටුවෙමි. අද රාත්‍රියේ කුමක් සිදුවේ දැයි සිතාගත නොහැකිව මගේ සිත දැඩි කම්පනයකට පත් උනෙමි. නමුත් සිදුවූයේ පුදුම සහගත් සිදුවීමකි. වෙනදාට සුරාවෙන් මත්ව යක්ෂයෙක් මෙන් නිවසට පැමිණෙන තාත්තා අද ඉතා ලස්සන ඇඳුමකින් සැරසී ප්‍රියමනාප පෙනුමකින් යුතුව පැමිණ ඇත. අද තාත්තා මත් පැන් පානය ද කර නොමැත. නමුත් තාත්තා නිවසට ඇතුල් නොවී දොරකඩට වී සිටගෙන සිටියහ. තාත්තා ගේ මේ පුදුම සහගත හැසිරීම කුමක් දැයි කල්පන කරමින් සිටියෙදී තවත් පුදුම සහගත සිදුවීමක් සිදුවිය. එනම් වෙනදට තාත්තා එන විට මා සේම දැඩි ලෙස කම්පනයට පත් වන අම්ම අද ඉතා ප්‍රීතියෙන් යුතු සිනහවක් පාමින් නිවසේ දොරකඩට පැමිණීමයි. ඇගේ අතේ ෆයිල් කවරයක් වැනි යමක් බහාලූ බෑගයක් තිබුණි. අම්මා තාත්තාට නිවාස ඇතුලට එන

sinhalaebooks.com



ලෙස ඇරයුම් කලත් තාත්තා එය ප්‍රතික්ෂේප කළහ. ඔවුන් දෙදෙනා කුමක් හෝ විශේෂ දෙයක් පිළිබඳව කතාකරන මුත් ඒ කුමක් දැයි මට වැටහගත නොහැකිය. කතාව අතරේ තාත්තා ගේ මුහුණේ ඉතා අසරණ බවක් නිරූපණය වූ අතර අම්මගේ මුහුණ පෙර තිබූ සතුට තුරන් ව ගොස් මැලවී තිබුණි. මේ සිදුවන්නේ කුමක් දැයි සිතාගත නොහැකිව මා ඔවුන් දෙදෙනා දෙස දැඩි තැතිගනීමකින් යුතුව බලා සිටියෙමි. මඳ වෙලාවකට පසු තාත්තා ආපසු යන්න සැරසෙන බවක් මා දුටිමි. අම්ම ඇගේ අතේ තිබූ බෑගය තාත්තගේ අතට දුන් අතර තාත්තා එයත් රැගෙන ඉතා ඉක්මන් ගමනින් නිවසින් පිටව යන්නට විය. අම්මා පිටව යන තාත්තා දෙස මදවේලාවක් බලා හිඳ ඉක්මනින්ම නිවසට ඇතුළු විය.

මා සයනයට වී මේ සිදුවන පුදුම සහගත සිදුවීම් ගැන කල්පනා කරමින් සිටියෙදී අම්මව අමතමින් නැන්දා නිවසට පැමිණෙනු ඇසුනි. නැන්දා සාලයේ සෝපාවේ අසුන්ගෙන සිටි අතර අම්මා ද එතනට පැමිණ නැන්දාට අනෙක් පසින් අසුන් ගන්නට විය. මද වෙලාවකට පසු අම්මා මා හට ද ඔවුන් වෙත පැමිණෙන ලෙස ඇරයුම් කළහ.

"දුව.... පොඩ්ඩක් මෙහෙට එන්න...."

"එනවා අම්මා..."

මීළඟට කුමක් සිදුවේ දැයි සිත දෙගිඩියාවෙන් යුතුව මා සාලයට ගියෙමි. පසුව මා අම්මගේ ඇරයුමෙන් සොපාවේ යාබද අසුනක අසුන්ගත්තෙමි. අම්මා විසින් කතාවට අවතීරණ විය.

දුව හෙටින් Class එක ඉවරයි නේද?..."

"ඔව් අම්මා..."

RAY PUBLISHING

sinhalaebooks.com



"නැන්ද කියනවා Class එකත් ඉවර වෙන එකේ අර වසුන්දරා ආන්ටිටයි එයාගේ පුතාටයි මෙහෙ කෑමකට එන්න කියමු කියල... ඔයාටයි අර ළමයටයි දැන අඳුනගන්නත් පුළුවන්නේ...."

"මෙච්චර ඉක්මනට...?"

"පරක්කු කරලත් බැනේ දුව මේවා..." නැන්දා එසේ පවසද්දී අම්මා කිසිවක් නොකියා බිම බලාගෙන සිටින්නට විය. හවස තාත්තා ගේ සහ අම්මා ගේ අමුතු හැසිරීම් හමුවේ කම්පනයට ලක්ව සිටි මා මේ මොහොතේ තවත් අසරණ බාවයට පත් උනෙමි. නමුත් මා අම්මා ඉදිරියේ ඒ සියලු හැඟීම් සඟවා සිටියෙමි.

"දැන් කවද්ද එයාලට එන්න කියන්නේ?..."

"මං වසුන්දරා ආන්ටි එක්කත් කතාකලා... එයාලට මේ සෙනසුරාදා එන්න පුළුවන් කිව්වා..."

නැන්දා එසේ කියද්දී අම්මටත් වඩා මේ කටයුත්තට දැඩි ලෙස උනන්දුවන්නේ නැන්දා බව මා හට වැටහුණෙමි. කෙසේ නමුත් අංජලී කී පරිදි මේ මොහොතේ අම්මලාට අකමැත්ත ප්‍රකාශ නොකර සිටීමට මා සිතුවෙමි.

"මං එදා කිව්වනේ අම්මා... අම්මල කැමති දෙයක් කරන්න කියල..." එසේ කියමින් මා අසුනින් නැගිට කාමරයට යන්න සැරසුණි.

"එහෙනම් නංගි මං වසුන්දරාට කතා කරලා සෙනසුරාදට එන්න කියන්නම්..."

RAY PUBLISHING

sinhalaebooks.com



නැන්දා ද එසේ කියමින් සාලයෙන් පිටව ගිය අතර අම්මා කිසිවක් නොකියා හිස වනා සොපාව ඉදිරියේ මේසය මත තිබූ පත්තරයක් අතට ගෙන බලන්නට පටන් ගත්තහ.

කාමරයට පැමිණ මා සයනයේ වැතිරී නැවතත් කල්පනා කරන්නට පටන්ගත්තෙමි. පෙරදා අම්මා මේ කටයුත්තට තිබූ උනන්දුව අද තිබුනේ නැත. නැන්දා ඉදිරියේ නොපෙන්නු මුත් අම්මා ද මේ කටයුත්තට අකමැත්තක් දක්වනවා දැයි අම්මගේ හැසිරීමෙන් මගේ සිතේ සැකයක් ද ඇති විය. තාත්තා ගේ පැමිණීම සහ අම්මගේ මේ වෙනස් හැසිරීම අතර කුමක් හෝ මගෙන් සඟවන රහසක් ඔවුන් දෙදෙනා අතර ඇති බව මා හට සිතුනෙමි. මේ පිළිබඳව හෙටම අංජලී සහ ශාන් සමග කතා කලයුතු යැයි මා සිතාගත්තෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



2000/08/17

අද අපේ පංතිය අවසාන දිනය වූ හෙයින් පංතිය වේලාසනින් අවසන් විය. පන්තියේ මිතුරු මිතුරියන් සාදයක් පැවැත්වීමට තීරණය කර තිබුනත් මම සහ ශාන් එයට සහභාගී නොවී අමා මුණගැසීමට ඇයගේ පංතිය වෙත යාමට උදෑසනම තීරණය කර තිබුනෙමු. ඒ අමා ගේ පංතියේ කටයුතු ද දහවල් ආහාර ගන්නා වෙලාව වන විට අවසන් වන බව උදෑසනම මට පවසා තිබුණ නිසාවෙනි. අපි දෙදෙනා පංතිය අසලට යන විටත් එය අවසන් නොවී තිබූ බැවින් අපි වෙනදාට මුණගැහෙන අවන්හල වෙත ගියෙමු. අමා එනතුරු අවන්හලේ මේසයක් වෙත ගිය අපි එහි අසුන් මත වාඩි උනෙමු. පසුව ශාන් විසින් කතාවට අවතීරණ විය.

"මම අර Boy... ගැන විස්තර හොයාගත්ත...."

"අනේ ශාන් කොච්චර දෙයක්ද?....."

"මිනිහ මගේ යාලුවෙක් ගේ යාලුවෙක්. මගේ යාලුවට කියල මොනවා හරි කරගන්න බැරි වෙන එකක් නෑ"

RAY PUBLISHING

sinhalaebooks.com



ශාන් එසේ පවසද්දී අමා නිරාශා සමග අවන්හලට ගොඩවනු මා දුටුවෙමි.

"ශාන්... අන්න දෙන්න එනවා.... හැබැයි ලක්ෂි පේන්න නෑනේ...."

මා එසේ පවසමින් අමා වෙත අත වනුවෙමි. පසුව ඔවුන් දෙදෙනා අපගේ මේසය වෙත පැමිණියහ. අමා මගේ අසුනට යාබද අසුනේ වාඩි වූ අතර නිරාශා ශාන් ගේ අසුනට යාබද අසුනේ වාඩි විය.

"කෝ ලක්ෂි නැද්ද අද?..."

"එයා තව යාළුවො කීප දෙනෙක් එක්ක පංතියේ නතර උනා... අපි දෙන්න ආව..." නිරාශා පිළිතුරු දුන්නහ.

"ඉතින් අමා.... දැන් මොකද්ද අලුත්ම තත්වේ...?" ශාන් විමසීය.

"හිතාගන්න බැරි සිද්දි ගොඩක් නිසා ඔක්කොම පටලැවිල තියෙන්නේ ශාන්..."

"ඒ කිව්වේ..."

"මුලින්ම අපි දෙන්නගේ ප්‍රශ්නේ ගැන කියන්නකෝ..." මා පැවසීය.

"ඒ කියන්නේ... තව මොනවා හරි උනාද?..."

"ඔව්.... මුලින්ම දැනට තියන ප්‍රශ්නේ කියන්නම් කෝ.... එදා අම්මා කතා කලාට පස්සේ ආයේ ඒ ගැන කතා කලේ ඊයේ... එයාල මේ සෙනසුරාදට අර Boy ගේ ගෙදර අයට අපේ ගෙදරට එන්න කියනවලු.... අපිට දැන අඳුනගන්නත් එක්ක...."

"එච්චර ඉක්මනට...."

RAY PUBLISHING

sinhalaebooks.com



"ඔව් ශාන්.... මට හිතාගන්න බෑ මොනව කරන්නද කියල.... සමහර විට එයාල මේ තියන කලබලේ හැටියට මගුලත් කතාකරන්න බැරි නෑ..."

"එහෙම කලබලේට කොහොමද මගුල් කතා කරන්නේ..." නිරාශා පැවසීය....

"එක නම් එහෙම තමයි.... ඒත් ඉතින් අපි ඉකමනටම මොනවා හරි කරමු නේද?..."

"හරි.... හරි.... ශාන්ට ඔය කියපු Boy ගැන විස්තර හොයාගන්න පුළුවන් උනාලු" මා අමා ගේ හිස අතගාමින් පැවසුවෙමි.

"අනේ ඇත්තද ශාන්?..."

"ඔව් අමා.... ඒ Boy මගේ යාලුවෙක් ගේ යාලුවෙක්...."

"ඉතින් ශාන් අපිට දැන් මොනාද කරන්න පුළුවන්?...." මා ඇසුවෙමි...

"මගේ ළඟ පොඩි අදහසක් තියනවා.... "

"මොකද්ද?..."

"මගේ යාළුවා කියපු විදිහට නම් මිනිහත් එක්ක අපිට මේක කතාකරලා ශේප් කරගන්න පුළුවන් වෙයි. ඉතින් අපිට පුළුවන්නේ එයාව Meet වෙලා මේක හෙමීට පැහැදිලි කරලා දෙන්න."

"අනේ එහෙම කරන්න පුළුවන් උනොත් නම් කොච්චර දෙයක්ද...." අමා එසේ පවසන්නට විය.

"අනේ ඔව් ශාන්.... " මා ද පැවසුවෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



"ඒත් හැබැයි පොඩි අවුලක් තියනවා නේද?..." වැඩි කතාබහකින් තොරව නිහඬව සිටි නිරාශා පැවසීය.

"ඒ මොකද්ද?..." ශාන් නිරාශාගෙන් විමසූ අතර අපි දෙදෙනා ද ඈ දෙස බැලුවෙමු.

"දැන් මේ සෙනසුරාදට ඔය කියන Boy... ගේ ගෙදරින් එනවා නම් අපි ඊට කලින් එයාව Meet... වෙලා හරියන්නේ නෑ.... එහෙම උනොත් මිනිහ අපි එපා කිව්වත් ගෙදර ගිහින් කියන්න ඉඩ තියෙනවා. එහෙම උනොත් අමා ඔයාගේ නැන්දත් දැනගන්න ඉඩතියෙනවා...."

"ඔව් එහෙම උනොත් ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා තමයි"

අමා එසේ කියමින් නිරාශා ගේ අදහසට එකඟතාවය පලකල අතර මා ද එයට එලෙසම එකඟතාවය පලකලෙමි.

"එහෙනම් අපි මෙහෙම කරමු.... සෙනසුරාදට එයාල ඔයාලගේ ගෙදර ඇවිත් ගියාට පස්සේ මං ඉරිදටම මිනිහව Meet වෙන්නම්. හැබැයි අමා ඔයා සෙනසුරාදට කිසිම සැකයක් ඇති නොවෙන විදිහට ඉන්න ඕනේ.... හරිද?...."

"ඔව්.... ඒක හොඳයි නේද අමා...." මා ශාන් ගේ අදහසට එකඟතාවය පළකරමින් අමා දෙස බැලූ අතර අමා ද හිස වනමින් මා සමග එක් විය.

"ඉතින් දැන් තව මොකද උනේ?...." නිරාශා විමසන්නට විමසන්නට වූ අතර අමා මට උදෑසන පැවසූ ඇගේ අම්මගේ සහ තාත්තා ගේ සිදුවීම මා පැවසුවෙමි.

"ආ... තවදෙයක්... ඊයේ නැන්දයි අම්මයි කතා කරන වෙලාවේ අම්මා හැසිරිච්ච විදිහට අම්මා ඒ තරම් කැමැත්තක් නෑ වගේ මේ

RAY PUBLISHING

sinhalaebooks.com



වැඩේට කියල මට හිතෙනවා....” අමා නැවතත් එසේ පවසන්නට විය.

“එකත් එහෙමද....” මද වෙලාවක් කල්පනාවේ යෙදී සිට ශාන් නැවතත් කතාවට එක් විය.

“හරි... අපි මුලින්ම සෙනසුරාද වැඩේ ඉවරයක් කරලා ඉමුකෝ.... පස්සේ අනික් ඒවා බලමු”

අපේ සාකච්ඡාව එතනින් අවසන් වූ අතර සියල්ලෝම නිවෙස් බලා පිටත් උනෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



## 2000/08/20

අපේ පංතියේ අවසාන වූ බදාදා දිනයෙන් පසු උදා වූ දිනයන් දෙක ඉක්මනින්ම ගෙවී ගොස් වසුන්දරා නැන්දා අපේ නිවසට එන සෙනසුරාදා දිනය උදාවිය. දහවල් බෝජන සංග්‍රහයක් සඳහා පැමිණි වසුන්දරා නැන්දා සහ ඇගේ පුතා වන රොෂාන් නිවසින් පිටව යන තුරු මා සිටියේ ඉතා අසීරුවෙනි. ඔවුන් ගෙදරින් පිටව ගිය පසු නැන්දා ද රාජකාරියක් සඳහා නිවසින් පිටත්ව යන්නට විය. අම්මා කෑම මේසය අස්කරන්නට පටන් ගත් අතර මා ද ඇයට උදවු උනෙමි. වැඩි කතාබහක් නොවූ අම්මා ගේ මුහුණේ දැඩි නොසන්සුන් බවක් පෙනෙන්නට වූ නිසාවෙන් මා අම්මා ගෙන් මෙසේ ඇසුවෙමි.

"අම්මා.... ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් ද?..."

මා අම්මගෙන් එසේ විමසූ නමුත් ඇය කිසිවක් නෑසුන සේ වැඩකරගෙන යන්නට විය. මා නැවතත් ඇගේ සමීපයට ගොස් ඇයව ඇමතුවෙමි.

"අම්මා...."

RAY PUBLISHING

sinhalaebooks.com



"ආ... ඇයි දුව.... ඔයා කතාකලා ද?... " තිගැස්සී මදෙස බැලූ අම්මා එසේ අසන්නට විය.

"ඔව් ඔව් කතා කළා තමයි..."

"අනේ දුව මං වෙන කල්පනාවක හිටියේ..... කියන්නාක් ඉතින්..."

"වෙන කල්පනාවක හිටපු බව නම් මං දැක්ක.... අම්මාට මොකක් හරි ප්‍රශ්නයක්ද කියා ඇහුවේ..."

"නෑ නෑ එහෙම දෙයක් නෑ දුව..."

අම්මා එසේ පවසූ නමුත් කුමක් හෝ දෙයක් සඟවන බව මා හට වැටහිණි. මා ඒ පිළිබඳව වැඩි දුර විමසා අම්මා අපහසුතාවයට පත් නොකිරීමට සිතාගත්තෙමි. පසුව අපි නිහඬවම වැඩ අවසන් කර මුළුතැන් ගෙයින් නිකම් ගියෙමු.

මා කාමරයට පැමිණ සුළු මොහොතකට පසු නැන්දා නිවසට පැමිණියහ. පෙරදා මෙන් අම්මට අමතමින් ඈ සෝපාවේ වාඩි වූ අතර අම්මා ද එතනට පැමිණ යාබද අසුනක වාඩි විය. නැන්දා විසින් කතාවට අවතීරණ වූ අතර මා කාමරයේ සිට ඔවුන් දෙදෙනාගේ කතාවට සවන්දීගෙන සිටියෙමි.

"නංගි වැඩේ හොඳට කෙරුණා නේද?..."

"අඩුවක් වෙන්න දෙයක් තිබ්බෙ නෑනේ ඉතින්.... වසුන්දරා කතා කලාද අක්ක එක්ක?..."

ඔව් මට හවස කතාකලා.... අම්මාටයි පුතාටයි දෙන්නටම අපේ එකීව හිතට අල්ලලා.... වසුන්දරා කියනවා ඉතුරු වැඩ ටිකක් ඉක්මනමටම ඉවරයක් කරමු කියල..."

sinhalaebooks.com



"ඇයි එයාල එච්චර කලබල.... මේවා එහෙම කලබලේට කරන්න පුළුවන් වැඩ නෙවෙයි නේ..."

"තව මොනවද බලන්න තියෙන්නේ.... දෙගොල්ලොම කැමති එකේ පරක්කු නොකර අපි වැඩේ කරලා දාමු. අනික වසුන්දරා කියන්නේ ලොකුවට මගුලක් ගන්න ඕනේ නෑ.... බොහොම චාමෙට කරමු කියල...."

"හරි හරි අක්ක කියනවා නම් අපි වෙලාවක් දාගෙන වසුන්දරාලගේ ගෙදර ගිහින්ම මේ ගැන කතාකරමු කෝ" අම්මා එසේ කියමින් සාලයෙන් පිටව යනු මා දුටුවෙමි.

මේ මොහොතේ මගේ සිත තවත් අසරණ බාවයට පත් විය. මේ පිළිබඳව දැනුවත් කරමින් මා අංජලීට කෙටි පණිවිඩයක් යැව්වෙමි. මේ අතර ශාන් රොෂාන්ව මුණගැහෙන බව කී නිසාවෙන් හිත ටිකක් හෝ සැහැල්ලු වූ නමුත් ඉන් පසු කුමන තත්වයක් උදාවේ දැයි සිතන විටත් සිත නැවතත් නොසන්සුන් බාවයට පත්වෙයි. මේ නිසාවෙන් මා හෙට උදෑසනම කෙසේ හෝ අම්මා සමග මේ ගැන කතාකල යුතු යැයි සිතාගත්තෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



*2000/08/21*

පෙර දින අමා ගේ නිවසේ තිබූ භෝජන සංග්‍රහය අවසන් වන තුරු මා බලා සිටියේ සිදු වූයේ කුමක් දැයි දැනගැනීමට නොයිවසිල්ලෙනි. නමුත් එදින හවස් වන තුරුත් ඇගෙන් කෙටි පණිවිඩයක් වත් නොලැබුනු නිසා ඇයට ඇමතුමක් ගැනීමට සිත කීවත් නැන්දා සහ අම්මා ගෙදර ඉන්නා බව සිහි වූ හෙයින් මා එම අදහස කනගාටුවෙන් යුතුව ඉවත දැමුවෙමි. එදින රාත්‍රියේ දී ඇගෙන් කෙටි පණිවිඩයක් ලැබෙන්නට විය. අමාට යෝජනා කර තිබූ Boy ගේ අම්මා විසින් ඒ කටයුත්ත ඉක්මන් කරන බව එහි සඳහන් කර තිබුණි. ඒ පණිවිඩයෙන් මගේ සිත තවත් නොසන්සුන් වන්නට වූ නිසාවෙන් රාත්‍රියේ නින්ද යාමටද ප්‍රමාද විය .

අද ඉරිදා දිනයක් නිසාවෙන් අම්මා ඇවිත් මාව අවදි කරන තුරුම මා හට නින්ද ගොස් තිබුණෙමි. අවදි වී දුරකථනය අතට ගත් විගසම අමා ගෙන් කෙටි පණිවිඩයක් ලැබී ඇති බව දුටුවෙමි. අම්මා සහ නැන්දා ගෙදර නොමැති බැවින් ඉක්මනින්ම

sinhalaebooks.com



ඇයව මුණගැසීමට පැමිණෙන ලෙස එහි සඳහන් කර තිබුණි. එසැනින් මුහුණ සෝදා පිරිසිදුවී මා අම්මගෙන් අවසර ගෙන අමා ගේ නිවාස බලා පිටත් උනෙමි.

අමා ගේ නිවාස වෙත යන විට වෙනදා මෙන් ඇය ගේ දොරකඩට පැමිණ සිටියේ නැත. ගේට්ටුව ඇර ඇතුළු වූ මා නිවසේ ප්‍රධාන දොර ඉදිරියට ගොස් අමාව අමතමින් දොරට තට්ටු කලෙමි.

"අමා..."

"එන්න අංජලී ඇතුලට...."

දොර විවෘත්ත කරගෙන නිවසට ඇතුළු වූ මා අමාගේ කාමරය වෙත ගියෙමි. මා යන විට ඇය සයනයේ කොනක වාඩි වී මුහුණත් වසාගෙන කඳුළු සලමින් සිටියෙමි. මා ඇගේ අසලින් වාඩි වූ විගසම ඇය මාව වැළඳගෙන හඬාවැටෙන්නට විය. මා ද ඇයව තදින් වැළඳගෙන ඇගේ හිස අතගාමින් සනසන්නට උත්සහ කලෙමි.

"අනේ අංජලී.... මට ඔයාව නැති කරගන්න බෑ...."

"හරි පැටියෝ.... එහෙම නැතිවෙන්න දෙන්නේ නෑ.... මං ඔයත් එක්ක ඉන්නවනේ..." මා අමාව කෙතරම් සැනසීමට උත්සහ කලත් පලක් නොවුනෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com



පෙර දින රාත්‍රියේ නිදිවර්ජිතව සිටි මට නින්ද යනවිට පාන්දර වී තිබුණි. වෙනදාට මා අවදිවීමට ප්‍රමාද වුවහොත් අම්මා විසින් මාව අවදි කෙරුවත් අද එසේ නොවීය. ප්‍රමාද වී අවදි වූ මා අම්මව සොයමින් මුළුතැන් ගෙට ගියෙමි. එහි ඇය නොසිටි නිසාවෙන් මා ඇගේ කාමරය වෙතට ද ගියෙමි. එහි ද ඇය පෙනෙන්නට නොවීය. නැන්දා නම් උදෑසන කොහේදෝ යන බව මා දැන සිටි නමුත් අම්මා කොහෙවත් යන බවක් මා හට පවසා නොතිබුණි. සමහර විට අම්මා නැන්දා සමග ගියා දැයි සිතුනත් මා හට නොකියා ගියේ ඇයි දැයි සිත තුල ප්‍රශ්නයක් නැගෙන්නට උනෙමි. පෙර දින සිදු වූ සිදු වීම සමුදාය සහ මෙය ද හේතු කරගෙන සිතට ඇති වුනු දැඩි වේදනාව නිසාවෙන් මා අංජලීට අපේ නිවසට පැමිණෙන ලෙස කෙටි පණිවිඩයක් යැව්වෙමි.

වැඩි වෙලාවක් යන්නට මත්තෙන් අංජලී අපේ නිවසට පැමිණියහ. ඇය මා අසලට පැමිණි විගසම මා ඇයව වැලඳගනිමින් හිතේ තිබූ වේදනාව පිටකෙරුවෙමි. ඇය කොතරම් මා සැනසීමට උත්සහ කලත් සිතේ ඇති වී තිබූ වේදනාව දරාගත නොහැකිව ඇගේ උණුහුමට තුරුළු වී කඳුළු

sinhalaebooks.com



සැලුවෙමි. මෙසේ සුලුමොහොතක් ගතවෙද්දී එකවරම අම්මා කාමරයට පැමිණෙන්නට විය.

"අම්මා... "

මා එසේ කියමින් අංජලී ගේ තුරුලෙන් මිදුනෙමි. ක්ෂණිකවම අපි දෙදෙනා දෙපසට වූ අතර අම්මා අපි අසලට පැමිණෙන්නට උනෙමු.

"අංජලී දුව.... ඔයා ටිකකට එලියට යනවද?.... මට අපේ දුව එක්ක ටිකක් කතාකරන්න ඕනේ...."

අපි අසලට පැමිණි අම්මා එසේ පවසන්නට වූ අතර අංජලී කිසිවක් නොකියා බිම බලාගෙන කාමරයෙන් පිටව ගියහ.

"දුව ඔයා අඬන්නේ නැන්දගේ යෝජනාවට අකමැති නිසා නේද?....."

"කිසිවක් කියාගත නොහැකිව ගොළු වූ මා අම්මව වැළඳ ගනිමින් තවත් හයියෙන් අඬන්නට වූ අතර අම්මා ද හඬමින් මෙසේ පවසන්නට විය.

"ඉතින් කියන්න දුව.... ඇයි ඔයා එදා මං අහපු වෙලාවේ අකමැතී කිව්වේ නැත්තේ..... මම මේකට මුලින් කැමති වෙලා හිටිය තමයි. ඒත් මම පස්සේ තීරණය කළා මේක නොකර ඉන්න. දුව මුලින්ම අකමතී කිව්වනම් මෙච්චර දුරක් වත් එන්න දෙන්නේ නෑ දුව....."

"මං කොහොමද ඒක කියන්න.... " මා තවත් ඉකිගසමින් හඬාවැටුනෙමි.

"ඔයා දන්නවා නේද?.... මම ඔයාට ගොඩක් ආදරෙයි කියල ආ..... මම ඔයාගේ අම්මනේ දරුවෝ... පුංචි කාලේ ඉඳලම ඔයා හැමදේම බෙදාගත්තේ මාත් එක්ක නේද.... ඉතින් ඇයි මට කියන්න බැරි ඔයාගේ හිතේ තියනේ දේ.... මට ඕනේ ඔයාගේ

RAY PUBLISHING

sinhalaebooks.com



සතුට විතරයි දුව.... ඒ වෙනුවෙන් මම හැම වෙලාවේම ඔයත් එක්ක ඉන්නවා. දැන් අඬන්න එපා මගේ මණික.... කොහොමත් මම මේ මගුල කරන්නේ නෑ.... "

අම්මා මෙසේ කියද්දී ඇයගේ තුරුලට වී දෙනෙත් පියාගෙන අඬන්නට වූ මා කවුරුන්දෝ අපි දෙස බලා සිටින සේයාවක් යාන්තමට දුටු නිසාවෙන් දෙනෙත් විවර කලෙමි. ඒ මොහොතේ දුටු දර්ශනයෙන් මා තවත් කම්පනයට පත් උනෙමි. රොෂාන් අපි පිටුපසින් සිටින්නට විය.

"අම්මා රොෂාන්......"

එකවරම තිගැස්සී දෙපසට වූ අම්මා සහ මා කිසිවක් සිතාගත නොහැකිව රොෂාන් දෙස බලාසිටියෙමු. ශාන් ඔහුව මුණගැහුණු නිසා අපේ ප්‍රශ්නය තවත් පටලැවුනා දැයි මගේ සිහියට නැගෙන්නට විය. එම මොහොතේම ඔහු කිසිවක් නොකියා කාමරයෙන් පිටව ගොස් අංජලී ගේ අතින් අල්ලාගෙන නැවතත් අපි අසලට පැමිණියහ. අපි තිදෙනාම මේ සිදුවන්නට යන්නේ කුමක් දැයි සිතාගත නොහැකිව රොෂාන් දෙස බලා සිටියෙමු.

"පුතා ඔයා මෙහෙ...."

අම්මා මා අසලින් නැගිට පසෙකට වී රොෂාන් ගෙන් එසේ අසන්නට වූ අතර එයට උත්තර නොදුන් රොෂාන් අංජලීව මා අසලින් වාඩි කරන්නට විය.

"මෙහෙට දෙන්න ඔයා ගේ අත...."

රොෂාන් ඔහු ගේ අතක් මා දෙසට දිගු කොට මගේ අත ඔහුගේ අල්ල මතින් තබන තුරු බලා සිටියත් මා කිසිවක් නොකර අංජලී දෙස බලා සිටියෙමි.

RAY PUBLISHING

sinhalaebooks.com





"කෝ මෙහාට දෙන්න ඉතින්...."

ඔහු නැවතත් මගේ අත ඉල්ලූ අතර මා සෙමින් සෙමින් මගේ අත ඔසවා ඔහුගේ අත්ල මත තැබුවෙමි. පසුව අංජලීගේ අත ද අල්ලාගෙන මගේ අත උඩින් තබන්නට විය. අම්මා කිසිවක් සිතා ගත නොහැකිව සිදුවන්නේ කුමක් දැයි විශ්මයෙන් මෙන් බලා සිටියහ.

"මට ඔයාල දෙන්න ගේ යාළුවා හැම දේම කිව්වා.... ඉතින් මං තවදුරටත් ඔයාල දෙන්නගේ ආදරයට බාදාවක් වෙන්නේ නෑ... එහෙනම් All the best...."

රොෂාන් සිනහ මුසු මුහුණින් එසේ පවසන්නට වූ අතර ඒ මොහොතේ අපි දෙදෙනාට පුදුම සහගත හැඟීමක් සහ කියාගත නොහැකි ප්‍රීතියක් සිත තුළ ඇති වන්නට විය. නෙතට නැගෙන සතුටු කඳුළු පිසදමමින් අම්මා ද අපි දෙදෙනාගේ හිස් පිරිමදින්නට වූ අතර අපි දෙදෙනා තදින් වැළඳගෙන සිතේ උතුරා ගිය සතුට බෙදාගත්තෙමු. අපි දෙදෙනාගේ සතුට දැක රොෂාන් ද බෙහෙවින් සතුටු වූ බව ඔහුගේ මුහුණින් නිරූපණය විය. ඒ මොහොතේ ම අම්මා රොෂාන්ට ස්තුති කල අතර අපි දෙදෙනාද ඔහුට ස්තුතිය පුදකලෙමු. පසුව රොෂාන් පිටව යන්න සැරසුණි.

"එහෙනම් මම යනවා නැන්දේ.... ඔයදෙන්නත් හැමදාම සතුටින් ඉන්න ඕනේ..... Bye.... "

"ඔයාටත් වරදින්නේ නෑ පුතා කවදාවත්.... Bye.... " අම්මා එසේ පවසද්දී අපි දෙදෙනා ද ඔහුට සමුදුන්නෙමු. රොෂාන් කාමරයෙන් පිටව යන්නට සැරසෙද්දීම මෙතෙක් සියල්ලන්ගේම සිත් වල පිරී ඉතිරී ගිය සතුට එක් නිමේෂයකින් විනාශ කරමින් නැන්දා එකවරම කාමරයට කඩාවදින්නට විය. රොෂාන් කිසිවක්

RAY PUBLISHING

sinhalaebooks.com



නොකියා කාමරයෙන් පිටව ගිය අතර නැන්දා කේන්තියෙන් පුපුරමින් මෙසේ පවසූහ.

"මං හැමදේම අහගෙන හිටියේ.... අපිට මේ ගමේ පාරේ බැහැල යන්න නැති කරන්නේ නැතුව මේ දැම්ම මේ ගෙදරින් දොට්ට බහිනවා...."

"අනේ නැන්දා ඇයි මේ..... අපි කොහේ කියල යන්නද එකපාරටම...."

"උඹ දන්නේ නෑ.... බබා.... අයියට එන්න කියන්න කලින් බැහැපන් එළියට.... ඇයි උඹලට ගෙයක් තියෙන්නේ පලයන් එහෙ...."

"අක්කේ මේ...... මගේ දරුවන්ට මුකුත් කියන්න ලෑස්තිවෙන්න එපා.... කොහොමත් අපි යනවා තමයි...."

"හරි.... මං උඹලට තව විනාඩි 10යි දෙන්නේ..... " නැන්දා එසේ කියමින් කාමරයෙන් පිටව ගියහ.

"අනේ අම්මා අපි දැන් මොකද කරන්නේ.... මේ වේලාවේ කොහේ කියල යන්නද ඒක පාරටම...."

"හරි දුව අපි මොකක් හරි කරමුකෝ.... දැන් දෙන්නම එකතු වෙලා ඇඳුම් ටික ලෑස්ති කරගන්නකෝ..." එසේ කියමින් අම්මා කාමරයෙන් පිටව ගියහ. එම මොහොතේම අංජලී මෙසේ පවසන්නට විය.

"ඔයාල බයවෙන්න එපා.... යමු අපේ ගෙදර.... මං අම්මට කතා කරන්නම් දැන්...."

"අනේ අංජලී එහෙම කරන ඒක හරි නෑ නේද.... අනික ඔයාලටත් කරදරයක් නේ...."

RAY PUBLISHING

sinhalaebooks.com



"මොන කරදරයක් ද ළමයෝ.... මං අම්මට කතාකරන්නම් ඔයා ලෑස්ති වෙන්නකෝ...."

එසේ කියමින් අංජලී දුරකථනය අතට ගෙන ඇගේ අම්මට ඇමතුමක් ගත් අතර මා අපේ ගමන් මල්ල අතට ගෙන ඇඳුම් අසුරන්නට පටන් ගත්තෙමි. අම්මා ගේ ඇමතුමෙන් පසු අංජලී සිනහමුසු මුහුණකින් නැවතත් මා අසලට පැමිණ මෙසේ පවසබන්නට විය.

"හරි අමා.... මං අම්මට කිව්වා.... අපේ ගෙදර යමු...."

"අනේ මන්ද අංජලී.... අපේ අම්මා මොනවා කියයි ද දන්නේ නෑ...."

"හරි හරි මම අම්මට කියන්නම් කෝ...."

අංජලී එසේ පවසද්දී අම්මා ඇගේ ඇඳුම් බෑගය ද අතැතිව කාමරයට පැමිණෙන්නට විය.

"හරිද ළමයි?...."

"හරි අම්මා මට ඇඳුමක් දාගන්න විතරයි තියෙන්නේ...."

මේ අතරේ අංජලී අපේ අම්මා ලඟට ගොස් මෙසේ පවසන්නට විය.

"අම්මා.... ඔයාලට අපේ ගෙදර යන්න පුළුවන්"

"අනේ දුව.... ඔයාලට කරදර කරන්න පුලුවන්ද එහෙම...."

"මොන කරදරයක් ද අම්මා..... මං දැන් අපේ අම්මට කතා කරලාත් එක්ක තියෙන්නේ...."

RAY PUBLISHING

sinhalaebooks.com



අම්මා මද වේලාවක් අංජලී ගේ මුහුණ දෙස බලා හිඳ එකවරම ඇයව වලන්දගන්නට විය. පසුව අම්මා මාවත් ලඟට ගෙන අපි දෙදෙනාවම ඇගේ තුරුලට ගත්තාහ.

"මට දැන් දුවල දෙන්නයි...."

එසේ පවසමින් ඇය අංජලී ගේ සහ මාගේ නළල සිපගන්නට වූ අතර අපි තිදෙනාගේම සිත් වල නැවත සතුට පිරුණු හෙයින් තිදෙනාගේම දෙනෙත් සතුටු කඳුලින් බර විය.

RAY PUBLISHING

sinhalaebooks.com



වැඩි දුරක් නොවූ හෙයින් අපි තිදෙනා පා ගමනින්ම අපේ නිවසට පැමිණියෙමු. නිවසට යන විට අපේ අම්මා නිවසේ ඉදිරියට වී අප එන මග බලා සිටිනු මා දුටුවෙමි.

"ආ.... එන්න නංගි.... කොච්චර කාලෙකින්ද මේ දකින්නේ...."

"ඒක නේන්නන්.... අපි හින්ද ඔයාලටත් කරදර වෙන්න උනානේ...."

"මොන කරදරයක් ද නංගි.... දුව මට හැමදේම කිව්වා.... අපි ගෙට ගිහින් ම කතා කරමු කෝ "

අමා සහ අම්මාව නිවසේ සාලයට කැඳවාගෙන ගිය මා ඔවුන්ගේ ගමන්මලු ඉල්ලගෙන පසෙකින් තබා ඔවුන්ට අසුන්ගන්න ලෙස පවසමින් සෝපාව පෙන්නුවෙමි.

"පයින්ම ආපු නිසා නංගිලට මහන්සිත් ඇති නේ.... මං බොන්න මොනවහරි හදාගෙන එන්නම්.... එතකන් නංගි මුහුණ ටිකක් හෝදගන්නවද?...."

RAY PUBLISHING

sinhalaebooks.com



"ඒක නම් හොඳයි අක්කේ...."

"දුව ඔයාගේ කාමරේට එහා පැත්තේ කාමරේ ලෑස්ති කරලා තියෙන්නේ.... අම්මලට පෙන්නන්නකො..."

අම්මා කී පරිදි අමාලට නිදන කාමරය පෙන්නුවෙමි. මද වෙලවකට පසු අපේ අම්මා බීම විදුරු තුනකුත් රැගෙන කාමරයට පැමිණියහ. අම්මා අමාලගේ අම්මා සමග කතාවකට එක්වූ අතර අමා සහ මා මගේ කාමරයට ගියෙමු.

"අංජලී.... අනේ අපි ඔයාලට කොහොම ස්තුති කරන්නද මන්ද...."

"ස්තුති කරන්න දෙයක් නෙවෙයි අනේ... මං කොහොමත් කිව්වනේ එන ඕනෙම දේකට මං ඔයත් එක්ක ඉන්නවා කියල..."

"ඔයා නොහිටින්න මගේ ජීවිතේට මොනවා වෙයිද කියල හිතාගන්න බෑ අංජලී.... "

"දැන් ඔයාලට කැමති දවසක් මෙහෙ ඉන්න පුළුවන් හරිද...."

"ඒ උනාට අපේ ගෙදරට යන්න ඕනේනේ...."

"නෑ නෑ මම ඔයාගේ අම්මා එක්ක කතාකරන්නම් කෝ..... "

"ඔයාව දාල යන්න මටත් බෑ තමයි ඉතින්.... මේ ඒක නෙවෙයි.... අපි ශාන්ට කතා කලොත් හොඳයි නේද..."

"මං එයාට කතාකරන්න Try කරන්නේ අර Boy එකපාරටම කාමරේට ආපු වෙලාවේ ඉඳල.... මං හොඳටම බය උනා ඒ වෙලාවේ.... මේකාගේ Phone එක වැඩ කලේ නෑනේ... "

RAY PUBLISHING

sinhalaebooks.com



"අම්මටයි මටයිත් හිතාගන්න බැරි උනා මොකද්ද කරන්නේ කියල....."

"ඒක නෙවෙයි..... දැන් ශාන්ට කතාකරන්න බෑ නේ... අම්මලත් ඉන්නවනේ.... අපි හෙට දවල්ට එයාව Meet වෙමු"

"ඔව් ඒකත් ඇත්ත නේද.... මේ... ඉතින් අපි ඉස්සරහට මොකද කරන්නේ...."

"මට අම්මා කිව්වා එයා දන්න Office එකක Vacancies තියනවා කියල. දන්න තැනක් නිසා Job එකක් සෙට් කරගන්න බැරි වෙන එකක් නෑ කිව්වා..... ඔයත් මෙහෙ ඉන්නවා නම් ඔයාටත් මොකක් හරි කරගන්න බැරි වෙන එකක් නෑ...."

"බලමුකෝ....."

"අමා..... මම හිතන් ඉන්නේ ඉකමනටම අපේ අම්මලටත් අපි ගැන කියන්න.... ඒත් ප්‍රශ්නෙකට තියෙන්නේ ඔයාලට ප්‍රශ්නයක් වෙයි ද කියල...."

"මොන දේ උනත් ඕනෙම දෙකට මමත් ඔයත් එක්ක ඉන්නවා...."

මේ මොහොතේ අපේ අම්මා මට කතාකරනවා ඇසුණු හෙයින් අපේ කතාව මෙතනින් නිමා කරන්නට උනෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



*2000/08/24*

අමා සහ ඇගේ මව අපේ නිවසට පැමිණ දින තුනක් පමණ ගතවිය. උදෑසන මා අමා සමග අපේ නිවසේ පෝටිකෝවේ තිබූ ආසනයක අසුන් ගෙන පත්තරයක් බලමින් සිටියෙමු. එකවරම යතුරුපැදියකින් පැමිණි කොවුදෝ පුද්ගලයෙක් ගේට්ටුවට තට්ටු කරන්නට විය. ශාන් පැමිණෙන බවක් වත් නොදන්වූ හෙයින් මේ මොහොතේ පැමිණෙන්නේ කවුදැයි සිතමින් මා ගේට්ටුව අසලට ගියෙමි.

"නෝනා.... අමා කියල නෝනා කෙනෙක් ට ලියුමක් තියනවා දෙන්න.... එහෙම කෙනෙක් මෙහෙ ඉන්නවද?...."

"ඔව් එහෙම කෙනෙක් ඉන්නවා.... මහත්තයා කවුද?...."

මොහු කවුරුන්දැයි නොදන්නා නිසාවෙන් මා අමාට කතා නොකර එසේ ඇසුවත් එයට පිළිතුරක් නොදුන් ඔහු හැඳ සිටි කබාය අස්සෙන් ලියුම් කවරයක් ගෙන මා වෙත දිගුකරන්නට විය.

"නෝනා.... ඕක අමා නෝන ගේ අතටම දෙන්න"

RAY PUBLISHING

sinhalaebooks.com



එසේ කී ඔහු යතුරුපැදිය පනගන්වා වේගයෙන් පිටව යන්නට වූ අතර අමා මා වෙත දුවගෙන පැමිණ කවුදැයි විමසන්නට විය.

"අංජලී.... කවුද ඒ..."

"අනේ මන්දා අමා.... මෙන්න මේක ඔයාට දෙන්න කිව්වා."

මා එසේ පවසමින් ලියුම් කවරය අමා ගේ අතේ තැබුවෙමි. මිදුලේ හිඳම ලිපිය කියවූ අංජලී ගේ දෙනෙත් කඳුලින් බරවන්නට වූ අතර ඇය ඒකවරම අම්මව අමතමින් නිවස තුළට දුවන්නට විය.

RAY PUBLISHING

sinhalaebooks.com



මා සහ දුව අංජලී දුවගේ නිවසට පැමිණ මේ වනවිට දින තුනක් පමණ ගත වී ඇත. අංජලී ගේ දෙමවුපියන් උදෑසනම රැකියාවට පිටත් වූ නිසාවෙන් නිවසේ ඉතිරිව ඇත්තේ මාත් දුවත් සහ අංජලී දුවත් පමණි. සුපුරුදු පරිදි මා සයනයට වී පොතක් කියවීමට ගත්තත් මේ දින කිහිපයේ සිදු වූ සිදුවීම් නිසාවෙන් එයට මනසේ නිදහසක් නොවීය.

මගේ දුව ගේ හොඳම මිතුරිය වූ අංජලී දුව ද සැබවින්ම හොඳ ගුණ යහපත් තරුණියකය. පාසල් කාලයේ සිටම මා එය හොඳින් දන්නා කාරණයකි. නමුත් ඇය හා මගේ දුව අතර මෙවැනි සබඳ කමක් ඇති වේ යැයි මා කිසිදිනක නොසිතූ දෙයක් වූ නමුත් දුවගේ ජීවිතයේ සතුට ඇත්තේ ඇය ළඟ පමණක් බව මා හට හොඳින්ම පසක් වූ නිසාවෙන් මා ඔවුන් දෙදෙනාට විරුද්ධ නොවුනෙමි. මෙසේ විවිධ දේ පිළිබඳව කල්පනා කරමින් සිටින අතරවාරයේ මගේ දුව සහ අංජලී දුව මා අමතමින් කාමරයට දුවගෙන එන්නට විය. ඒ මොහොතේ දුවගේ දෙනෙත් කඳුලින් පිරී තිබෙනු මා දුටුවෙමි.

"දුව... මොකද මේ... "

මා එසේ ඇසුවත් ඇය කිසිවක් නොකියා ඇගේ අතේ තිබූ ලියක් මා වෙත් දිගු කරන්නට විය. මා එය ඉකමනින් ම දිගහැර බැලුවෙමි. එය එවා තිබුනේ ඇගේ පියා විසින් ය. තවදුරටත් කිසිවක් සඟවා සිටීමෙන් පලක් නොවන බව පසක් වූ නිසාවෙන් සියල්ල දුව වෙත හෙළි කෙරීමට තීරණය කලෙමි.

"දුව මෙතනින් වාඩි වෙන්නකෝ.... මං හැමදේම කියන්නම්...."

sinhalaebooks.com



"මං එහෙනම් එළියට යන්නම්...."

අංජලී දුව එසේ කියමින් කාමරයෙන් එළියට යන්නට සැරසුණි. නමුත් මා ඇයට ද අමා අසලින් වාඩි වෙන ලෙස පැවසමින් මා කතාව ආරම්භ කලෙමි.

"දුවට මතකයි නේ තාත්ත අන්තිමට ඇවිත් ගිය වතාව. ඒ ඇවිත් ගිහින් මාසෙකට පස්සේ දවසක් එයාගේ වැඩපොළේ යාලුවෙක් අතේ පණිවිඩයක් එවල තිබුණා මට එයාට කතා කරන්න කියල..... මට ඔයාගේ Phone එකෙන් කතාකරන්නත් බෑ.... ඉතින් මං හන්දියට ගිහින් කඩේකින් Call එකක් අරන් තාත්තට කතාකලා. එයා කිව්වා එයා අතින් ලොකු වරදක් උනේ.... ඒ හැමදේටම මගෙනුයි දුවගෙනුයි සමාවගන්න ඕනේ කියල.... තාත්ත එයා නිසා ඔයාට වෙච්චා දේවල් ගැන කියල ගොඩක් දුක් උනා.... ආයේ බොන එකත් නවත්තනවා කිව්වා.....

"ඉතින් තාත්ත ඒක පාරටම එහෙම කියන්න හේතුව මොකද්ද අම්මා?..."

"මාත් ඕකම ඇහුව තාත්තාගෙන්.... එය කිව්වා, එයාට වැඩපලේ දී නුවර ඉන්න යාලුවෙක් හම්බ උනාලු. එයා අලුතින් වැඩට ආපු කෙනෙක්. එයා නැන්දවයි මාමවයි හොඳට දන්නා කෙනෙක්. මට දැන් තාත්තාගෙන් පණිවිඩ ගේන්නෙත් එයා තමයි. මාම සමහර වෙලාවට මෙයත් එක්ක බොන්නත් සෙට් වෙනවලු. ඒ කියන්නේ එයා තාත්තගේ වැඩපලේ වැඩට යන්න කලින්. මාමා බීපු වෙලාවක කියපු කතාවක් එයා තාත්ත එක්ක කතා කර කර ඉන්නකොට තාත්තට කියල තියනවා. "

"ඉතින් එයා මොනවද කියල තියෙන්නේ?....."

FAY PUBLISHING

sinhalaebooks.com



"එයා කියපු විස්තරේ තාත්ත මෙහෙ ආවහම කියන්නම් කිව්වා... කොහොම නමුත් තාත්ත කියනවා මේ හැම දෙයක්ම වෙන්න හේතුව නැන්දයි මාමයි ලු..."

"මං තාත්තා ගෙන් ඇහුව කොහොමද එහෙම වෙන්නේ.... නැන්ද නේ දුව අපි අසරණ වෙච්ච වෙලාවේ අපිට ඉන්න ටික හරි දුන්නේ.... "

"ඒකනේ...... ඉතින් නැන්දල කොහොමද මේවට සම්බඳයි කියන්නේ?...."

"දුව අපි බැඳපු මුල් කලේ ඉඳලම තාත්ත කිව්වා අපේ ගේ එයාගේ නමට ලියන්න කියල. මං ඒකට කැමති උනේ නෑ... මං ඇහුව ඇයි එහෙම කරන්නේ.... කවදහරි මේවා දරුවටනේ කියල.... මං එහෙම කියල මග හැරියා... අපේ රණ්ඩු පටන්ගත්තේ ඔතනින්.... තාත්ත කියනවා ඒ හැමදේම නැන්දගේ කීමට වෙච්ච දේවල් ලු. ඒ කාලේ නොතේරුනාට නැන්දාගේ අදහස තිබිල තියෙන්නේ මගෙන් දේපල ටිකත් අරන් මාව එලවල කොහොම හරි දේපල එයාගේ නමට ගන්නලු. අර එයාගේ යාළුවා කියපු දෙකින් තමයි ලු හැමදේම තේරුනේ.. අනික ඔය මාමා අපිට හොරෙන් කොළඹ ඇවිත් තාත්තට බොන්න දීල මං ගැන සැහෙන්න වැරදි කියනවලු. තාත්තා ඉස්සර ඉඳලම වැඩිය ගෙදර නැනේ. ඉතින් තාත්තා එයාල කියන දේ අහගෙන ඇවිත් තමයි මාත් එක්ක රණ්ඩු වෙන්නේ... "

"එතකොට ඔය තාත්තගේ යාළුවා කියන කෙනා තාත්තව දන්නව කියල මාමා දන්නේ නැද්ද?"

"නෑ දුව.... එයා තාත්තගේ වැඩපලට ආවට පස්සේ මාමව මුණගහිලම නෑ.... අනික තාත්ත එයාට ඔය මට කිව්වා විස්තරේ කියල තියනවා. ඉතින් ඒ මනුස්සය තමයි තාත්තට දැන් උදවු කරන්නේ හැමදේටම..."

RAY PUBLISHING

sinhalaebooks.com



"අනේ මන්ද අම්මා.... මේවා කොහොම විස්වාස කරන්නද කියල.... ඇයි අම්මා මේ දේවල් මට කිව්වේ නැත්තේ.... මං අංජලී එක්ක කියා කියා කොච්චර ඇඬුවද...."

"මට ඒ දේවල් ඒ අවස්ථාවේ කියන්න පුළුවන් කමක් තිබුනේ නෑ දුව.... ඔයා කලබල උනොත් ලොකු ප්‍රශ්නයක් වෙනවනේ... අනික තාත්තත් කිව්වා ඔයාට මේවා දැන්ම කියන්න එපා කියල"

මද වෙලාවක් නිහඬව හිඳ නැවතත් දෑසේ කඳුළු පිසදමමින් දුව මෙසේ අසන්නට විය.

"එතකොට අම්මා දැන් අපේ ගේ විකුණපු කතාව මොකද්ද?..."

"ආ මං කතාවේ ඉතුරු ටික කිව්වේ නැනේ.... තාත්ත එක්ක ඔහොම ටික දවසක් කතා කර කර ඉන්නකොට එයා කිව්වා එයා එකතු කරපු සල්ලි ටිකක් තියනවා ඒ ටික දාල කොළඹ ගෙයක් කුලියට ගන්නම්. ඔයාගේ Class ඒක ඉවර උන ගමන් එහෙ එන්න කියල..... නමුත් මං කිව්වා අපි අපේ ගේ විකුණලා එකපාරම කොළඹින් ගෙයක් ගම්මු. මොකටද කුලියට යන්නේ කියල. තාත්තා ඒකට කැමති උනා. නමුත් තාත්ත කිව්වා මේක නැන්දට හොරෙන් කරන්න ඕනේ කියල. මොකද නැන්දා දැනගත්තොත් අපි ගේ විකුණනවා කියල අපිටත් ප්‍රශ්න ඇතිකරන්න ඉඩ තියනවනේ. ඔයාට කිව්වෙත් නෑ... තාත්තයි මායි කතා උනා දැම්ම ඔයාට නොකිය ඔයාව අලුත් ගෙදරට එක්ක ගිහින් පුදුම කරන්න. ඉතින් ඔය විදිහට කතාකරගෙන ඉන්න අතරේ තමයි නැන්දා ඔයාට යෝජනාව ගෙනාවේ. වසුන්දරාව මං දන්නා නිසා මාත් ඒකට අකමැති උනේ නෑ. නමුත් ඊට දවස් කීපයකට පස්සේ තාත්ත මට පණිවිඩයක් එවල තිබුණ අපේ ගේ ගන්න කෙනෙක් ඉන්නවා, මාත් එක්ක ඒ ගැන කතා කරන්න ඕනේ කියල. මං ඉතින් වෙනද වගේ එයාට කතා කරහම නැන්දගේ යෝජනාව ගැනත් කිව්වා. තාත්ත කැමති උනේ නෑ.... ඒකත් එයා මොනවා හරි දෙකට ප්ලෑන් කරලා

RAY PUBLISHING

sinhalaebooks.com



කරන දෙයක් වෙන්නත් පුළුවන් කිව්වා.... මටත් එතකොට තමයි ඒක මතක් උනේ.... පස්සේ ඔයාගේ Class ඉවර වෙන දවසට දවස් තුනකට විතර කලින් තාත්ත ආයෙත් මට කතා කළා ගේ වැඩේ හරි ගියා, ගෙයි ඔප්පුව ඕනේ කියල. එයා ගෙනියන්න එන්නම් කිව්වා නැන්දා නැති වෙලාවක් කියන්න කිව්වා. ඒ වෙලාවේ කිව්වා ඔය වසුන්දරා ලත් එච්චර හොඳ මිනිස්සු නෙවෙයි ඒ නිසා කොහොමටත් මගුල කරන්න දෙන්න එපා කියල. තව විස්තර තියනවා ආපුවහම කියන්නම් කිව්වා. කොහොමත් මං ඒ වෙනකොටත් තීරණය කරලා තිබුනේ මේ මගුල නොකර ඉන්න. නමුත් මේ වෙලාවේ නැන්දට කියන්නත් බෑ... අනික ඔයත් කැමති වෙලා නේ හිටියේ.... මොකද්ද ඉතින් කරන්නේ කියල තාත්ත ආපුවහම එයත් එක්කත් කතාරනවා කියල හිතාගත්තා. ඊට පස්සේ Class එකේ අන්තිම දවසට කලින් දවසේ හවස තාත්තා නැන්දලගේ ගෙදරට ආව ඔප්පුව ගෙනියන්න. ඒ වෙලාවේ තාත්තා කිව්වා එයාගේ යාළුවා එක්කත් තාත්තා මේ මගුල ගැන කතා කරාලු. යාලුවත් කිව්වලු මේ මගුල කීයටවත් කරන්න එපා කියල. ඉතින් මං තාත්තාගෙන් ඇහුව දැන් නැන්දට මොකද්ද කියන්නේ කියල.... තාත්ත කිව්වා දැන්ම මුකුත් කියන්න ඕනේ නෑ... කැමතී වගේ ඉන්න. අලුත් ගේකුත් බලල තියෙන්නේ... තව සති දෙකක් විතර යනකොට අපිට මෙහෙන් යන්න පුළුවන් කියල. එතකන් කිසිම දෙයක් නොකිය ඉඳල අපි ගියාට පස්සේ මේකට කැමති නෑ කියමු කියල. එතකොට ඔයාටත් හිමින් සැරී හැමදේම පැහැදිලි කරලා දෙන්න පුළුවන්නේ.... අපි ඉතින් එහෙම හිතාගත්තට රෑ නැන්දා ඇවිත් සෙනසුරාදට වසුන්දරාලට මෙහෙ එන්න කියමු කිව්වනේ.... දැන් මුකුත් කියන්න බැරි නිසා ඒකටත් කැමති උනා. නමුත් මං හිතාගෙන හිටියේ තාත්තා එපා කිව්වට සෙනසුරාද වසුන්දරා ල ඇවිත් ගියාට පස්සේ ඔයාට මේ මගුල කෙරෙන්නේ නෑ කියන්න. නැන්දා නැති වෙලාවක් වෙන්නත් ඕනේ නිසා ඉරිදට කතාකරනවා කියාල හිතාගත්ත.... ඒ අතරෙ රෑ නැන්දා ඇවිත්

RAY PUBLISHING

sinhalaebooks.com



මගුල තවත් ඉක්මන් කරන්න හැදුවනේ... මටත් නැන්දා එක්ක එදා නම් හොඳටම කේන්ති ගියා. ඒත් ඉතින් මුකුත් කියන්න බැනේ... කොහොමත් උදේට ඔයත් එක්ක කතාකරන නිසා මං මුකුත් නොකිය හිටිය. නැන්දා උදේම යනවා කියපු නිසා මං හිතන් හිටියේ උදේම ඔයත් එක්ක මේ ගැන කතා කරන්න. ඒත් උදේ මටත් නැන්දා එක්ක යන්න උනා.... ඒ ගිහින් මං දවල් එන ගමන් තාත්තටත් කතා කරලා විස්තරේ කිව්වා. තාත්තා ඒ වෙනකොටත් අපේ ගේ විකුණලා කොළඹින් ගේකුත් බලල තිබුනේ. ඒක ගන්න තව සතියක් විතර යනවා කිව්වා. තාත්තා එක්ක කතා කරලා මම ඉක්මනටම ගෙදර ආවේ නැන්දා එන්න කලින් ඔයත් එක්ක කතා කරන්න. ඊට පස්සේ වෙච්ච දේ ඉතින් දන්නවනේ. මෙහෙ ආවට පස්සේ පහුවදාම මම තාත්තට කතා කරලා වෙච්ච හැමදේම කිව්වා. තාත්තා කිව්වා අපි එහෙනම් කොළඹ ගේ දැන්ම නොගෙන දුවලත් එක්ක කතාකරලා බලලම තීරණයක් ගමු කියල. හෙට තමයි තාත්ත එනවා කියල කිව්වේ. එන්න බැරිවෙන නිසා වෙන්න ඇති මෙහෙම ලියුමක් එවන්න ඇත්තේ..."

මෙතෙක් කල් සඟවාගෙන සිටි ඒ දීර්ඝ කතා පුවත මා මෙසේ පවසා නිමා කෙරුවෙමි. දුව මද වෙලාවක් නිහඬව බිම බලාගෙන හිඳ මාව වැළඳ ගන්නට විය. මේ අතර මෙතෙක් නිහඬව මගේ කතාවට සවන් දී ගෙන සිටි අංජලී දුව ද අමා ගේ හිස පිරිමදිමින් මෙසේ පැවසුහ.

"ඔන්න එහෙනම් කෙල්ලට දැන් හැමදාම සතුටින් ඉන්න පුළුවන්...."

එසේ පවසද්දී අමා සුරතල් සිනහවක් පාමින් දෙනෙතේ කඳුළු පිසදන්නට වූ අතර අයගේ ඒ සිනහව දුටු මාගේ සිත ද සතුටින් පිරී ඉතිරී යන්නට උනෙමි.

sinhalaebooks.com



2000/08/28

අමා ගේ තාත්තා එවූ ලිපියත් සමග අම්මා සියලු රහස් හෙළිකිරීම නිසාවෙන් අමා ගේ ජීවිතයේ සතුට තවත් වැඩි විය. කුඩා දරුවන් මෙන් විවිධ සෙල්ලම් කරමින් වෙනාදාටත් වඩා සතුටින් කෙළිදෙලෙන් ජීවිතය ගත කරන අමා දැක ඇගේ අම්මා ද බෙහෙවින් සතුටට පත් විය.

මේ අතර අමාගේ තාත්තා පැමිණීමට නියමිතව තිබූ දිනයට පෙර එන ඉරිදා දිනයේ අපේ අම්මා සමග අමා ගේ සහ මගේ සම්බන්ධය ගැන කතා කිරීමට මා තීරණය කර තිබුනෙමි. තාත්තා අවදි වීමට පෙර අම්ම සමග කතා කල යුතු යයි සිතූ මා ඉරිදා උදෑසනින්ම අවදි වී මුළුතැන්ගෙය වෙත ගියෙමි. මා එහි යන විට අමාගේ අම්මා ද අපේ අම්මා සමග උයමින් සිටියහ.

"ආ දුව... Good Morning..... මොකද අද උදේම?...."

අමා ගේ අම්මා මා මුළුතැන්ගෙට අතුලුවෙද්දීම පැවසීය.

" Good Morning..... අම්මා... "

"මෙන්න වැඩක්.... අද මොකද මේයා උදේම..."

RAY PUBLISHING

sinhalaebooks.com



අපේ අම්මා ද සිනාසෙමින් පැවසූ අතර මා ඇගේ පිටුපසට ගොස් ඇගේ ගෙල වටා අත දමමින් ඇයට තුරුළු උනෙමි.

"අම්මා.... "

"මොකද මේ හුරතලේ?...."

"මට අම්මාට කියන්න දෙයක් තියනවා...."

"ඉතින් කියන්න...."

"මෙතන කියන්න බෑ.... කාමරේට යන්කො...."

"දැන් මං උයනවනේ ළමයෝ...."

"හරි ඉතින් පොඩි වෙලාවකට එන්නකෝ... තාත්ති නැගිටින්න කලින් කියන්නත් ඕනේ..."

"හා හා යන් කෝ එහෙනම්... උයන්නත් පරක්කු වෙනවනේ.... බලන්නකෝ නංගි තාම හුරතලේ...."

"අපේ එක්කෙනත් ඔහොම තමයි අක්කේ... "

අමා ගේ අම්මා එසේ පවසූ අතර මා සිනහවක් පාමින් මුළුතැන් ගෙයින් පිටුනෙමි. අම්මා ද සුලු මොතකට පසු කාමරයට පැමිණ සයනයේ කොනකින් වාඩිවිය.

"ඉතින් කියන්නකෝ මොකද්ද ඔය කියන්න තියනවා කිව්වේ?...."

"මුලින්ම කියන්න ඕනේ.... මේක ඇහුවට පස්සේ අමාලට නම් මුකුත් කියන්න එපා...."

"ඒ පාර මොකද්ද කියන්න හදන්නේ?...."

RAY PUBLISHING

sinhalaebooks.com



අම්මා කටකොනින් සිනහවක් පාමින් එසේ අසන්නට විය.

"ඔන්න Promise වෙන්න...."

"හරි හරි ළමයෝ.... කියන්නකෝ ඉතින් මට පරක්කු වෙනවා...."

"අම්මා.... මං කෙනෙක්ට ආදරේ කරනවා...."

"හ්ම්... මේ වයසට ඉතින් ඕව සාමාන්‍ය දේවල් නේ... මොකෝ දුව ගෙදරට නාකි වෙන්න ඈ..."

"ඒ උනාට මං දන්නවා කවුරුත් මේකට කැමති වෙන්නේ නෑ.... එත් මගේ හිතේ ඉන්නේ එයා විතරයි.... මගේ සතුට තියෙන්නෙත් එයා ළඟ විතරයි අම්මා.... අනේ මේක කිව්වට පස්සේ මට මොනවා කලත් අමාලට නම් මුකුත් කියන්න එපා... Please.... "

"දැන් මොකද්ද ඔය කියන්න හදන්නේ...."

"මගේ හිතේ ඉන්නේ අමා.... මං දන්නවා මේක කවද්දවත් අපිට ගැලපෙන්නේ නෑ කියල... ඒත් අපි දෙන්නට දෙන්න ගොඩක් ආදරෙයි අම්මා...."

"එහෙනම් ඒක ඇත්ත.... "

අම්මාගේ ඒ වදනින් විශ්මයට පත් වූ මා බිම බලාගෙන මෙසේ පැවසුවෙමි.

"මොනවා... ඒ කියන්නේ අම්මා ඒක කලින් දැනගෙන හිටියද?...."

"ඔව් දුව... මං ඔය දෙන්න ගැන දැනගෙන හිටියේ... මං විතරක් නෙවෙයි තාත්තිත් දන්නවා...."

RAY PUBLISHING

sinhalaebooks.com



අම්මා මේ කියන්නට හදන්නේ කුමක් දැයි සිතාගත නොහැකිව මා බිරාන්ත වී ඇගේ මුහුණ දෙස බලා සිටියෙමි.

"දවසක් මං ඔයාගේ රෙදි වගයක් අරන් ආව අල්මාරියට දාන්න... ඔයා ඒ වෙලාවේ වොශ් රූම් එකේ හිටියේ. මං ඔයාගේ මේසේ උඩ තිබ්බ පොතක පිටුවක ලියල තියනවා දැක්ක අමාට ආදරෙයි කියල. මං ඉතින් තව පොඩ්ඩක් හොයල බැලුව ඔයාගේ මේසේ ලාචුවේ එහෙම... මට එතකොට හම්බ උනා ඔයා අමාට ලියපු ලියුම් වල කටු සටහන්. ඒ වගේම එයා ඔයාට එවපු ලියුම් එහෙම.... මට මුලින් කේන්තිත් ගියා මේ මෝකද්ද වෙන්න යන්නේ කියල.... එත් ඔය දෙන්නගේ ලියුම් කියෙව්වට පස්සේ මට තේරුණා ඔයාගේ සතුට තියෙන්නේ අමා ළඟ විතරයි කියල. අනික මට අමා දුව ගැන ගොඩක් දුක හිතුන.... පස්සේ මං තාත්ති එක්කත් කතා කළා... එයත් කිව්වා ඔයාගේ සතුට තියෙන්නේ එතන නම් අපි ඒ සතුට විනාශ කරලා ඔයාගේ ජීවිතෙත් විනාශ කරන එක හොඳ නෑ. අනික තාත්තා කිව්වා දැන්ම ඔයාට මේක අපි දන්නවා කියල නොකිය ඉම්මු කියල. ඔයාම මේක අපිට කියන්න එයිනේ... එදාට අපි කියමු කියල. ආ.... තවදෙයක් තියනවා.... අමාගේ අම්මත් දන්නවා අපි මේ ගැන දන්නවා කියල...."

"ඒ කොහොමද?...."

"අමා ගේ අම්මා.... එයාල මෙහෙ ආපු දවසට පහුවදා රැම මාත් එක්ක ඒ කාරණාව ගැන කතාකලා..."

"මට නොකිය හංගගෙනම හිටියනේ කට්ටියම...."

මා කිසිවක් සිතාගත නොහැකිව එකවරම අම්මාව වැළඳ ගත් අතර මගේ දෙනෙත් සතුටු කඳුලින් බර උනෙමි.

"මේ ලෝකේ ඉන්න හොඳම අම්මයි තාත්තියි ඉන්නේ මට... මං ගොඩක් ආදරෙයි අම්මා ඔයාල දෙන්නට...."

RAY PUBLISHING

sinhalaebooks.com



"දැන් ඇති නේද ළමයෝ... අමා ගේ අම්මත් බලන් ඇති. මම එහෙනම් යනවා කුස්සියට..."

අම්මා එසේ කී පසු මා ඇගේ තුරුලෙන් මිදී ඇයගේ කම්මලුට හාදුවක් දුන්නෙමි. ඇය ද මගේ කම්මුලට හාදුවක් දී කාමරයෙන් පිට වී ගියහ. මේ මොහොතේ මගේ සිතට ඇති වූ සතුටට මා අමාගේ කාමරයට දුව ගොස් එකවරම අයව බදාගෙන සයනයට පෙරළුනෙමි.

"අංජලී.... මේ මොකෝ මේ.... අම්මලත් ඉන්නවානේ...."

"දැන් අපිට එයාලගෙන් බාදාවක් නෑ රත්තරං...."

"ඒ කිව්වේ....?"

"මම මේ දැන් අපේ අම්මත් එක්ක අපි ගැන කතාකලා.... එයාල අපි දෙන්නට අකමැත්තක් නෑ කිව්වා...."

"මොනවා...."

විශ්මයට පත් අමා තවත් තදින් මා වැළඳගෙන ඇගේ සිතේ උතුරා ගිය සතුට පිටකරන්නට විය. මොහොතකට පසු අපි දෙදෙනාම සන්සුන් වූ අතර අමා සරාගී බැල්මකින් මා දෙස බලා හිඳ ඇගේ දෙතොල් මගේ දෙතොල් මතට ළං වී සිප ගන්නට සැරසෙද්දීම අපේ අම්මා අපි දෙදෙනාට කතා කරන ශබ්දයක් ඇසෙන්නට උනෙමු. එසැනින් වැඳගෙන සිටි තුරුලෙන් මිදී එකිනෙකා ගේ මුහුණු දෙස බලා හිඳිමින් ලජ්ජාශීලී සිනහවක් පා මුළුතැන් ගෙය වෙත් දිව ගියෙමු.

අමා ගේ සහ මගේ ආදරයට තිබූ සියලු බාධාවන් මේ වන විට ඉවත් වී ඇත. මගේ අම්මා කෙසේ හෝ මාව තේරුම් ගත්තත් තාත්ත අපි දෙදෙනාට කැමති වේ යැයි මා කිසි දිනක

RAY PUBLISHING

sinhalaebooks.com



නොසිතූ කරුණකි. අමාගේ තාත්තා පැමිණීමත් සමග ඇගේ පවුලේ සියලු ආරවුල් ද නිමවී ඔවුන් නැවත එකතු වූ නිසාවෙන් අපගේ සතුට තවත් වැඩි උනෙමු. සියල්ලන්ගේම එකඟතාවය මත ඔවුන් නුවරින්ම නිවසක් ගෙන පදිංචියට ගියහ. තව ද අපේ අම්මගේ සහය ඇතිව අපි දෙදෙනාටම එකම ආයතනයක රැකියාවක් සොයාගැනීමට ද හැකි විය. මෙසේ ජීවිතය ඉතා සුන්දරව ගතවී වසරකින් පසු නීත්‍යාණුකූල නොවුනත් දෙපාර්ශවයේම දෙමවුපියන්ගේ ආශීර්වාදය ඇතිව සත්‍ය ආදරයේ ජයග්‍රහණය සනිටුහන් කරමින් අපි දෙදෙනා අතිනත ගත්තෙමු. එතනින් ආරම්භ වූ අපේ යුගදිවිය අපි දෙදෙනාගේම දෙමවුපියන්ගේ උදවු උපකාර ඇතිව ඉතා සාර්ථක ලෙස ඉදිරියට ගෙනගියෙමු.

RAY PUBLISHING

sinhalaebooks.com



# පස් වසරකට පසු.....

RAY PUBLISHING

sinhalaebooks.com



සවස කාර්යාලය නිම වූ පසු මා කල් තියාම ලෑස්ති කරගත් පුංචි ත්‍යාගයක් සහ මල් පොකුරකුත් රැගෙන නිවස වෙත ගියෙමි. අද අමා නිවාඩු දමා ගෙදර නැවතීම නිසා මගේ එම කටයුතු වලට තවත් පහසුවක් විය. මා නිවසට යන විට නිවසේ සියලු දොර ජනෙල් වසා තිබෙනු දුටුවෙමි. අඳුර වැටී තිබුනත් නිවසේ කිසිඳු බල්බයක් වත් නොදැල්වුනු නිසා අමා ගෙදර නැති දැයි සිතමින් මා ප්‍රධාන දොරටුව වෙත ගොස් එහි අගුල කරකැව්වෙමි. අගුලු දමා නොතිබූ හෙයින් කිසිඳු ආයාසයකින් තොරව දොර විවර විය. අමාව අමතමින් අඳුරේම නිවසට ඇතලු වූ මා උදේ සිටම ඇය අසනීපයෙන් සිටි නිසා නින්ද ගොස් ඇති දෝ යැයි සිතමින් අපේ කාමරය වෙත ගියෙමි. අද අපේ කාමරයේ ද දොර වසා තිබීම පුදුමයට කරුණකි. දොර විවෘත්ත කරනවාත් සමගම කාමරය පුරාම දල්වා තිබූ ඉටි පහන් ආලෝකයෙන් මා තවත් විමතියට පත් උනෙමි. විවිධ වර්ණයන් ගෙන් යුත් මල් වලින් සරසා තිබූ අපේ කාමරයේ සයනයේ රෝස පෙති අතුරා තිබෙනු මා දුටුවෙමි. සැබවින්ම අද අපේ කාමරය ඉතා සුන්දර වූ රෝමන්තික ස්වරූපයක් ගැබ් වී තිබුන නමුත් එහි අමා පෙනෙන්නට නොසිටියහ. එකවරම යාන්තමට සවනට වැටුනු අඩි ශබ්දයක් නිසාවෙන් මා ආපස්සට හැරී බලන විට ඉතා මනරම් සහ සරාගී ඇඳුමකින් සැරසී මා ඉදිරියේ අමා සිටගෙන සිටිනු දුටුවෙමි. එසැනින් මා ඇයව තදින් වැළඳගෙන

sinhalaebooks.com



දෙතොල් සිප ගනිමින් සිතට දැනුනු වචනයෙන් විස්තර කල නොහැකි ඒ ආදරණීය හැඟීම එලෙස මුදා හැරියෙමි. මද වේලාවකට පසු සිප ගැනීම නතර කල මා අතේ තිබූ මල් පොකුර සහ කුඩා ත්‍යාගය ඇ වෙත දිගුකලෙමි. පසුව නැවතත් ඇය මාව වැළඳගන්නට වූ  අතර මා ඇයට මෙසේ පවසුවෙමි.

"I love you so much my darling...."

"I love you too darling and happy birth day....."

පසුව ඇය ද අපේ අල්මාරියෙන් ගත් කුඩා ත්‍යාගයක් මා අතෙහි තබන්නට විය.

"කපටි කෙල්ල...... බොරු කියල අද ගෙදර හටියේ මේකට නේද?....."

මා එසේ පවසමින් ඇය දුන් ත්‍යාගය අතට ගත් අතර පසුව අපි දෙදෙනාම සයනයට ගියෙමු. අවුරුදු පහක් සපිරුණු ආදර කතාවේ සංවත්සරය සමරමින් අපේ රෝමාන්තික රාත්‍රිය මෙසේ ආරම්භ කලෙමු.

නිමි.

RAY PUBLISHING

sinhalaebooks.com



# පසු වදන

ලොවට කියාගත නොහැකිව සමාජයෙන් සැඟවුනු මෙවන් අහිංසක ආදර කතා බොහොමයක් අප අවට සමාජය තුල ඇත. එවන් බොහොමයක් තම පවුල් වල සහ සමාජයේම බලපෑම් මත සිත් තුලම පරවී යාම ශෝකයට කරුණකි. ලෝකයේ අනෙකුත් රටවල මෙන් අපේ රට තුලද ආදරයට ලිංග භේදයන් බාධාවක් නොවන දිනයක් එන තාක් මෙවන් සුන්දර ආදර කතා හැමදාටම සමාජයෙන් සැඟවී යනු ඇත. නමුත් ඔවුන් ද අප වැනි මානුෂීය හැඟීම් ඇති සුන්දර වූ මනුෂ්‍ය කොට්ඨාසයක් ලෙස සලකමින් ඔවුන්ටත් අපි අතර සමාජයේ ඉඩක් ලබා දෙන ලෙස පාඨක ඔබෙන් මා ඉල්ලා සිටිමි.

RAY PUBLISHING

sinhalaebooks.com



කුසුමකට පෙමින් බැඳුනත්
සමනලුන් කෙතරම්........
කුසුමකට පෙම්බැඳි
නතවත් කුසුමකි මං........

අසම්මත පෙම් කවක්
වූ මුත් ලොවට කෙතරම්........
කෙසේ ඉන්නද ඔබේ උණුසුම
නොලැබ මං........
රෝස පෙති මත
රෝස පෙති තබමින්........
සිපගන්න ආසයි
සියුමැලි වත පුරා
එතෙමින්........
ඔබෙ ලැම මත
මගෙ ලැම තබමින්........
විඳිමු උණුසුම අපි
ආදරේ නාමයෙන්........
ලොවෙන් ගැරහුම්
කොතෙක් ආ මුත්
නොයිමු හැරදා
ඔබව මං........
මියෙන තුරු
රකගනිමි මම
නුඹෙ පුංචි
සුරතලි මං........

*Anjali*
2000/05/28

RAY PUBLISHING

sinhalaebooks.com

2000/12/07

දුව අමා,

පළමුව මා නිසා ඔයා සහ අම්මා පත් වූ දැඩි අසරණ භාවයට සමාව අයදිමි. දැන් ඒ වැරදි නිවැරදි කරගැනීමට කාලය එළඹ තිබේ. අම්මා මට සිදු වූ සියල්ල පැවසූ අතර ඔයාගේ අනාගතය සහ සතුට වෙනුවෙන් ඔයා අංජලි දුව ව තෝරා ගැනීම ගැන මං හදවතින්ම සුභ පතමි.ඒ වගේම මිනිස්සු මොන විදිහට ඔයාල දිහා බැලුවත් ඔයාලගේ සතුට වෙනුවෙන් ඔයාලා නොසැලී ඉදිරියට යා යුතුයි. ඒයට මගේ ද ආශිර්වාදය ද ඔබ දෙපලට ලැබෙනු ඇත. තවත් විශේෂ දෙයක් කීමට ඇත. අපේ ගමේ නිවස විකුණා ඒම මුදල් වලට මා විසින් ඉතිරි කර ගත් සුළු මුදල් ප්‍රමාණයක් ද එකතු කර ඔයා සහ අම්මව කොළඹ පදිංචියට ගෙන ඒමට අම්මා සමග මා කතිකා කරගෙන තිබුණත් වර්තමාන තත්වය හේතුවෙන් ඒ අදහස වෙනස් කිරීමට සිදු උනෙමි. නමුත් මේ වන විට අපේ ගමේ නිවස විකුණා අවසන් නිසා ඒම මුදල් සහ මා ඉතිරි කර ගත් මුදල් දුවගේ බැංකු ගිණුමේ තැම්පත් කර ඇත. තවද මේ මොහොතේ ඔයාලට නවාතැන් පහසුකම් දී ඇති අංජලී දුව ඇතුළු ඒ පවුලේ අයට මා බෙහෙවින් ස්තූති කරන බව පවසන්න. මා සිදු වූ සැම දෙයක් ම නිවැරදි කිරීම සඳහා ඔයාලා දැන් සිටින අංජලී දුවගේ නිවසට පැමිණීමට තීරණය කර තිබුණත් වැඩපලේ හදිස්සි කටයුත්තක් යෙදුනු නිසා ඒය ලබන බ්‍රහස්පතින්දා දිනයට කල් දැමීමට සිදුවිය. ඒම නිසා මා සමග වැඩ කරන මිතුරෙකු අත මෙම ලිපිය එවීමට තීරණය කලෙමි. තවත් පැවසීමට බොහෝ දේ තිබුණත් ඒ සියල්ල ලිපියේ සඳහන් කල නොහැකි බැවින් මා පැමිණ ඒ සියල්ල පැවසීමට සිතාගත්තෙමි. ඒතෙක් මා මෙතනින් නවතිමි. මම දුවට ගොඩක් ආදරෙයි. අංජලී දුවටත් ඒලෙසම ආදරය කරන බව කියන්න.

මීට ඔයාගේ

ආදරණීය,

තාත්තා

sinhalaebooks.com

RAY PUBLISHING